# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2020.09.15

වර්ෂ 2020 ක් වූ සැප්තැම්බර් මස 15 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ සැප්තැම්බර් මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
20. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
21. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි.**

01. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

(ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**01) 2020-08-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** 2020-08-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2020-08-18 දින පැවති

මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** 2020-08-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

2020-08-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආදාහනාගාරය ඉදිකිරීම සඳහා භූමිය ලබා ගැනීමේ කටයුතු අවසන් අදියරේ තියෙන්නේ. ඒකට අවශ්‍ය වුණා ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශය. ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිර්දේශය. පළාත් පාලන ආමාත්‍යාංශයේ නිර්දේශය. ඒ නිර්දේශ තුනම දැන් ලැබිලා තියෙනවා. පර්චස් 80 ඉඩම ලබා ගන්න වැවිලි අමාත්‍යාංශය වෙත දැන් යොමු කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ප්‍රගතියේදී නේද මේක කියන්න ඕන.

(ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විශේෂ නිවේදන යටතේ දැනුම් දුන්නේ.

ඊළඟට දෙවැනි කාරණය සඳහන් කරන්න ඕන. පොළ භූමිය පිළිබඳව ගැටලුවක් ඇවිල්ලා තියෙනවා. ඒකෙ තෙමහල් වෙළඳ සංකීර්ණයක් ඉදිකරන්න අවශ්‍ය සියලු දේ සඳහා සැලසුම් සකස් කරලා තියෙන්නේ. එතනදී පොළ භූමිය වෙනත් ස්ථානයකට ස්ථානගත කිරීම තමයි අවශ්‍ය වෙලා තියෙන්නේ ඒකටත් දැන් සාකච්ඡා කරලා තියෙන්නේ. හානගල උපතිස්ස හාමුදුරුවොත් එක්ක කතා කරා මහා බෝධි සමාගමට අයිති ලැන්දැවේ තියෙන ඉඩම බදු පදනම මත හෝ අපිට කාලයකට ලබා ගන්න. ඒකට උන් වහන්සේගේ එකඟතාවයකුත් තියෙනවා. ඒ පිළිබඳව අපි ලිපියක් සකස් කරලා තියෙන්නේ. උන්වහන්සේ තමයි මහා බෝධි සංගමයේ භාරකාර හාමුදුරුවෝ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒකට සභාපතිතුමා ගරු ඇමතිතුමත් ඉල්ලීමක් කරා අවශ්‍ය ලිපි ලේඛන ටික ලබා දෙන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හදලා තියෙන්නේ ඒක දෙන්න පුලුවන්.

(ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ-**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** දෙල්ගහ වත්ත මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම - දෙවන වගන්තිය යටතේ මැනුම් කිරීම. (ප්‍රාදේශීය ලේකම්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය)

ඒ යටතේ අපි කලින් සභාවක සාකච්ඡා කරලා තිබුණා. දැන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දැනුම් දීලා තියෙනවා ඒ කටයුත්ත 28 වෙනිදා සිදු කිරීමට නියමිතයි. ඊදිනට කලින් සභාවේ එකඟතාවය විමසනවා. ඒ ගැන තීරණයක් ගත යුතුයි. ඒකෙදි අදාළ ඉඩම අයිතිකරුගෙන් විරෝධතා ලිපියක් ලැබිලා තියෙනවා. මේකට සභාවේ අදහස මොකක්ද, මේ කාරණය පිළිබඳ එකඟතාවය අපි දන්වා යවන්න ඕන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව ඉතාමත්ම නුසුදුසු විදියට ඉඩම් අත්පත් කර ගැනීම සිදු වෙලා තියෙනවා පසුගිය කාලය තුළදී. ඒකට හේතුව තියෙන්නේ මා එක වතාවකුත් සභාවේ ප්‍රකාශ කළ පරිදි මාර්ගයක් පුළුල් කරනවාට අපි විරුද්ධ නැහැ. ඒක අනිවාර්යයෙන්ම සිදු විය යුතු දෙයක්. හැබැයි දෙපැත්තකින්ම ඉඩම් අත්පත් කර ගෙන මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා පුළුල් විය යුතුයි. මාර්ගයක් එක ගෙදරකට විතරක් එක ගෙදරකින් අඩි 04 ක් අරගෙන පුළුල් කරන එකට තමයි

මම විරුද්ධ වෙන්නේ. ඒක වෙලා තියෙන්නෙත් එහෙමයි. එතකොට එක ගෙදරකින් පමණක් අඩි 04 ක් අත්පත් කර ගන්නවා එක ගෙදරක් වෙනුවෙන්. ඒකයි අවශ්‍යතාවය. ඒ කියන පුද්ගලයා වතුර වලක් සම්බන්ධව පැමිණිලි කරලා තියෙනවා මේක බස්සව ගන්න බැහැ කියලා. ඒකට අපි සභාවේ කම්කරුවෝ යොදවලා, අපේ මුදල් යොදවලා ඒ වතුර එකතු වීම දැන් නවත්තලා තියෙනවා. ඒක නිවැරදි කරලා තියෙනවා. ඒ නිසා මේකට කිසිසේත්ම සභාවක් විදියට ඔබ සියලු දෙනාම එකඟ වෙන්න බැහැ. හේතුව ඒ ගොඩකන්ද කියන පුද්ගලයාට පර්චස් 9.2 යි ඉඩම තියෙන්නේ. ඒ පර්චස් 9.2 ඉඩමෙන් බද්දේගම පාර පුළුල් කිරීම සඳහා ඉදිරි කොටස වෙන් වෙනවා. එතකොට ඒ පුද්ගලයාට ඉතිරි වෙන්නේ ගේ පමණයි. ඒ ගෙදරිනුත් එක පුද්ගලයෙක් වෙනුවෙන් පාර පළල් කරන්න දෙනවා නම් ඒක කිසිසේත්ම සාදාචාරාත්මක නැහැ කියන එකයි මගේ මතය. ඒ නිසා මේක කිසිසේත්ම කරන්න මම නම් ඉඩ දෙන්නේ නැහැ. ගරු සභාවේ මන්ත්‍රීවරු මේක ගැන සාකච්ඡා කරන්න. එක පාරකුත් සාකච්ඡා කරා. මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් මනින්න ආවාට අපි මනින්න ඉඩ දුන්නේ නැහැ. ඒකට විරෝධය පළ කරා. නැවත වාරයක් එහෙම වුණොත් අපේ විරෝධතාවය අනිවාර්යයෙන්ම පළ කරනවා. ඒ පුද්ගලයත් ලිපියක් එවලා තියෙනවා ඒකට විරෝධය පළ කරලා. සාධාරණ උත්තරයක් සභාව තුළින් මම බලාපොරොත්තු වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපේ චමින්ද මන්ත්‍රීතුමා කරුණු කිහිපයක් ඉදිරිපත් කරා. ඇත්තටම මේ වැරැද්ද සිද්ධ වෙලා තියෙන්නේ අද ඊයේ නෙමෙයි. මේකේ මුලින්ම කළ යුතුව තිබුණේ වතුර බැහැලා යාමේ ක්‍රමවේදයක් හදන එක. ඒක කරේ නැහැ මේ සභාව. එදා දවසේ ඒ සභාවේ හිටපු අය කරපු වැරැද්දක් තමයි අද තියෙන්නේ. මේ නිසා ඇත්තටම අපි නම් ගම් පාවිච්චි කරාට කිසි වැරැද්දක් නැහැ. දොස්තර ගුණරත්න මැතිතුමාට ලොකු අසාධාරණයක් මෙතනදී වුණා. එතුමාගේ සම්පූර්ණ ඉඩමම යට වෙලා යන විදියට ආවේ. ඉතිං එකක් තියෙනවා අද වෙන කොට මේ අත්පත් කර ගැනීම නිසා කොහේ හරි ඉන්න කාටවත් අසාධාරණයක් නොවෙන්න මේ සඳහා දැන් කොනටම යනකම් කාණුවක් යැවිය යුතුයි. මේ ප්‍රශ්නයේදී චමින්ද මන්ත්‍රීතුමා කවුරු විරුද්ධ වුණත් මේකේ බොහොම පැහැදිළි තැනක තියෙනවානේ. මේකෙන් කාටවත් පීඩාවල් වෙන්න බැහැනේ. මේකේ ඉස්සෙල්ලා පීඩාවල් ඇති වුණේ නැහැනේ. දැන් මේක අත්පත් කර ගෙන තියෙන්නේ මෙතනින් විතරක් නෙමෙයි. දැන් මදනායක මාවත පටන්ගන්න තැන ගත්තම ඒ මිනිස්සුන්ගේ නාන ළිඳට පවා ප්‍රශ්න තියෙනවා. කුණු වතුර යන්නේ. මේ නිසා මේකෙන් මඟ ඇරලා චමින්ද මන්ත්‍රීතුමා මොකක්ද ගන්න ඕන තීන්දුව. ඒක ගන්න ඕන. මොකද හේතුව දැන් ඇත්තටම ඔබතුමන්ලා ගිහිල්ලා එතන උස් කරාම වුණේ දැන් තවත් තැනක් වතුර වලක් වුණා. ඔබතුමා බලන්න. අපි මෙහෙම තනි තනියෙන් ගිහිල්ලා දානවට වැඩිය තාක්ෂණ නිලධාරීන්ගේ උපදෙස් අරගෙන ඒක කරලා කාටහරි හානියක් නොවන දෙයක් කරන්න.

ඊළඟට ඇත්තටම මේක කරන්න ඕන. මේක දිගට ගිහිපු ප්‍රශ්නයක්. අත්පත් කර ගැනීම පිළිබඳව. මේක මම නම් දකින්නේ ඉතිං ඇත්තටම හානියක් නොවන විදියට අත්පත් කර ගෙන මේ ක්‍රියාවට යන්න ඕන කියන එක තමයි මගේ මතය.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමාගේ අදහසට මම එකඟයි. මම කියන්නේ කිසි කෙනෙකුට අවහිරයක් නොවන විදියට මේ කාණු පද්ධතිය සකස් කරන්න ඕන. එක ඉඩමකින් අඩි 04 ක පටියක් ගන්නවා කියන්නේ ඒ මනුස්සයාට පර්චස් 09 ක ඉඩමකින් තව අඩි 04 ක පටියක් අයින් වෙනවා කියන එක. කාණුව සෑදීම පිළිබඳව මගේ විරෝධතාවයක් නැහැ. පාරේ මැදින් හෝ කාණුවක් කපලා සිලින්ඩර් දාලා හෝ ඒක කරන්න ඕන. ඒක කරන්න පුලුවන් ක්‍රම තියෙනවා. හැබැයි ඔබතුමා කියන විදියට දොස්තර මහත්තයාට ප්‍රශ්නයක් වෙනවා නම් අනිත් පැත්තෙන් ගොඩකන්ද කියන මහත්තයාටත් ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙනවා පර්චස් 09 ක ඉඩමකින් අඩි 04 ක පටියක් දෙනවා කියන එක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නමුත් මේ වැරැද්ද කොතනින්ද සිද්ධ වුණේ කියන එක බලන්න ඕන.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** වැරැද්ද සිද්ධ වෙලා ඉවරනම් දැන් නිවැරදි කරන්න පුලුවන්නේ අපිට එකතු වෙලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් නිවැරදි කරන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒක තමයි මම කියන්නේ. කිසි ගැටලුවක් නැහැ. ඉඩම් අත්පත් කර ගන්නේ නැතුව කාණුව හදන්න ඕන විදියකට. ඒක කිසි ගැටලුවක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කොහොමද එහෙම හදන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** දැන් ඔබතුමා කියන විදියට ලොකු වතුර වල වැහුවා. ඒකේ ඉස්සරහට අයේ එනවා නම් ඒ ටිකත් කොන්ක්‍රීට් දාලා හදන්න පුලුවන්. ඒ වල හැදුවේ කවුද, වල හැදුවේ කවුද කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කවුද හැදුවේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** දොස්තර මහත්තයා. ඔබතුමාට ඕනනම් මම මෙතනට ගෙන්වන්නම් කොන්ත්‍රාත්කරුවා. කොන්ත්‍රාත්කරු කියනවා එතන පාර උස්සන්න දුන්නේ නැහැ කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඒ කාලේ ඉන්න කොට දාපු පාරක් ඕක.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඔබතුමා දාපු පාරක් වෙන්න පුලුවන්. කොන්ත්‍රාත්කරුව මෙතනට ගෙන්වන්න පුලුවන්. එතුමා කියනවා දොස්තර මහත්තයා මට දොස් කියලා තාක්ෂණ නිලධාරීව ගෙන්වලා එයාගේ මිදුලට වතුර යනවා කියලා තමයි පහත් කරේ කියලා. ඒ සම්බන්ධව පැහැදිළි සාක්ෂි තියෙනවා. මෙතනට ගෙන්වලා කතා කරන්න පුලුවන්කම තියෙනවා. එහෙම තියාගෙන තමයි මම කතා කරන්නේ. එක පුද්ගලයෙකුගේ අවශ්‍යතාවය වෙනුවෙන් තව පුද්ගලයෙකුට අසාධාරණයක් වෙන්න බැහැ. ගරු සභාපතිතුමා කරුණාකරලා මේකට දැන් පැහැදිළි තීන්දුවක් ගන්න. දොස්තර මහත්තයා එයාගේ ඉඩමට වතුර එන නිසා පාර පහත් කරන්න කියන ඉල්ලීම කරා කියලා කොන්ත්‍රාත්කරු දැනටමත් ප්‍රකාශ කරනවා. එතුමා සභාවට එන්න වුණත් කැමතියි ඒ ප්‍රකාශය කරන්න. එතකොට දොස්තර මහත්තයා විසින් වළක් හදාගෙන ඉවර වෙලා ඒකට කාණුවක් හදන්න කියනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇයි ගෙවීම් කරේ එහෙමනම්.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒක පහුගිය සභාවක වැරැද්දක් කියලා ඔබතුමා කියනවානේ. ඒ සභාවල ඔබතුමත් හිටියා. ඉතිං ඒ වරද දැන් නිවැරදි කරන්න ඕන. ඒ වරද ඔබතුමන්ලා නිවැරදි කරන්න ඕන දැන්. ඒ නිසා ඔබතුමාගෙන් බොහොම ගෞරවයෙන් කරුණාවෙන් ඉල්ලනවා ගරු සභාපතිතුමනි පාර හදන්න, කාණු හදන්න. හැබැයි එක පුද්ගලයෙකුට අසාධාරණයක් වෙන්න ඉඩ තියන්න එපා. කාටත් පොදුවේ හදන්න. දොස්තර මහත්තයා තාප්පය බැඳලා තියෙන්නේ කොහොමද කියලා බලන්න ගිහිල්ලා. තාප්පය බැඳලා තියෙන්නේ කොන්ක්‍රීට් පාරේ ගැට්ට උඩ. ඔබතුමා නිරීක්ෂණය කරන්න ගිහිල්ලා. ඒවා වැරදි දේවල්. ඒ නිසා කරුණාකරලා බුද්ධිමත් මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලන්නේ එක පුද්ගලයෙකුට පක්ෂපාති වෙන්න එපා. නිවැරදි තීන්දුවක් අර ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම හරි එක දවසක් ගියා. යන්න බැහැ සම්පූර්ණයෙන්ම වතුර පිරිලා අඩි දෙකක් විතර උසට. හැබැයි මෙහෙම දෙයක් තියෙනවා අබේසේකර මන්ත්‍රීතුමා. ඒ දොස්තර මහත්තයාගේ පැත්තෙන් වැටියක් දා ගෙන තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ වැටිය දාගෙන තියෙන්නේ පාරේ තියෙන වතුර එන හින්දා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් එතන කාණුවක් කපන්න ඉඩ නැතුව තියෙන්නේ. ඒ දොස්තරගේ පැත්තෙන් කොන්ක්‍රීට් ගැට්ටටම තාප්පය ගහලා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** දොස්තර මහත්තයා තාප්පය බැඳලා තියෙන්නේ තනිකරම පාරේ. ඒක ඕන කෙනෙකුට පේනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පාර අඩි 08 ට කොන්ක්‍රීට් කරලා තියෙන්නේ. අඩි 12 ක් ප්ලෑන් එකේ තියෙනවා. එහෙමනම් දෙපැත්තෙන්ම අඩි දෙක ගානේ තියෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මේ නිවාස හදලා තියෙන්නේ නිවැරදි විදියටද.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒක හරි. අපි ඒක නැහැ කියන්නේ නැහැ. ඒක නැහැ කියන්නේ නැහැ මන්ත්‍රීතුමා. ඒ සියල්ල වැරදි වෙන්න පුලුවන්. හැබැයි මේකත් වැරදියට කරන්න බැහැ. ඒක නිවැරදි විය යුතුයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඇත්තටම මේ කොන්ත්‍රාත් එක කරපු අයට ඇයි අපි ගෙවීම් කරේ. තාක්ෂණ නිලධාරීන් ඇයි මේවා අනුමත කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙන් කරපු එකක් නෙමෙයි. ප්‍රාදේශීය ලේකම් එකෙන් කරේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔය කාරණාවට මමත් කලින් මැදිහත් වෙලා කතා කරලා තියෙනවා මේ සභාවේ දී ඔය ප්‍රශ්නය ආවම. ප්‍රශ්නය තියෙන්නේ මේකයි. දැන් අපිට ගිය නුවන අලි ඇතුන් ලවාවත් අද්දවන්න බැහැනේ. පහුගිය දේ මෙතන ආපහු ඇදගන්න එක නෙමෙයි ප්‍රශ්නය තියෙන්නේ. අපිට මේකට හොයන්න පුලුවන් උත්තරය මොකක්ද කවුරුවත් අපහසුතාවයට පත් නොවී.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඒක තමයි මමත් කියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ සාධාරණ උත්තරය අපි නීත්‍යානුකූලව කරන්න පුලුවන් නම් ඒකට මැදිහත් වෙන්න සූදානම් පළවෙනි මොහොතේම. ඒක තමයි සුදුසුම දේ මෙතනදී. පාරේ වතුර බහින්න තැනක් නැතුව වලක් හැදිලා වතුර රැඳිලා තිබුණා.

(ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් චමින්ද මන්ත්‍රීතුමා ඒකේ තත්ත්වය මොකද.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඒ වතුර වල ඉවරයි. එතන තව පොඩි ප්‍රමාණයක වතුර වලක් තියෙනවා. ඒකත් මම නිවැරදි කරන්නම්. කිසි ගැටලුවක් නැහැ. කාණුවක අවශ්‍යතාවය නෙමෙයි මෙතනදී තියෙන්නේ. දොස්තරගේ වාහන හරවන්න බැහැ කියන එක තමයි මේ ඉස්සරහට දාන්නේ. කාණුව ඉස්සරහට දාගෙන වාහන හරවන්න බැරි නිසා තමයි ප්‍රශ්නය තියෙන්නේ. කවුරු මොනවා කිවුවත් ඒක තමයි ඇත්ත.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමා මෙහෙමයි. පුද්ගලයෙකුට දෝෂාරෝපණය කරලා, ලඝු කරලා මේක විසඳන්න පුලුවන් එකක් නෙමෙයි. මේ ප්‍රශ්නය යට ගහන්න හදන්න එපා එක එක්කෙනාගේ පිටේ පටවලා. මම කියන්නේ මේක දැන් වතුර බහින්නේ නැතුව තිබුණා එතන වලක් හැදිලා. ඒ පාරේ කෙලවරට වෙනකම් වතුර බස්සවන්න ඕන. ආයේ මෙහේ කොහේටවත් වතුර බස්සවන්න බැහැ. කොහාටවත් වතුර ආයේ මිනිස්සුන්ගේ ඉඩම් වලට බස්සවන්න බැහැ. දොස්තර මහත්තයා වැටියක් දා ගනිපු එක සාධාරණයි ඉඩමට වතුර එනවානම්. සාමාන්‍ය නීතියට අනුව පාරේ යන කාණුවට වැහි වතුර බස්සවන්න පුලුවන්. දැන් ඒක එහෙම තියෙද්දි කවුරුහරි මනුස්සයෙක් කරන්නේ පාරේ වතුර ටික බස්සවන්න කාණුවක් නැතුව ඒක වත්තට එනවා නම්, තමන්ගේ ඉඩමට එනවා නම් ඒකට විකල්ප ක්‍රියාමාර්ගයක් ගන්න එක අසාධාරණ නැහැ. ඒක නෙමෙයි ප්‍රශ්නය තියෙන්නේ මෙතනදී. ප්‍රශ්නය තියෙන්නේ මේ පාර ආපහු හදන කොට මොන යම් ක්‍රමයකින් හෝ පාර දිගේ එකතුවෙන ජලය අනිත් පැත්තට බහින ක්‍රමයක් හදන්න ඕන.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඔබතුමා දන්නේ නැති ක්‍රමයක් තියෙනවා. ඔබතුමාට මම කියන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම ඒක ගැන තාක්ෂණ නිලධාරි එක්කත් කතා කරා. පාරේ පළල අඩි 08 යි. මේක ආයේ පළල් කරන්න ගියාම මොකක් හරි සාධාරණ ක්‍රමවේදයක් තියෙනවා නම් පළල් කර ගන්න පුලුවන්. පාර අයිනෙන් කාණුවක් දාන්න ගියාම වෙන්නේ ඒ කාණුවටත් තව අඩියක් විතර ඉඩ යනවා. ඒක තමයි එතනදී වෙන්නේ. ඒ නිසා මම යෝජනා කරා පාරේ මැදින් ටනල් දාලා යවන්න. එහෙම යවන්න පුලුවන්නම් ඒ පාරේ මැදට බරක් එනවා නම් එන්නේ ත්‍රීවිල් එකක මැද රෝදයේ බරක් විතරයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මැදින් කාණුව දාලා කොන්ක්‍රීට් ලෑලි දාන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ලොකු වාහනයක බරයි, ත්‍රීවිල් එකක බරයි දෙකක් මම කියන්නේ. මම සාධාරණ යෝජනාවක් කරේ තාක්ෂණ නිලධාරීට. මැදින් ටනල් දාලා වතුර බස්සවනවානම් හරි. පාරේ මැදට බරක් එන්නේ ත්‍රීවිල් එකක මැද රෝදයෙන් විතරයි. මැදින් රෝද තියෙන්නේ ත්‍රීවිල් වලට විතරයිනේ. දෙපැත්තෙන් කාණුව දාලා කොන්ක්‍රීට් කරාම ලොකු වාහනයක් දාපු ගමන් දෙපැත්තට බර එනවා. ඒ නිසා කරන්න පුලුවන් සාධාරණම දේ තමයි කාටවත් අසාධාරණයක් නොවෙන්න පාරේ උපරිම ප්‍රමාණය පළල අරගෙන මැදින් ටනල් එකක් දාලා වතුර බස්සවන්න. ඒක මහ ගොඩක් දුර නැහැ. මීටර් කීපයක් තියෙන්නේ. වතුර එකතු වෙන තැන ඉඳන් එහාට දැම්මම ඇති. මේ කෙලවරේ ඉඳලා දාන්න ඕන නැහැ. ඒ නිසා මම කියන්නේ මේක නිවැරදිව කල්පනා කරලා, තාක්ෂණය අරගෙන කාටවත් අසාධාරණයක් නොවෙන්න කරන්න. කිසිදු පුද්ගලයෙකුට අසාධාරණයක් වෙන්න ඕන නැහැ මේකෙදී. පුද්ගලික කාරණාවක් හැටියට සලකන්න එපා මේක. ප්‍රශ්නයක් පැන නැගිලා ඉවරයි දැන්. මේ ප්‍රශ්නය විසඳන්න පුලුවන් ක්‍රියාමාර්ග මොනවද කියලා බලන්න.

ගරු සභාපතිතුමනි, මේ සභාවේ අපි කතා කරන්න ඕන ඔබතුමාටනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං පොඩ්ඩක් ඉඩ දෙන්න. මේක ප්‍රධාන කාරණාවක්. මගේ පුද්ගලික දෙයක් කතා කරේ නැහැ. සිල්වාගෙවත්ත පාර කාපට් කර ගෙන යනවා. එතන ප්‍රශ්නයක් විසඳන්න තියෙනවා. මට එතනට යන්නත් බැරිනම් දුරකථනයෙන් විසඳනවා ඇරෙන්න මම මොකක්ද කරන්නේ. එක්කෝ සභාව කල් තියලා මම යන්න ඕන ඒ ප්‍රශ්නය විසඳලා එන්න. මේක තේරුම් ගන්න. දෙක, තුනම කරන්න ඕනනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා ඉතිං අපිව දැනුවත් කරේ නැහැනේ. ඔබතුමා කතා කර කර හිටියා. මම කතා කරද්දිත් ඔබතුමා කතා කරා. ඔය ප්‍රශ්නයත්, ප්‍රශ්නයක් තමයි. මමත් දන්නවා ඔය කාරණාව සම්බන්ධයෙන්. ඇත්තටම ඒක මේ වෙලාවේදී නිවැරදි කරන්න ඕන කාරණයක්. නැත්නම් ඔබතුමාට ප්‍රශ්නය නිවැරදි කරන්න බැරි එකක් බවට පත් වෙනවා. ඒක වැදගත්. නමුත් මේ කාරණයට ඔබතුමා ඇහුම්කන් දුන්නෙම නැහැ. මම ඒකයි කතා කරේ. මම කියන්නේ මේ ප්‍රශ්නය විසඳන්න පුලුවන් හොඳම දේ තමයි වතුර එකතු වෙන එක, වැහි වතුර ටික බස්සවන්න ක්‍රමවේදයක් හදන එක. ඒ ක්‍රමවේදයට කාණුවක් දාන එක තමයි සාර්ථක විසඳුම වෙන්නේ. හැබැයි ඒ කාණුව දෙපැත්තෙන් දාන්න ගියොත් තව අමතර ඉඩ ප්‍රමාණයක් පාරට අවශ්‍ය වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමනේ. දැන් ඔය කරන්න හදන්නේ අතීසාරයට අමුඩ ගැහිල්ලක්නේ. මම යෝජනාව කියන්නම් ඔබතුමාට. පාරේ අඩි 08 ට තියෙන තැනටම දොස්තර තාප්පය ගෙනල්ලා. අඟලක්වත් ඉඩ තියලා නැහැ. පාරේ අඩියටම තාප්පය ගෙනැල්ලා තියෙනවා. පාරේ පළල අඩි 12ක් තියෙනවා. එහෙම නම් අඩි 08 පාරේ දෙපැත්තෙන් අඩි දෙක දෙක තියෙන්න ඕන. දැන් දොස්තර කරන්න හදපු වැඩේ අර මිනිහගෙන් අත්පත් කර ගෙන නිවැරදි කරන්න එහා පැත්තෙන්. ඔන්න ඕකයි ඔතන කෙටිම කාරණය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැන් ඔබතුමා පූර්ව නිගමන කියන්න එපා. මම දැන් කියන්න හදපු කාරණාව ඔබතුමා ආදේශ කරලා ඔබතුමාගේ හිතේ තියෙන එක කියලා වැඩක් නැහැ. පොඩ්ඩක් ඇහුම්කන් දෙන්නකෝ ඉස්සෙල්ලා. ඔබතුමා කියන විදියට අඩි 12 ක අනුමත පාරක් තියෙනවානම්, දැනට ඒකේ භෞතික ප්‍රමාණය අඩි 08 යි නම් ප්‍රශ්නයක් තියෙනවා අඩි 04 ක් අඩු වෙලා තියෙන නිසා. ඒක කොහෙද කියලා හොයා ගන්න මැනුමක් කරන්න ඕන ඉස්සෙල්ලා. ඒක දීර්ඝ ක්‍රියාවලියක්. දැන් මේ ක්‍රියාවලියට යන්න පුලුවන්කමක් තියෙනවාද අපිට. දැන් මේ මොහොතේ ඒකට උත්තරයක් හොයන්න පුලුවන් එකක් නෙමෙයිනේ. හැබැයි ඒ ක්‍රියාවලියට යන්න එපා කියලා නෙමෙයි මම කියන්නේ. ඒ ක්‍රියාවලියට ගියත් කමක් නැහැ. මේ මොහොතේ තියෙන ප්‍රායෝගික ප්‍රශ්නය තමයි මේ පාරේ වතුර රැඳෙන එක. වතුර රැඳුනම මිනිස්සුන්ට යන්න බැරි වෙන එක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පළවෙනියට පාරේ අඩි 12 ක් කොහෙද තියෙන්නේ කියලා බලන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක වෙනම කාරණයක්. ඒක දීර්ඝකාලීන කාරණයක්. ඒක මේ මොහොතේ උත්තරයක් වෙන්නේ නැහැනේ. එතකොට මේ මොහොතේ කරන්න පුලුවන් වෙන්නේ මේ වතුර ටික වඩා පහසුවෙන් සහ තාක්ෂණය පාවිච්චි කරලා මොනවා හරි ක්‍රමයකට, සාධාරණ ක්‍රමයකට බස්සවන්න ඕන මිනිස්සුන්ට ප්‍රායෝගිකව පාවිච්චි කරන්න පුලුවන් විදියට. ඒකට තියෙන හොඳම ක්‍රමය තමයි මම කිවුවේ. කාණුවක් දාන්න වෙනවානේ කොහොමත්. වතුර බස්සවන්න ක්‍රමයක් ඕන. ඒකට අයිනෙන් කාණුවක් දාන්න ගියොත් සභාපතිතුමා අමතර ප්‍රමාණයක් කාණුව වෙනුවෙන් වැය කරන්න වෙනවා. එතකොට ඒ ඉඩේ කොන්ක්‍රීට් කරත් බරක් දාපු වාහන යනවානේ. මිනිස්සු ගෙවල් හදන්න යනවා. බඩු අරන් යනවා. කැන්ටර් යනවා. ඕවා යනවානේ. එහෙම ගියොත් ඒ රෝද වල බර හිටියොත් ඒක ඔරොත්තු දෙන්නේ නැහැ. එහෙම කරනවා නම් විශාල පාලම්වල වගේ ලොකු වියදමක් දරලා කරන්න වෙන්නේ. ඒ නිසා හොඳම දේ තමයි පාර මැදින් වතුර රැඳෙන තැන ඉඳලා මම හිතන්නේ මීටර් 20 ක් 30 ක් ගිහිල්ලා රැඳෙන්නේ. එතකොට තව මීටර් 20 ක් 30 ක් එහාට බස්සවන්න ඕන නැහැ. ඒකට ටනල් එකක් දාලා මේවා කටක් දාලා බස්සවනවා කොන්ක්‍රීට් කරලා. එතකොට ඒක බැස්සුවට පස්සේ ත්‍රීවිල් එකක බර විතරයි පාරේ මැදට හිටින්නේ. තනි රෝදය මැදට හිටින වාහනයකට තියෙන්නේ ඕක විතරයිනේ. අනිත් ඕන වාහනයක් දෙපැත්තෙන් බර දාලා යන්න පුලුවන්. ඒක නිසා ගැටළුවක් නැහැ. මම කියන්නේ සාධාරණම ක්‍රමය. ඒක එහෙමනම් මේකට කවුරුවත් මිනිස්සුන්ගේ ගැටුම් හදන්නේ නැතුව අසල්වාසීන් අතර, ගැටුම් ඇති කරන්නේ නැතුව, දේශපාලනය පාවිච්චි කරලා මිනිස්සු කුලල් කාගෙන අපිටත් ප්‍රශ්නයක් කරගෙන යන්නේ නැතුව සාධාරණ විසඳුමකට යන්න පුලුවන් හොඳම ක්‍රමය මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 90% ක් දැන් ප්‍රශ්නය විසඳලා තියෙන්නේ වතුර පිරෙන තත්ත්වයේ. ඒකේ ඉතුරු 10% ත් අපි විසඳන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ තියෙන ප්‍රශ්නය තමයි සභාපතිතුමා අර කෙලවරේ තියෙන ගෙවල්වල වතුර බහින්න තැනක් නැහැ. කාණුවක් නැහැ ඒකයි ප්‍රශ්නය තියෙන්නේ. මිනිස්සු කැමති වෙන්නේ නැහැ තමන්ගේ වත්තට පාරේ වතුර ටික බහිනවට. ඒකට උත්තරයක් හොයලා දෙන්න. මම යෝජනා කරන්නේ ඒ සඳහා සාධාරණ උත්තරයක් හොයන්න. වතුර ටික කොහේට හරි බැහැලා ගියාට මිනිස්සුන්ගේ ප්‍රශ්නය ආපහු එහෙමමනේ. ඔය වතුර පොළව යටින් බැහැලා නිශ්චිත තැනකට යන්නේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඒකට දෙන විසඳුම මොකක්ද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්නේ වතුර රැඳෙන්නේ ගොඩක් වෙලාවට මැද හරියේ. ඒ වතුර ටික කොහේට හරි යන්න ඕනනේ. පාර දිගේ ගිහිල්ලා වතු වලට තමයි එකතු වෙන්නේ. මම කියන්නේ යන්න පුලුවන් තැනක ඉඳලා එහාට කාණුවක් තියෙනවා පහළට. ඒ කාණුවට සම්බන්ධ කරන්නයි ඕන. ඒක කරන්න පුලුවන්. අඩුම වියදමින් කරන්න පුලුවන් විදියට තමයි මම යෝජනා කරේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඉන්දික මන්ත්‍රීතුමා කියපු යෝජනාව අනුව ඒ පාර හැදීමේදී ඇස්තමේන්තු කිරීමේදී පාර මැද ඉඳලා ලොකු එස්ලෝන් බටයක් මැදින් ගිහිල්ලා වැලි පුරවලා ඒක උඩින් කොන්ක්‍රීට් කරන්නත් ඇස්තමේන්තු කරලා තියෙනවා. ඒ ඇස්තමේන්තු වාර්තාවත් ඊළඟ සභාවට මම ඉදිරිපත් කරන්නම්. පාර මැදින් කාණුවක් කපලා ලොකු බටයක් බස්සවලා, ඊට උඩින් වැලි පුරවලා ඊටත් උඩින් කොන්ක්‍රීට් දාන්න ඇස්තමේන්තු කරලා තියෙනවා. ඒකටත් මුදලක් වෙන් වෙලා තියෙනවා මේ පාරේ. ඒ ඇස්තමේන්තුව ලබන සභාවට ඉදිරිපත් කරන්න පුලුවන්කම මට තියෙනවා. ඒක කරන්නේ නැතුව තමයි මේක කරලා තියෙන්නේ. ඒ නිසා තමයි මේ ප්‍රශ්නය වෙලා තියෙන්නේ. ඒක බොහොම කරුණාවෙන් තේරුම් ගන්න. ඒ නිසා ඔබතුමා කියන විදියට ප්‍රශ්නයක් ඉවර කරන්න තව ඉඩමකින් අඩි 04 ක් අරගෙන කාණුවක් හදන එක නෙමෙයි වැඩේ. මම හිතන්නේ දිනූෂ මහත්මයා ඉන්නවා. මම කියනවා මේක පැහැදිළි කර ගන්න කාරක සභා අවස්ථාවක් කරලා එතුමාට අවස්ථාව ලබා දෙන්න. එතුමා දන්නවා පාරේ මැදින් තිබුණ කාණුව පිළිබඳව. ඒ කාණුව වහලා තියෙනවා දැන්. ඒ නිසා තමයි මේ ප්‍රශ්නය ඇති වුණේ. ඒ කෙසේ වෙතත් ඔබතුමාලා මොන ක්‍රමයෙන් හරි වතුර වල නැති කරන්න යෝජනා කරන්න. මැදින් කාණුවක් කපලා ඉන්දික මන්ත්‍රීතුමාගේ යෝජනාවේ විදියට බටයක් දාලා උඩින් වැලි දාලා ඊටත් උඩින් කොන්ක්‍රීට් කරන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. බටයට මුකුත් වෙන්නේ නැහැ. එතකොට එක තැනකින් විතරක් පුංචි කටක් තියනවා වතුර ටික බහින්න. ඉතිං ඒක නිවැරදි කරන්න පුලුවන්. ඒක පාර හැදීමේදී කරලා තියෙන වැඩක්. නමුත් ඒක වෙලා නැහැ. පැහැදිළිවම ප්‍රසිද්ධියේ කියනවා දොස්තර මහත්තයා තමයි ඔතන වල හදා ගත්තේ. එතුමා බොහොම තර්ජනාත්මකව කියලා තියෙනවා මගේ මිදුලට වතුර එනවා ඔච්චර උස්සලා හදන්න එපා කියලා. මම ඕන නම් ලබන සභාවට ඒ පුද්ගලයාව ගෙන්වන්නම්. ඒ හැම දෙයක්ම තියාගෙන අහිංසක මිනිහෙක්ගේ ඉඩමෙන් අඩි 04 ක් අරගෙන කාණුවක් දාන්න එතුමා යෝජනා කරනවා නම් පහුගිය රජයෙන් හෝ වේවා, දැන් හෝ වේවා ඒකට ඉඩ තියන්න බැහැ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චමින්ද මන්ත්‍රීතුමා කියන කාරණයේදී එක දෙයක් පැහැදිළි වෙනවා. අර පාරේ ලෙවෙල් එකට එතනදී බොක්කක් අරන් තියෙනවා. ඒක පේනවා. හිතාමතාම අර පැත්තේ ඉඩමට වතුර යනවාට ඒක උපක්‍රමශීලිව එතන වලක් හදලා වැටියක් දාගෙන තියෙනවා. ඒක ගිහින් බලන්න ඕන.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** සභාපතිතුමා ඒ වතුර වල උඩින් ළමයි ඉස්කෝලේ ගියා. මම ඒක පැහැදිළිව කියනවා. මේක සභාගත කළ යුතුයි. මේ වගේ දොස්තර මහත්වරු මේ ගමේ තියාගන්නත් එපා. ඒ වතුර වලේ යන්න බැරි වෙන කොට ගමේ මිනිස්සු තාප්පය අල්ල අල්ල ගියා. තාප්පයේ ග්‍රීස් ගෑවා. ගරු සභාපතිතුමා ඔබතුමාට ඡායාරූප පෙන්වන්න පුලුවන්. කලුතෙල් ගෑවා තාප්පයේ. එවන් කෙනෙකුට මෙවැනි වැඩ කරන්න දෙන්න බැහැ සභාපතිතුමා. කරන්න කිසිසේත්ම ඉඩ දෙන්න එපා සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමත් සභාවේ මේ වෙලාවේ එකඟතාවය නැහැ ඕකට. ඒක ලියලා යවන්න ප්‍රාදේශීය ලේකම් එකට සභාවේ එකඟතාවය නැහැ කියලා.

**02.** අවහිර වී ඇති බෝක්කුව ප්‍රතිසංස්කරණය කර ගැනීම සඳහා. (ගාල්ල, බෝපෙ, වටරැක පාරේ 50 වත්තේ ගම්වාසීන්)

මේක විධිමත් සභා යෝජනාවක් විදියට ඉදිරිපත් කරන්නම්.

**03.** සභා තීරණයක් සංශෝධනය කරවා ගැනීම. (පූජ්‍ය අම්බලන්ගොඩ සුමේධානන්ද ස්වීවර, විහාරාධිපති, ශ්‍රී ථූපාරාම රජ මහා විහාරය, වැලිපිටිමෝදර, ගිංතොට)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, දැන් ඔය ඉල්ලීම සාධාරණයි. හේතුව වන්නේ ථූපාරාමය කියන්නේ අපේ පන්සලක්. ඒ නිසා අදහසක් දක්වන්න ඕන මේකට. යෝජනාව ගේන කරුණු පැහැදිළි කරන්න ඕනනේ. නිකං ගේන්න බැහැනේ. නිකං යෝජනාවක් ගෙනල්ලා වැඩක් නැහැනේ. එතකොට මම හැල්ලුවට පත් වෙනවානේ. මේකෙන් ප්‍රයෝජනයක් වෙන්න එපැයි මට. මේක සාකච්ඡාවට ඇවිල්ලා එපැයි අනුමැතිය දෙන්න. නිකං දීලා වැඩක් නැහැනේ. සභාවේ කතා කරාම අපි ඒකට උත්තරයක් දෙන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සමාවෙන්න ඕන. එහෙමනම් මෙහෙම කරමු. තේ පානය සඳහා සභාව නවත්වලා ගිහින් එන්නම්. මොකද ඒ ප්‍රශ්නයත් විසඳන්න ඕන. මාර්ග සංවර්ධන

අධිකාරියෙනුත් ඇවිල්ලා ඉන්නවා. සිල්වාගෙවත්ත ගමේ දෙගොල්ලෝ ගහ මරා ගන්නවා. යුද්ධයක් එතන. සිල්වගෙවත්තට මම ගිහිල්ලා එන්නම්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** විනාඩි දෙකක් දෙන්න මම උත්තරය දෙන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඇවිල්ලා කතා කරමු. පැය බාගයක් දෙන්න. මම ඉක්මනට එන්නම්. පැය බාගයකට සභාව කල් තියනවා.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර ථූපාරාම විහාරස්ථානයේ ගැටළුව පැමිණියේ. අපි ඊළඟ සභාවේදී විධිමත් සභා තීන්දුවක් ගමු. මොකද ඒක ලැබිච්ඡ ලිපියක්. අපි සභාවේ න්‍යාය පත්‍රයට දාලා ඊළඟ සභාවේදී විධිමත්ව ඒ සභා තීරණය වෙනස් කරමු.

**<u>(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> ඃ- නැත**

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** හපුගල, මවුන්ට්ප්ලසන්ට් වත්තේ සල්ගහ අසලින් ඇති අතුරු මාර්ගය මැන මාර්ගයේ නිශ්චිත පළල ලකුණුකර පාරේ ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සල් ගහ ළඟින් තියෙන මාර්ගය අඩි 20 කට වඩා පළල මාර්ගයක්. දැනට ඒ මාර්ගය අල්ල ගන්න කටයුතු කරනවා. ඒක නිසා ඒ මාර්ගයේ පළල මනිනවා. ඒක විතරයි දැනට හපුගල වසමේ හරි පාරකට තියෙන්නේ. ඒක හින්දා ඒක මැනලා ඒ තියෙන අනවසර ඉදිකිරීම් ඉවත් කරන්න කියලා යෝජනා කරේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** ප්‍රධාන කාර්යාලය සඳහා පරිගණක කට්ටල හතරක්ද, උප කාර්යාලය සඳහා ෆැක්ස් යන්ත්‍රයක්ද, පුස්තකාල දෙක සඳහා පරිගණක කට්ටල දෙකක්ද, නැණසල මධ්‍යස්ථානය සඳහා පරිගණක කට්ටලයක්ද මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** ප්‍රධාන කාර්යාලයේ වී.සී පාරට මුහුණලා ඇති පැත්තේ තාප්පය බැඳීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක අබේසේකර මන්ත්‍රීතුමා දිගින් දිගටම සඳහන් කරා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** ප්‍රධාන කාර්යාලයේ බාහිර පරිසරය ආවරණය වන පරිදි සී.සී.ටී.වී කැමරා පද්ධතියක් සවි කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ යෝජනාව හොඳයි. මම ඉල්ලනවා මේ අවට තියෙන දේවල් වලට වඩා මේකේ ප්‍රශ්න පවා ඇතිවුන දේවල් නිසා මම යෝජනා කරනවා ඇතුලටත් සවි කරන්න කියලා. අපි කස්ටම් එක වෙන්න ඕන නැහැ. විශ්ව විද්‍යාලය වගේ වෙන්න ඕන නෑ. ඒ විරෝධතා පළකරපු තැන් වගේ වෙන්න ඕන නැහැ. ඇතුලේ විශේෂයෙන්ම තියෙන්න ඕන. මේකේ ලිපිගොනු නැතිවෙලා ප්‍රශ්නයක් වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක හරි. ඒක ලේකම්තුමා මම යෝජනාවක් විදියට දාන්න කියන කොටම මම ඕක මෙතුමට කිවුවා අනිවාර්යයෙන් වෙන්න ඕන මේක

කියලා. නමුත් මූල්‍යමය තත්ත්වය පිළිබඳව පළවෙනි කාරණය තියෙන්නේ. මේක බාහිර පරිසරයට අවශ්‍ය වුණේ අපේ වාහන සම්බන්ධව ප්‍රශ්න දෙක තුනක් ඇති වුණ නිසා. ඒක එකක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක ලොකුවට යන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක එක කාරණාවක්. යම් යම් දේවල් සිද්ධ වුණා. දෙවැනි කාරණාව විදියට මේක සඳහන් කරත් කමක් නැහැ. අපේ මුරකරන කෙනා මම එද්දි දවස් කිහිපයක් එක්කෝ වාහනය ඇතුලේ නිදි. එහෙම නැත්නම් නැගිට්ටව ගන්න බැරි තරමට නිදි. ඔය වගේ කාරණා කිහිපයක් සිද්ධ වුණා. ඉතිං සමාවෙන්න ඕන. ඕක මාධ්‍ය වල සඳහන් කරන්න එපා කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මොකද ඒක හොඳ නැති හින්දා. ඉතිං ඔය වගේ කාරණා කිහිපයක් හින්දා තමයි මේක යෝජනා කරේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නෑ ඒක වැදගත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කාරණා කිහිපය හින්දා තමයි බාහිර පරිසරය කියන එක මුලින්ම කරන්න යෝජනා වුණේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට සංශෝධනයක් විදියට ඇතුලත් කරලා මුළු කාර්යාලයටම සවි කරන්න. කිසි වැරැද්දක් නැහැ.

ප්‍රධාන කාර්යාලයේ බාහිර හා අභ්‍යන්තර පරිසරය ආවරණය වන පරිදි සී.සී.ටී.වී. කැමරා පද්ධතියක් සවි කිරීමට ලෙස එම යෝජනාවට මම සංශෝධනයක් එකතු කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම සංශෝධනය මම ස්ථිර කරනවා.

අබේසේකර මන්ත්‍රීතුමාගේ යෝජනාව හොඳයි. කලිනුත් අපි ඒක කතා කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**05.** වටරැක නැගෙනහිර, ලියනගෙදර වත්ත මාර්ගය දෙපස කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අර අඩි 08 පාර. ඇමතිතුමා කිවුවා ඒකට කාණුවක් දාලා පාරේ පළල ගන්න කියලා. සපත්තු කාණුවක් දාලා පාර පළල් කරන්න හදන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා විනාඩියක් ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ මතුවෙච්ච කරුණ සම්බන්ධවද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම හිතනවා ඒක වැදගත් වේවි කියලා. මේ පාරවල් වල කාණු ඉතා වැදගත්. ඒක සංවර්ධනය කළ යුතුයි මොන තරම් වියදම් ගියත්. හැබැයි මම ඔබතුමාගෙන් බොහොම පැහැදිළිව ඉල්ලනවා මේක අපි දිගින් දිගට ගෙනාවා. අපි යෝජනාවක් විදියට ගෙනල්ලා සම්මත කරා. වෙන්දේසි ඉඩම්කාරයෝ නිසා අද වටරැක ඉවර වෙලා තියෙනවා. වටරැක විතරක් නෙමෙයි අනිත් තැනුත් ඉවර වෙලා ගිහිල්ලා තියෙනවා. හපුගල ඒ ටිකම ඉවරයි. ඒ අය නිසා තමයි ඒ පාරවල් වලට මේ විනාශය සිදු වුණේ. ඒ නිසා සම්ප්‍රදායිකව තිබුණ ගම්මානයේ කිසිම කෙනෙකුට හිරිහැර නොවන විදියට අපේ තාක්ෂණ නිලධාරීන් සහ ඒ අය යොදවලා ඉවර වෙලා ගරු සභාපතිතුමනි ඒ පාරවල් ප්‍රතිසංස්කරණය කරන්න ඕන. හැබැයි වැඩක් තියෙනවා ඔබතුමා හොඳටම දන්නවා ඇක්සස් ආයතනයට අපි බොහොම පැහැදිළිව පවරලා තිබුණා පීල්ලෙන් එහාට යනකම් කාණු පද්ධතිය ගෙනිහිල්ලා පීල්ලට හානි නොවන විදියට කරන්න කියලා. නමුත් එදා හිටපු දේශපාලඥයෝ ඒක කරේ නැහැ. ඒක බයිබරි එකට පවා දැම්මා අපි. එදා හිටපු දේශපාලඥයෝ මොකක්ද කරේ අයි ප්‍රොජෙක්ට් එකේ සල්ලි යොදවලා ඉවර වෙලා ඒ වැඩේ කෙරෙව්වා. ඒක තමයි කරේ ඒ කොම්පැනියේ සපෝට් එකට. ඉතිං මේ නිසා මම ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි මේ කාණු පද්ධතිය සකස් කරන කොට ඔබතුමාට හෙට අනිද්දා වෙන කොට එනවා ප්‍රශ්නයක් වටරැක ප්‍රදේශයට පහුගිය දවස් වල අපේ සුගත් මන්ත්‍රීතුමත්, මමත්, ලියනගේ මන්ත්‍රීතුමත් ගියා ඔබතුමත් හිටපු දවසේ. මේක තවත් විධිමත් වෙන්න අපේ අනිත් අයත් එක්කත් යන්න ඕන මේක බලන්න. මේවා අපි ප්‍රතිසංස්කරණය කරන්න යන්න එපා. මේක ඒ ආයතන වලට භාර දීලා කරන්න. දැන් වටරැක ප්‍රදේශය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තියෙන්නේ. ඒක හින්දා ඔබතුමාගේ අවධානය මම යොමු කර

වන්නේ වෙන දේකට නෙමෙයි. ඒ වගේ තැන්වල පාරවල්, කාණු පද්ධති හදන කොට බලන්න අර වගේ ආයතන නිසා එහෙම වෙලාද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක එහෙම එකක් නෙමෙයි. මේක සුගත් මන්ත්‍රීතුමත් දන්නවා. මේක චන්ද්‍රනලගේ ගෙවල් වලට යන පාර. ඒ පාරේ පටන් ගැන්ම අඩි 10 තියෙනවා. ඒක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කරපු වැරැද්දක්. ඒ පාරේ ඉතුරු ටික අඩි 08 ට තමයි කරේ. මුල් කොටසේ තියෙනවා අඩි 10 ට. ඉතුරු ටික අඩි 08 ට කොන්ක්‍රීට් වෙලා තියෙන්නේ. ඒකේ පාරේ පළල නැත්නම් තව කමක් නැහැ. පාරේ යන්න පුලුවන් පළලක් තියෙනවා. ඉතිං ඒක ලොකු ගැටළුවක්. මම යෝජනා කරේ ඉතුරු ටික අඩි 02 ක් හෝ අඩි 1 ½ ක් වෙන්න සපත්තු කාණුවක් යෙදුවම ඒ පාරේ පළල හැදෙනවා. නැත්නම් අපරාදේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සපත්තු කාණුව කොන්ක්‍රීට් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** හපුගල, ඩාලින්ටන්වත්තේ, පොකුණ ඉඩම අසළ පැති කාණුව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** හපුගල, සරසවි අසපුවේ අබලන් වී ඇති පෙට්ටි බෝක්කුව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** ප්‍රධාන කාර්යාලයේ සෙල්ලම් මිදුලේ වැට අලුත්වැඩියා කොට අලුතින් සිමෙන්ති බංකු හතරක් සහ මේස දෙකක් මිලදීගෙන සවිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔක්කොම කොන්ක්‍රීට් වලින් සෙල්ලම් මිදුලට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක ෆයිබර් කරන්න. පොඩි ළමයිනේ එන්නේ. කොන්ක්‍රීට් වලින් මේක හදනවාට වඩා එහෙම කරන එක ආරක්ෂිත වෙන්නේ නැද්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ පොඩි ළමයින්ට නෙමෙයි. අම්මලා, තාත්තලා, එන අයට වාඩි වෙන්න අයින දිගේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සෙල්ලම් මිදුල ඇතුලේ නෙමෙයි එළියෙද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇතුලේ මායිම අයිනේ වාඩි වෙන්න තියෙන බංකු ගැන මේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කාරණය පැහැදිළියි. සෙල්ලම් මිදුල ඇතුලේ ළමයිනේ සෙල්ලම් කරන්නේ. අපි යකඩ වලින් නැතුව ෆයිබර් වලින් ආවරණයක් දාන එක තමයි හොඳ. ඒක කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනටමත් තියෙනවා. ඒවාට අමතරව තියෙන අඩුපාඩු ටික හදන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා සුදුසු විදියක් කල්පනා කරලා බලලා ආරක්ෂාව සම්බන්ධව ප්‍රමුඛතාවය දීලා ඒ වැඩේ කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා නාවින්නේ තියෙනවා බංකු, මේස හයිකරපුවා කැලේ වැදිලා. දෙකක් තියෙනවා. අන්න ඒ දෙකත් ගෙනල්ලා මෙහේ හයි කරන්න කියන්න. සත පහකට වැඩක් නැහැ ඒක. එහෙමම කැලයක් ඒක. නාවින්නේ අර වෙන්දේසි කරපු කැල්ලේ තියෙන්නේ. සත පහකට වැඩක් නැහැ. හරක් කාලා තියෙන්නේ. මක්කවක්වත් නැහැ. කාටවත් දැන් ඒක ඉල්ලන්නත් බැහැ. ඒක ගෙනල්ලා හයි කරන්න. ඊට පස්සේ මදි ටික ගේන්න. ඒවා කඩලා. හයිකරපු එකත් අපරාදේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09.** උළුවිටිකේ, කිතුලම්පිටිය උතුර, සිල්වගේවත්ත, පී.ඩබ්. තිලකරත්න මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10.** අප ප්‍රාදේශීය සභාවේ සේවා කටයුතු සඳහා චෙන්සෝ මැෂිමක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**11.** සභා අරමුදලින් දෛනික ගෙවීමේ පදනම මත වැඩ/ ක්ෂේත්‍ර කම්කරුවන් පස්දෙනෙකු බඳවා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඒකට මට පොඩ්ඩක් ඔබතුමත් එක්ක ප්‍රශ්නයක් තියෙනවා. මමත් අර ඔබතුමාගේම කොට්ඨාශයේ තරුණ මහත්මයෙක්ගේ අවශ්‍යතාවය වෙනුවෙන් සේවයට ගන්නා ලෙස යෝජනාවක් කරා. එතකොට ඔබතුමා මට ඒකට ලිපියක් එවලා තියෙනවා "අප ප්‍රාදේශීය සභාවේ මේ වන විට ඇති රැකියා පුරප්පාඩු සඳහා ඉදිරියේදී ගැසට් පත්‍රයේ පළ කොට බඳවා ගැනීමට නියමිත බැවින් ඔබගේ යෝජනාවලියේ අංක 01 යටතේ නම්කර ඇති තරුණයාව කම්කරු තනතුරක් යටතේ අප ප්‍රාදේශීය සභාවේ සේවයට බඳවා ගැනීමට හැකියාවක් නොමැති බව කාරුණිකව දන්වමි." කියලා. "ඒ අනුව, මෙම යෝජනාව 2020.09.15 දින පැවැත්වීමට නියමිත මහා සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුලත් නොකරන බවට කාරුණිකව දැනුම් දෙමි" කියලා තියෙනවා.

ඉතිං මට ගැටළුවක් ආවේ දැන් ඔබතුමාගේ යෝජනාවලියේ තියෙනවා පස් දෙනෙක් බඳවා ගන්න. එතකොට මම එකක් දැම්මම මෙවැනි අදහසකුත්, ඔබතුමාට මෙවැනි අදහසකුත් මතු වීම සම්බන්ධව මන්ත්‍රීවරයෙක් විදියට මට ගැටළුවක් ආවේ. ඒක නිසා ඔබතුමාගේ අදහස මොකක්ද කියලා මම දැන ගන්න කැමතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට නම් කරලා ගන්න බැහැ. නම් කරලා අහවලා ගන්න කියන පදනමක් නැහැ. අපි ගැසට් කරලා තමයි ගන්නේ. දැන් ගිය සැරේ දහ දෙනා ගත්තෙත් සභා තීන්දුවක් අරගෙන දහ දෙනෙක් ගන්න. ඒක ගැසට් කරලා තමයි ගන්න පුලුවන්. කෙනෙක් අහවලා කියලා ගන්න බැහැ. ප්‍රසිද්ධ කරලා ගන්න වෙන්නේ. සම්මුඛ පරීක්ෂණ කරලා එහෙම ගන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක පැහැදිළියි. දැන් අපි මන්ත්‍රීවරු විදියට න්‍යායපත්‍රයට අරක මොකක්ද නෙමෙයි, අපි නමක් දැම්මා නම් ඔබතුමාට තිබුණා නම නැතුව යෝජනාව දාන්න. ඒකේ ප්‍රශ්නයක් නැහැ. මේකට වුණත් කමක් නැහැ. මට මේක එවන්න තිබුණා ඔබතුමාගේ යෝජනාවට ඇතුළත් පුද්ගලයාවත් මේ පහ ඇතුළේ ඉන්නවා කියලා දැම්මා නම් ඒක ප්‍රජාතන්ත්‍රවාදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මට කියන්න බැහැනේ. මේ පස් දෙනා ඇතුළේ ඉන්නවා කියලා කියන්න බැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** නම අවශ්‍ය නැහැ. නමේ නෙමෙයි ප්‍රශ්නය. මේක දැන් ඔබතුමා කියන විදියට මේ පහ දාන්නත් බැහැ. ගැසට් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභා තීන්දුවක් ගත්තේ පස් දෙනෙක් ගන්න. අරගෙන ඒක අපි ප්‍රසිද්ධ කරනවා. ප්‍රසිද්ධ කරලා සම්මුඛ පරීක්ෂණයක් තියලා තමයි ගන්නේ පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශ අරගෙන.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක අපිට පිළිගන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තව ස්ථිර තනතුරු දෙකක් තියෙනවා. ඒවටත් එක්ක තව පස් දෙනෙක් ප්‍රසිද්ධ කරලා, සුදුසුකම් බලලා ගන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** විපක්ෂය විදියට ඔබතුමන්ලා සලකන හින්දා වෙන්න ඇති මේක වෙන්නේ. නැත්නම් මීට පෙර අවස්ථා ගණනාවකම න්‍යාය පත්‍රය බලන්න නමින්ම දාපුවා අනන්තවත් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගත්තේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගත්තේ නැති එක හරි. ගත්තේ නැහැ කොහොමවත් අපි දැම්මට.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** යෝජනාව හදලා දාන්න තිබුණානේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** හදන්නේ නැහැනේ මන්ත්‍රීතුමා. අපිට පේන විදියට ඔබතුමන්ලත් එක්ක සහෝදරයෝ විදියට අපි ඉන්නවා නේද කියලා පක්ෂයක් විදියට රටේ ජනතාව අහනවා. ඒක නිසා තමයි අපේ ගෙවල් වලට ඇවිල්ලා මේ ප්‍රශ්නේ කියන්නේ. කියන නිසා අපිත් මන්ත්‍රීවරු විදියට යෝජනා ගේනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. මේක තේරුම් ගන්න ඉස්සෙල්ලම ප්‍රියන්ත මන්ත්‍රීතුමා. එහෙම ප්‍රශ්නයකට නෙමෙයි. දහදෙනෙක් ගත්තනේ. එතනදී තිස්ස මන්ත්‍රීතුමා යෝජනා කරලා එවපු කෙනා නැවතුණා. ඒකට තමයි තිස්ස මන්ත්‍රීතුමා හැම සභාවකටම නමක් යෝජනා කරේ. එක වෙලාවක සුගත් මන්ත්‍රීතුමා විරුද්ධ වුණා. ඒ අලුතෙන් ගනිපු එකක් නෙමෙයි. ඒ නැවතුණ කෙනෙක් වෙනුවට ගන්න එකක් ඒ යෝජනා කරේ. නමුත් මේ පස් දෙනෙක් ගන්න මූලික හේතුව වුණේ ඒක නෙමෙයි. පස් දෙනෙක් ගන්න මූලික හේතුව වුණේ දැන් අර ගිය සභාවේදී වැරදීමක් වුණ නිසා. දැන් උප කාර්යාලයේ අය උප කාර්යාල කොටසේ වැඩ කරවන්නයි, මෙහේ අය බෝපෙ කොටසේ වැඩ කරවන්නයි කියලා සුගත් මන්ත්‍රීතුමා යෝජනාවක් ගෙනාවනේ. නමුත් මම එවෙලේ කිවුවා ඒක හරියන්නේ නැහැ කියලා. සභාවේ සියලු දෙනා ඒකට සාක්ෂි දරාවි. මොකද අපේ ප්‍රීමික්ස් ව්‍යාපෘතිය වෙනම යනවා. ඒක යනකොට උප කාර්යාලයේ පස් දෙනෙක් එතනට ඕන. ඒක හින්දා ඒක හරියන්නේ නැහැ. නමුත් ඒ යෝජනාව ස්ථිර වුණ හින්දා මට ක්‍රියාත්මක කරන්න සිද්ධ වුණා. ඒ යෝජනාව ස්ථිර වෙච්ච හින්දා. දැන් මේ පස් දෙනා බඳවා ගන්න යෝජනා කරේ ඒ පස් දෙනා වෙනුවට. නැත්නම් වෙන්නේ අපේ ප්‍රීමික්ස් ව්‍යාපෘතිය කරන් යන්න හම්බවෙන්නේ නැහැ. ඒක සම්පූර්ණයෙන්ම ඉවරයි එහෙමනම්. ඒකට තමයි පස් දෙනෙක් බඳවා ගන්න යෝජනා කරේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපිට බැරිද මේ පස් දෙනා අතරට ඒ තරුණයාටත් අවස්ථාවක් ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ තරුණයාට විතරක් නෙමෙයි ඕන අය ඉන්නවානම් ඒ අයගේ සුදුසුකම් පරීක්ෂා කරලා බලලා ගන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මෙහෙමයි. ඔබතුමාගේ තර්කය ඒක. මීට කලින් නමින්ම ආවා. කවදාවත් ඔහොම ප්‍රශ්නයක් ආවේ නැහැ. එතකොට අපිට තේරෙනවා පහුගිය සිද්ධීන් එක්ක අපිට කොහොමත් අවස්ථාවක් දුන්නේ නැහැනේ සභාපතිතුමා. එතකොට අපි මේක දැම්මට කමක් නැහැ. හෙට ඔබතුමා දුන්නත් කමක් නැහැ. එහෙම කරලා දැම්මහම මේකත් එක්ක සසඳනකොට මන්ත්‍රීවරයෙක් විදියට මට දැනෙනවා ඔබතුමා හිතාමතා මේක කරා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මෙහෙමයි ප්‍රියන්ත මන්ත්‍රීතුමා. දැන් මම පැහැදිළි කරලා කිවුවානේ. මින් ඉදිරියට එහෙමත් නැහැ. ඒ එක නමක් තිස්ස මන්ත්‍රීතුමා දිගින් දිගට යෝජනා කරේ. ඒක බඳවා ගන්න තිබුණා. අපි දහදෙනෙක් බඳවා ගන්න තීරණයක් අරගෙන ඉඳලා එක්කෙනෙක් බඳවා ගන්න ගියේ අයින් වෙච්ච හින්දා. අපිට ඒකටත් පළාත් පාලන කොමසාරිස්තුමා නිර්දේශය දීලා නැහැ. දැන් ඔය විදියට ගියොත් හැමෝම හැම මාසෙම එක්කෙනෙක් ගන්න, එක්කෙනෙක් ගන්න කිය කිය නම් වශයෙන් සභාවට යෝජනා කරාවි. ඒ පාර සභාව තීන්දු කරාට පස්සේ මගෙන් අහවි අරයා ගත්තේ නැද්ද, අරයා ගත්තේ නැද්ද කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔබතුමා කියන්නේ ඒක. මම දකින දේ න්‍යාය පත්‍රයට මේක දැම්මා කියලා මේ මන්ත්‍රීවරුන්ට තියෙන යම් කිසි ගෞරවයක් තියෙනවා නම් ඒක නැතිවෙන එක වෙන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අහන්නේ ඔබතුමාගෙන් මෙච්චරයි. ඔබතුමා දැන් මේ මාසේ දානවා. තව මන්ත්‍රීවරු පස් දෙනක් ලබන මාසේ පස් දෙනෙක්ව දානවා. ඊට පස්සේ ඉතුරු දහ දෙනත් දහයක් දානවා. එතකොට මම කොහොමද ඒක නවත්වන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඉතිං මේ විදියටම ඔබතුමාට නවත්වන්න පුලුවන්නේ. න්‍යාය පත්‍රයට දැම්මා කියලා මේක දෙන්නේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇයි දාන්නේ එහෙමනම්. මම දැන දැන ඇයි දාන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අපිට තේරෙනවා ඔබතුමාගේ ප්‍රජාතන්ත්‍රවාදය රෙද්දේ පල්ලෙන් බේරෙන විදිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඔබතුමා දකින විදිය තේරුණාද,

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** න්‍යාය පත්‍රයට යෝජනාවක් දාන්න මන්ත්‍රීවරයෙකුට අයිතිවාසිකමක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒ අයිතිවාසිකම ඉල්ල ගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අපි එදා ඉඳන් සහය දීලා ඔබතුමාලා එක්ක ඉන්නවා. ඔබතුමාලා එහෙම කරන එක වැරදියිනේ. මේකේ යෝජනාවක් දැම්මට මට දෙන්නේ නැහැනේ. දෙන්නෙත් නැහැ ඔබතුමාලා කොහොමත්. ඒක වෙනයි. නමුත් න්‍යාය පත්‍රයට දාන්න පුලුවන්. ඔබතුමා එතනදී නීති විරෝධියි. ඔබතුමාට පස් දෙනෙක්ගේ නම් දාන්න පුලුවන් සහා අරමුදලින් ගෙවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නම් දාලා නැහැනේ කාගේවත්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** නම් වැඩක් නැහැනේ. නම ඉවත් කරලා දාන්න තිබුණා නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කිවුවා වගේම මාත් මේකේ බබෙක් නෙමෙයි. ඔබතුමාගේ එක න්‍යාය පත්‍රයට දැම්මා නම් ඔබතුමා ගිහින් පෙන්වනවා ඒ මිනිස්සුන්ට මෙන්න මම යෝජනා කරා සභාපතිවරයා ගත්තේ නැහැ කියලා. මමත් බබෙක් නෙමෙයි මේකේ. ඔබතුමා මිනිස්සුන්ට ගිහිල්ලා පෙන්වනවා මෙන්න මගේ යෝජනාව සභා සම්මත වෙලා තියෙනවා සභාපතිතුමා තව ගත්තේ නැහැ කියලා. ඔබතුමා ඒක කියනවා. මම ඉල්ලගෙන මට ආයුධ ගන්න ඕනද, මට නෙමෙයි අනෙක් මන්ත්‍රීවරුන්ටත් ඒක කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒ ඔබතුමා හිතන තැන. මට මේක දුන්නත් ඇතිනේ එහෙමනම් ඔබතුමා ගත්තේ නැහැ කියලා. ලියුම තියෙනවානේ. ඔය තර්කය ඔබතුමා මෙතන ලිඛිතව දීලා තියෙනවානේ. මට මේකත් ගිහින් දෙන්න පුලුවන්නේ. ඔබතුමා කියනවා මේ තරුණයාව ගන්නේ නැහැ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද ඒකේ තියෙන්නේ. ඒක කියවන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මම දීපු එකට ඔබතුමා උත්තරයක් එවලා තියෙනවා. ඔබතුමා කියපු තර්කයට මම කියන්නේ.

"අප ප්‍රාදේශීය සභාවේ මේ වන විට ඇති රැකියා පුරප්පාඩු සඳහා ඉදිරියේදී ගැසට් පත්‍රයේ පළ කොට බඳවා ගැනීමට නියමිත බැවින් ඔබගේ යෝජනාවලියේ අංක 01 යටතේ නම්කර ඇති තරුණයාව කම්කරු තනතුරක් යටතේ අප ප්‍රාදේශීය සභාවේ සේවයට බඳවා ගැනීමට හැකියාවක් නොමැති බව කාරුණිකව දන්වමි."

"ඒ අනුව, මෙම යෝජනාව 2020.09.15 දින පැවැත්වීමට නියමිත මහා සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුලත් නොකරන බවට කාරුණිකව දැනුම් දෙමි"

ඉතිං මේක මම පෙන්නුවත් ඇතිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහේද මේකේ නමක් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** නමක් ඕන නැහැනේ. මේ තරුණයාගේ නම තියෙන්නේ මගේ යෝජනාවේ. දැන් ඔබතුමා මට දීපු උත්තරය මම කියෙව්වානේ. ඔබතුමා මෙතන මොන තර්කය ගෙනාවේ මම මේක මෙතන නමින් ස්ථිර කරාම ගිහින් කියන එකක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක විතරක් නෙමෙයි. මේ එක කාරණයක් විතරයි. මේකේ දැන් අනිත් මන්ත්‍රීවරු ඔක්කොම එක එක නම් දාලා යෝජනා කරොත් මම මොකද කරන්නේ කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දැන් සභාවේ වැඩ ටික කරගෙන යන්නකෝ. ඕක වැඩක් නැහැ දිග් ගස්සවලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. නෑ. ඒක මම දැන් කිව්වේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** නම් දාලා යෝජනා ආවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒ එතුමා දාපු කෙනා වෙනුවට තව කෙනෙක්ව බඳවා ගන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** එතුමා දාපු යෝජනාවල නම දාලානේ තිබුණේ. ඉතිං මේකත් ගන්න තිබුණානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒකත් ගන්න බැහැයි කියලා එවලා තියෙනවා. ඒක ගත්තෙත් නැහැනේ. තිස්ස මන්ත්‍රීතුමත් අන්තිමට ඒක දැම්මේ නැහැ. මෙතුමාගේ එක මම තුන්පාරක් දැම්මේ නැහැ. මුල් පාරක් දැම්මා. ඒ දැම්මේ වෙන කාරණාවක් හින්දා නෙමෙයි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ යෝජනාව ගැන අදහසක් තියෙනවා. මෙම දෛනික වැටුප පදනම මත පස් දෙනෙක්ව බඳවා ගත්තත් මේ අයව අපි ස්ථිර කිරීමට පෙර කල්පනා කළ යුතු කාරණාවක් තියෙනවා. අපි විසින් මීට වසර දෙකකට පෙර සේවකයන් දහ දෙනෙකු මෙම පදනම යටතේම බඳවා ගත්තා. නමුත් එම සේවකයන්ගේ පැමිණීම පිළිබඳව ගැටළුවක් තියෙනවා. ඒ අය වර්ෂයකට දින 180 ක පැමිණීමක් ඉදිරිපත් කරන්න ඕන ඔවුන්ගේ සේවය ස්ථිර කිරීමේදී චක්‍රලේඛ පරිදි. නමුත් ඔවුන්ගේ පැමිණීම තියෙන්නේ දින 100 ක් 120 ක් ආදී වශයෙන්. පස් හය දෙනෙක්ගේ පැමිණීම ඉතාම දුර්වලයි. ඒ පැමිණීම දුර්වල අයට අපි ගත යුතු යම් කිසි ක්‍රියාමාර්ගයක් තියෙන්න ඕන. නැත්නම් අපිට අවශ්‍ය ශ්‍රමය ලබා ගන්නට අපේ කම්කරුවන් මෙතන අවශ්‍ය දිනයට නැහැ. ඒ නිසා ඔවුන් බඳවා ගැනීමේ අරමුණ ඉටු වන්නේ නැහැ. ඒ නිසා ඔවුන්ට හිතුන දවසට එනවා. නැත්නම් නැහැ. දින 100 ටත් අඩුයි සමහරුන්ගේ වාර්ෂික පැමිණීම. ඉතිං ඒ අය ගැනත් අපි ඔවුන්ව දැනුවත් කරලා ඔවුන් වෙනුවෙන් තීරණයක් ගත යුතුයි කියලා මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

ඒ වගේම අපිට කාරණයක් කියන්න තියෙනවා. මේ සභාව 11 යි, 11 යි යටතේ තියෙන සභාවක්. මේ සභාවේ ගරු ප්‍රියන්ත මන්ත්‍රීතුමාගෙන් මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා ඔබතුමා නැවත සභා වාර්තා පරීක්ෂා කරලා බලන්න. කමිටු තීරණ බලන්න. එතකොට 11 ත්, තීරක ඡන්දයෙනුත් විතරක් සම්මත වෙච්ච යෝජනා මෙතන කොච්චර තියෙනවද කියලා බලන්න. එතකොට අපිට තේරුම් ගන්න පුලුවන්. ඔබතුමා ඉඳලා තියෙන්නේ මොන පැත්තෙද කියලා බලන්න. එතකොට අපිට තේරුම් ගන්න පුලුවන්. ඒ නිසා නැවතත් අපි මේ සම්මුතියක් එක්ක එකඟතාවයකට එන්න පුලුවන්. හැමදාම හිටියා කියන කතාව ප්‍රතික්ෂේප කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, මටත් ඒ පිළිබඳව අදහසක් දක්වන්න තියෙනවා. මේ සභාව තුළ වැරදි මතයක් යන්න පුලුවන් එළියට. මේකේදී අපි ප්‍රජාතන්ත්‍රවාදී නැහැ, අපි පක්ෂග්‍රාහී විදියට හිතුමතේ වැඩ කරනවා කියන එක යන්න පුලුවන්. හැබැයි මම දකින විදියට මේකේ ගැටළුව තියෙන්නේ මෙතුමාට මේ සභාවෙන් ගියපු ලියුමේ. මේ යෝජනාව අයින් කළ යුතුයි. හේතුව තමයි අයින් කරන්න ඕන සභාපතිතුමා මේ යෝජනාව දාලා තියෙනවා නම් සමාන යෝජනාවක් ඒ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න බැහැ. ඒක මේ ඉන්න ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු දන්නවා. කියාස් මන්ත්‍රීතුමා බයිලා ගැහුවට ඇත්ත කතන්දරේ ඒකනේ. එක යෝජනාවක් දාලා තියෙනවානම් ඒ හා සමාන තව යෝජනාවක් දාන්න බැහැ. හැබැයි අන්න ඒ දැනුම් දීම මේ මන්ත්‍රීවරයාට කරානම් කිසි ගැටළුවක් වෙන්නේ නැහැ. දැනුම් දීම තුළ පොඩි ගැටළුවක් තමයි තියෙන්නේ. සමාන යෝජනා දෙකක් දාන්න බැහැ සභාවට. ඔබතුමා යෝජනාව කලින් දාලා තියෙනවානම් නැවත ඒ යෝජනාව වෙනත් මන්ත්‍රීවරයෙක්ට ගේන්න බැහැ න්‍යාය පත්‍රයට.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** මගේ නම කියලා දෙයක් කිවුවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා :-** ඔබතුමා මෙතන පැහැදිළි කරා මේ යෝජනාව දාපු නැති එකේ ප්‍රශ්නය තියෙන්නේ කියලා. ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් විදියට දන්නවා සමාන යෝජනා දෙකක් දාන්න බැහැ කියලා න්‍යාය පත්‍රයට. ඔබතුමා ඒක දැනුවත් කරන්න එපැයි. දන්නවානම් දැනුවත් කරන්න ඕන ඔබතුමා. බයිලා ගහන්න නෙමෙයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** මේ තිස්ස මන්ත්‍රීතුමා යෝජනා දැම්මේ නම් දාලා. ඒවා න්‍යාය පත්‍රයට දැම්මනේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා :-** මේ යෝජනාව දාන්න බැරි හේතුව තමයි සභාපතිතුමාගේ යෝජනාව කලින් දාලා තියෙනවා. එතකොට කොහොමද යෝජනාවක් ආයෙම දාන්නේ. තිස්ස මන්ත්‍රීතුමා දාන කොට සභාපතිතුමා යෝජනාවක් දාලා තිබුණේ නැහැනේ. ඔබතුමාලාගේ ආණ්ඩුව කාලේ කරේ කොහොමද කියලා අපි දන්නවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** මන්ත්‍රීතුමා මෙහෙමයි මම කිවුවේ. සාමාන්‍යයෙන් සභාවකට යෝජනාවක් නම් කරලා දාන්නේ නැහැ කියලා අපි දන්නවා. නමක් දාලා දාන්න බැහැ. ගැසට්

කරන්න ඕන. ගැසට් කරාට පස්සේ සම්මුඛ පරීක්ෂණයක් තියලා ගන්න ඕන. එහෙම නැතුව නමක් යෝජනා කරලා ගන්න කියලා කියන්න බැහැ. සභාපතිතුමා කරපු වැඩේ හරි. මෙතුමාගේ නම දුන්නේ නැති එක පිළිගන්නවා. නමුත් මෙතුමාගේ එක දානකොට නම් දාලා දාන්න පුලුවන්. එතුමාගේ එකට බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමාගේ වුණේ වෙනත් කාරණාවක්. මෙතුමාගේ කාරණාවයි ප්‍රියන්ත මන්ත්‍රීතුමාගේ කාරණාවයි දෙකක්.

(සභාව පැහැදිළි නොවීය)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** වාද කරලා යන එක තේරුමක් නැහැ. කම්කරුවෝ පස් දෙනෙක් බඳවා ගන්න යෝජනා කරලා තියෙන කොට ඒ අතරට මේ තරුණයාගේ නමත් මේ සම්මුඛ පරීක්ෂණය සඳහා ගන්න කියලා මම යෝජනාවක් හැටියට ඔබතුමාට කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් අයදුම් කරන්න කියන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එතකොට ඒ ප්‍රශ්නය ඉවරයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා සඳහන් කරපු කාරණාව ඉතාම කාලෝචිත කාරණයක්. ඒකේ ඇත්තටම මම අවංකවම පිළිගන්න කාරණාවක් තමයි ඒ බඳවා ගනිපු අය මුලින් ආපු විදියයි, මුලින් හැසිරුන විදියයි නෙමෙයි දැන්. ඒකට මම කලින් සඳහන් කරපු මූලික කාරණාව වෙලා තියෙන්නේ හරියට පරීක්ෂාවක් සිද්ධ වෙන්නේ නැති එක. ඒ අයගේ සේවය පිළිබඳව එකක්, අධීක්ෂණය සිද්ධ වෙන්නේ නැති එක තව එකක්.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඊයේ නරාවලට කවුරුවත් නැහැ සේවකයෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතන පරිපාලන පිළිබඳ ප්‍රශ්නයක් තියෙන්නේ. මම ඒක මෙතන කියන එකත් සුදුසු නැහැ. සභාව හින්දා නොකියත් හොඳ නැහැ. මොකද මාධ්‍යවල ගියොත් මේක හොඳ නැහැ. අපේ සේවකයෝ දෙන්නෙක් ඔය දහ දෙනාගෙන් දෙන්නෙක් අත්සන් කරලා තිබුණේ නැහැ. එක දවසක තව දෙන්නෙක් වෙනුවට වෙන දෙන්නෙක් අත්සන් කරලා තිබුණා. ඔන්න ඕකයි තත්ත්වය. ඒක හින්දා මම වහාම පරීක්ෂණයක් වෙනම කැඳවලා තියෙනවා. ඉතිං ඔන්න ඕකයි තත්ත්වය. ඒ වගේම මම ඉල්ලා සිටියා පරණ ඒවා, ආපු දවසේ ඉඳලා ඒක චෙක් කරලා මට ඕන කියලා අත්සන් හරියට. පැමිණීම පිටවීම චෙක් කරලා සම්පූර්ණ වාර්තාවක් ඉල්ලුවා මේ අය වැඩට ආපු දවසේ ඉඳගෙන. ඔන්න ඕකයි තත්ත්වය. ඒක හින්දා තමයි මම යෝජනා කරේ වැඩ පරිපාලක කෙනෙක් ගන්න. ඔන්න ඔය හේතුව හින්දා යෝජනා කලේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැනට ඉන්න වැඩ පරිපාලකට බලන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයාට තමයි වතුර බවුසර් ටික, එළියේ වැඩ යනකොට බලන්න කියලා තියෙන්නේ. ඊට පස්සේ මෝටර්, තණකොළ කපන මැෂින් බලන්න කියලා තියෙන්නෙත් එයාට. ඒ ඒ තියෙන වැඩත් එක්ක එයාට කියන්න බැහැ. කොහොම හරි එයාට තියෙන වැඩ එක්ක ඒක කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා මට විනාඩියක් අවස්ථාව ලබා දෙන්න. දැන් මේ කම්කරුවන් බඳවා ගන්න යද්දී මම දන්නෙත් නැහැ. මේ යෝජනාව ආවම තමයි දැක්කේ. හැබැයි ඊට කලින් මේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ යම් කිසි මතයක් ඇවිල්ලා තියෙනවා කම්කරුවෝ බඳවා ගන්නවා කියලා. දැන් අපෙනුත් ඇවිල්ලා ඉල්ලනවා රස්සාවක් දෙන්න කියලා. ප්‍රාදේශීය සභාවට කට්ටිය බඳවා ගන්නවලු. මම නම් දන්නේ නැහැ කියලා කිවුවා. මෙහෙම එනකොට එන ගැටළුව කියන්නේ. ඉතිං එතන්දී අපි අපහසුතාවයට පත් වෙනවා අලුතෙන් කම්කරුවෝ බඳවා ගන්න කොට. මොකද හේතුව අපෙන් ඇවිල්ලා අහනවා අපිටත් රස්සාවක් ගන්න පුලුවන්ද කියලා. අපි කියනවා පැහැදිළිවම නැහැ කියලා. නැහැ කිවුවට ඒ අය පිළිගන්නේ නැහැ. ඇතුලෙන් ගිහින් තියෙනවා ආරංචිය කම්කරුවෝ අලුතෙන් බඳවා ගන්නවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මම අහන ප්‍රශ්නයට උත්තරයක් දෙන්නකෝ. ඔබතුමාම තමයි යෝජනාව ගෙනාවේ මේ දෙක වෙන් කරන්න. මට දැන් මොකක්ද කරන්නේ කියන්නකෝ. දැන් අරහේ ඉන්නේ කම්කරුවෝ හය දෙනයි. මෙහේ ඉන්නේ හය දෙනයි. ඉතිං ඔතනින් හැමෝම හැමදාම වැඩට එන්නෙත් නැහැ. මුල් මාසේ එහෙම කෙරුණා. දැන් ඔබතුමාගෙන් මම ඉල්ලුවා ඊළඟ එකේදී අපි මේක නැවත වෙනස් කරමු කියලා. ප්‍රීමික්ස් කරන එකට ඒ අය දාන්න කියලා කිවුවා. ඒකටත් ඔබතුමා විරුද්ධ වුණා මේ විදියට කෙරෙන්න ඕන කියලා. එතකොට මම මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ៖-** දැන් හරි සභාපතිතුමා. එහෙම නම් හිතන්න, හිතලා මට කියන්න මේකේ ඉන්න මන්ත්‍රීවරු මම ඒ ගෙනාව යෝජනාව වැරදිද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** හැබැයි මෙහෙම එකකුත් තියෙනවා සුගත් මන්ත්‍රීතුමා. ඒ අතරට මළගෙවල් කියපු ගමන් මළගෙදරටත් දාන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ៖-** මොකටද මළගෙවල් වලට දාන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** එහෙමනම් කවුරුවත් මන්ත්‍රීවරු මගෙන් බලාපොරොත්තු වෙන්න එපා. ප්‍රීමික්ස් කතා බලාපොරොත්තු වෙන්න එපා. මළගෙවල් වුණාම කවුරුවත් කතා කරන්න එපා. නමුත් කතා කරනවානේ නැත්තේ නැහැනේ. ඔය කවුරු වුණත් කතා කරනවා. විපක්ෂයේ අයත් කතා කරලා කියනවා මළගෙයක් තියෙනවා දාන්න කියලා. මෙහෙමයි කිසි දෙයක් නොකර එහෙමනම් එහේ ඉන්න හය දෙනා එහෙට දාමු. මෙහේ ඉන්න හය දෙනා මෙහෙට දාමු. අනිත් ඒවා මුකුත් නොකර ඉමු. ප්‍රීමික්ස් මුකුත් නැහැ. එහෙමනම් ඒ මතයේ ඉමු. එහෙම දෙන්න ඕන නෑ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ៖-** වෙනදා අපිට මාසයකට එකයි ආවේ. දැන් අපිට මාසයකට හතර පාරක් එනවා. අපි සෑහිමකට පත් වෙනවා. දැන් යනවානේ මේක පැහැදිළිවම.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ៖-** මාසයකට එක සතියක් ප්‍රීමික්ස් ව්‍යාපෘතියට වෙන් කරොත් මදිද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ៖-** යෝජනාව සම්මත වුණානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** බැහැනේ. දවසක් යනවා අනන්න. දවසක් යනවා දාන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ៖-** ඔබතුමන්ලා මේවා හොයා බලන්නේ නැතුව ස්ථිර කරන්න යන්න එපා. මේක පොඩ්ඩක් සාකච්ඡාවට ඉඩ දෙන්න. අපිට මෙහෙමයි ප්‍රශ්නය තියෙන්නේ. අපි බෝපෙ පෝද්දල බලප්‍රදේශය තුළ ඡන්දය ඉල්ලන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** නැහැනේ. ඔබතුමා ඡන්දය ඉල්ලන්නේ කොට්ඨාශය තුළනේ. බලප්‍රදේශය තුළ නෙමෙයිනේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ៖-** එහෙමනම් ඒ රස්සාවල් පහ දෙනකොට මගේ කොට්ඨාශයටත් එකක් දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඉතිං එහෙම දෙන්න බැහැනේ. සම්මුඛ පරීක්ෂණයක් තියලනේ ගන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ៖-** ඇයි මම මෙච්චර සර්ව සාධාරණව කතා කරද්දි බැරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඉතිං ඔබතුමාගෙත් ඉන්න අයව එවන්න සම්මුඛ පරීක්ෂණයට.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ៖-** අපි දන්නවානේ සම්මුඛ පරීක්ෂණයට ආවම කරන්නේ කොහොමද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** එවන්නකෝ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ៖-** මේක ප්‍රායෝගිකව කෙරෙන විදියක් කතා කරමු. මම එහෙම කැමති නැහැ. එහෙමනම් වැඩිදුර යන එකක් නැහැ. මේ ඡන්දය ඉල්ලන්නේ එසේ මෙසේ අය නෙමෙයිනේ. යම් කිසි මොලයක් තියෙන අය ඉල්ලන්නේ. එහෙම නම් තේරුම් ගන්න පුලුවන් වේවි මේ ඉන්න විසි දෙදෙනාටම යන්නේ මොන පැත්තටද කියලා. මමත් මේ සභාවේ හිටියනේ කාලයක්. ඒක හින්දා අපිට ඉස්සරහ කාලයේදී දැන ගන්න පුළුවන් වේවි. ඒක නිසා තමයි කියන්නේ මෙවැනි යෝජනාවල් එනකොට සමස්තයක් විදියට බෙදලා විසි දෙදෙනාටම වුණත් කමක් නැහැ දෙන්න කියලා තමයි කියන්න ගියේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** හැබැයි සුගත් මන්ත්‍රීතුමා ඔහොම කතා කරන්න එපා. තේරුණාද, මේ දහය ගන්න කොට සභාපති විදියට මම අතඇරලා දහය ගත්තේ. ඒ විදියට කතා කරන්න එපා. මගෙන් දාපු කෙනෙක් කියන්න. ඔය විදියට කතා කරන්න එපා. එතකොට ඔය අය කිවුවේ නැහැනේ සභාපතිතුමා එකක් ගන්න කියලා. මගේ එක අත අරින්නම් කියලා කිවුවේ නැහැනේ කවුරුවත්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ៖-** ඉතිං 11 දෙනෙක් ගත්තානම් හරිනේ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඉතිං ඔබතුමාට එවෙලේ කියන්න තිබුණානේ දහයක් නෙමෙයි 11 ක් ගන්න කියලා. අසාධාරණ කතා කියන්න එපා සුගත් මන්ත්‍රීතුමා. දැන් ඔබතුමාම කියනවා මේකේ කොටස් දෙකකට බෙදලා දෙපැත්තට දාන්නලු. එතකොට ඔබතුමාම කියනවා මළගෙදරටත් ඕනලු. ඔබතුමාම කියනවා ප්‍රීමික්ස් එකත් කරන්න ඕනලු. ඉතිං මේ ඉන්න 12 දෙනාගෙන් වැඩට එන්නේ 8 ක් විතර. එතකොට 4 දෙනා ගානේ දෙපැත්තට දැම්මට පස්සේ කොහොමද වැඩක් කරන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ප්‍රීමික්ස් එක ගැන නම් මගේ පැහැදීමක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමාම කියලා තියෙනවා මේ සභාවේ ප්‍රීමික්ස් ව්‍යාපෘතිය හරියටම කෙරෙනවා ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා කියලා. මම පෙන්වන්නම් වාර්තා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** පහුගිය කාලයේ ඒක වුණේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමා තමයි ප්‍රීමික්ස් වලින් වැඩිම දෙයක් කරගෙන තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** පහුගිය කාලයේ ඒක වුණේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමා තමයි පහුගිය කාලයේ ප්‍රීමික්ස් වලින් වැඩිම වැඩ ප්‍රමාණය කරගෙන තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** හොඳ වැඩකට හොඳයි කියනවා මම. වැරදි දේට වැරදියි කියලා කියන්නෙත් මම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමා තමයි මේකට 50% ක් වගකියන්න ඕන ලේකම්තුමා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** අපි මේක නිරවුල් කරගෙන යමු කියලා මම ලේකම්තුමාටත් කියලා තියෙනවා. ප්‍රීමික්ස් ව්‍යාපෘතිය දැන් අපිට ගැලපෙන්නේ නැහැ. මේ පහුගිය දවසේ ප්‍රීමික්ස් දාපුවගේ දැන් කාපට් කරගෙන යනවා. ඒක වැරදියිනේ. මේ මහජනතාවගේ සල්ලි නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒකෙත් අඩුපාඩුව කාගේද, ඒකෙත් අඩුපාඩුව ඔබතුමාගේනේ. ඔබතුමාගේ පාරක් එහෙම කාපට් වෙනවානම් ඔබතුමානේ දන්නේ. තාක්ෂණ නිලධාරීන් දන්නේ නැහැනේ. එතකොට ඔබතුමා කියන්න ඕන මේ පාර ප්‍රීමික්ස් කරන්න එපා කියලා කාපට් වෙන හින්දා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** මගේ එහෙම වෙලා නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමාමනේ දැන් කියන්නේ. අපේ නම් එහෙම වෙලා නැහැ. අපේ ප්‍රීමික්ස් කරපු පාරවල් කාපට් වෙලා නැහැ. කොහෙද එහෙම වෙලා තියෙන්නේ කියන්නකෝ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ඒක තමයි කියන්නේ. මට මේ මිනිස්සු තරහ කර ගන්න බැහැනේ. දැන් කාටද ප්‍රීමික්ස් ටික දාලා තියෙන්නේ එතකොට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** කාගේවත් දාලා නැහැ ඔය කියන විදියට. එක පාරක්වත් බෝපෙ පෝද්දල ප්‍රීමික්ස් කරලා නැහැ මේ කියන විදියට.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** අපරාදෙනේ එතකොට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මේ කියන විදියට කරලා නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ඒක තමයි ප්‍රශ්නය. සාධාරණයක් කරලා මේ වැඩ කටයුතු කරන්න කියලා මාගේ ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මම ඉල්ලනවා ප්‍රීමික්ස් කරපු පාරවල් ටික ඊළඟ සභාවාරයට දෙන්න කියලා. එතකොට පෙනෙයි කාගෙද කරලා තියෙන්නේ කියලා. මම යෝජනා කරනවා. ඊළඟ සභාවට දෙන්නකෝ ප්‍රීමික්ස් කරපු ටික. එතකොට මම පෙන්වන්නම් කාගෙද කරලා තියෙන්නේ කියන එක. එතකොට පෙනෙයි සභාපතිතුමාගේ කොච්චර කරලද කියලා. ඔන්න එතකොට තත්ත්වය පෙනේවි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** බොහොම හොඳයි. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ කොට්ඨාශ 11 යි තියෙන්නේ. ඒ කොට්ඨාශ 11 ම ප්‍රීමික්ස් ව්‍යාපෘතිය කෙරිලා තියෙනවා. මගේ කොට්ඨාශයේ නැහැ. එතකොට අපිට ඒක බලාගන්න පුළුවන්. මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කියාස් මන්ත්‍රීතුමා කියන විදියට ඒක එතුමාගේ පුලුවන්කම. කෝටි ගාණක වැඩ කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි අපිට අමතකත් නැහැ කියාස් මන්ත්‍රීතුමා. ඔබතුමා බොහොම උජාරුවෙන් ඒක කියනවා. අපිට අමතකත් නැහැ. මුළු සභාවටම ආපු මුදල් එක කොට්ඨාශයකට විතරක් ගනිපු එක අපිට අමතකත් නැහැ. ඒක අමතකත් නැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක ආපහු පටන් ගන්න එපා. ඒක තේරුමක් නැහැ. ඊට පස්සේ ආපු යෝජනා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ෆයිසර් මුස්තාපා පළාත් පාලන ඇමතිවෙලා ඉන්න කොට බෝපෙ පෝද්දල පාරවල් වලට ආපු මුදල සම්පූර්ණයෙන්ම ගියේ කුරුඳුවත්තට. ඒක කවුරුත් දන්න කාරණාවක්. ඒක ඉතිං ඔබතුමාගේ හැකියාව. අපි නැහැයි කියන්නේ නැහැනේ. සභාව තිබුණෙත් නැහැ එතකොට. දැන් වැඩ කරන්නෙත් ඒ හැකියාවෙන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා නැවත ඒක මතුකරපු එක හොඳයි. ඇත්තටම ඒක මතුකරපු එක හොඳයි. ඇත්තටම ඒක ගැන තාක්ෂණ නිලධාරීනුත් ඉන්නවා අහන්න පුලුවන්. ගරු සභාපතිතුමනි මේ යෝජනාව ඉදිරිපත් කරන්න කියලා සියලුම බලප්‍රදේශ ආවරණය කරමින් කරන්න ලියුම් යවලා මාස ගාණක් තිස්සේ මේ සභාවෙන් ලියුම් ගිහිල්ලා තිබුණේ නැහැ. යෝජනා ගිහින් තිබුණේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම කියන්න එපා මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඊට පස්සේ නැවත ලියුම් යවන කොට කතා කරලා එහෙත් අල්ලගෙන මම කොළඹ ගිහිල්ලා ඒ ටික කර ගත්තා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලක්ෂ 20 ගාණේ ලක්ෂ 60 ක් තාක්ෂණ නිලධාරීන්ට ඇස්තමේන්තු හදන්න එවලා තිබුණා. ඒක දිස්ත්‍රික් ප්‍රධාන ඉංජිනේරු සම්පත් මහත්තයත් ඇවිල්ලා බලලා පරීක්ෂා කරලා තිබුණේ. නමුත් ඒක නෙමෙයිනේ කෙරුණේ. එතකොට ඒක කොහොමද වුණේ. ඒකට මොකක්ද තියෙන හැකියාව.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** හැකියාව කියන්නේ ඒකයි. හැකියාව මම කියන්නම්. පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ ඒ ලිපිගොනුව රඳවාගෙන හිටියා. ලිපිගොනුව ගියේ නැහැ. ලිපිගොනුව එහේ ඉඳලා කොළඹට ගිහිල්ලා නැහැ. කීප සැරයක්ම මම ගිහින් බලලා ඇවිල්ලා කිව්වා මේක යවලා නෑ කියලා. පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ තවම තියෙනවා කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට ඔබතුමා යවපු ලිපිගොනුව කවුද අනුමත කළේ. කවුද අත්සන් කළේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාවෙන් අනුමත කරේ. ඊට පස්සේ මම උත්සාහ කරලා අන්තිම මොහොතේ මම උනන්දු වෙලා මගේ ටික අරගෙන ගිහිල්ලා මම අනුමත කර ගෙන ආවා. ඒක මම අනුමත කර ගනිපු නිසා ඒක මගේ දක්ෂතාවය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපි පිළිගන්නවා. එතකොට කොට්ඨාශ තිබුණෙත් නැහැ. සභාවක් තිබුණෙත් නැහැ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මොනවා වුණත් එකක් තියෙනවා ඔබතුමා අමතක කරන්න එපා. ඊරිසියාවන්ත වෙන්නත් එපා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක මට අදාළ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමාට ලොකු ඊරිසියාවක් තියෙනවා. වෙන්න එපා එහෙම. අපේ මන්ත්‍රීවරයෙක්නේ. ඉස්සරහට ගියපු එක සන්තෝෂයි කියලා ඔබතුමාම කිව්වා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් පරද්දගෙන යන්න පුලුවන් වුණේ වෙන දෙයක් හින්දද, එතුමා කරපු වැඩ හින්දා. නිකං නෙමෙයිනේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒක එතුමාගේ දක්ෂතාවය. එතුමාට කප් එකක් දෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හොඳම කතාවක් තියෙනවා අහගන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මෙතුමා වොයිස්කට් එකක් දීලත් පාරවල් වලට සල්ලි ගත්තානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හරි. උදේ පාන්දර ගෙදරට ඇවිල්ලා රෙකෝඩ් කරගන්න සභාපතිතුමා කියලම එකකට අත්සන් කර ගෙන ගියා. ඒක හරි.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ඒකත් දක්ෂතාවය.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක ඇත්තටම මම අත්සන් කරපු එකක් නෙමෙයි. පරණ එකකට මම අත්සන් කරේ. අලුතෙන් එකක් ගැන මෙතුමා කතා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා දක්ෂයි. ඒ ගැන කියන්න දෙයක් නැහැ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**12.** පෝද්දල, නරාවල, කාසල්හිල්වත්තේ ඩී.ඩබ්. පර්සි මහතාගේ නිවස අසළ කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**13.** අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදුවන අවමඟුල් උත්සව සඳහා නොමිලේ ජල සම්පාදනය ලබාදීමට ලීටර් 1000 ජල ටැංකි දහයක් මිලදීගෙන ඒ සඳහා අධාරක (ස්ටැන්ඩ්) දහයක් සකස්කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** හොඳ යෝජනාවක්. නමුත් සභාපතිතුමා මගේ අදහසක් තියෙනවා. මේ සඳහා මිලදී ගන්නේ හතරැස් වතුර ටැංකිද, නැත්නම් සාමාන්‍ය වතුර ටැංකිද, හතරැස් වතුර ටැංකිත් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අර ගම් ටැංකි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** බද්දට දෙන තැන් වලත් තියෙනවා, නගර සභාවෙත් තියෙනවා හතරැස් වතුර ටැංකි. ඒ සඳහා මම හිතන්නේ තාක්ෂණ නිලධාරීනුත් එකඟ වෙයි. හතරැස් වතුර ටැංකි පාවිච්චි කිරීම, කල් පැවතීම හා ප්‍රවාහන පහසුකම් තියෙනවා. ඒ ගැන අවධානය යොමු කරවන්න කියලා ඉල්ලා සිටිනවා. ඒකට අවශ්‍ය කේෂින් එක, යකඩ ආවරණය යෙදීමත් පහසුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ හතරැස් ටැංකි කියන්නේ මම දන්න විදියට ගම් ටැංකි. මම වැරදිනම් නිවැරදි කරන්න. ඒ කොටු ටැංකි කියන්නේ ගම් ටැංකි මම හිතන්නේ. හාඩ්වෙයාර්වල වගේ තමයි ඒවා තියෙන්නේ. ඒවා විකුණන්න තියෙනවද කියලා මම දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** නගර සභාවෙත් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කෙමිකල් එන පාවිච්චි කරපු ටැංකි. සුදු පාට වටේ ප්‍රේම් එක ගහපු ටැංකි. ඒවා පාවිච්චියට නම් හොඳයි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** නගර සභාවෙන් විමසන්න. එහේ තියෙන්නෙත් ඒවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මිලදී ගන්න ක්‍රමවේදය මම දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒක අනුමත නිසානේ සභාපතිතුමා නගර සභාව පාවිච්චි කරන්නේ. ඒක ටිකක් හොයලා බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හොයලා බලලා අවශ්‍ය දෙයක් කරන්න.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ- 14.** පන්විලදූව වත්ත මාර්ගයේ කලින් පැවති පිටවාන අවහිරවී ඇති බැවින් නැවත මාර්ගය අයිනේ පැවති පිටවාන කපා සකස්කරන ලෙසට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මෙතනදී මතක් කරන්න ඕන ගරු සභාපතිතුමා පන්විලදූව වත්තේ කලින් තිබුණ පිටවාන, කාණු පද්ධතිය තිබුණා ඇළ දක්වාම ගැඹුරට. දැන් ඒ කාණු පද්ධතිය නැහැ. මොකද දැන් එතන වගා කටයුතු සිදු කිරීම නිසා. මම හිතන්නේ ඒක ඇළ දක්වාම දීර්ඝ විය යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මන්ත්‍රීතුමා අපි ගොවිජන සේවා එකට දන්වලා යවන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ- 15.** බෝගහවේල්ල මාර්ගයේ සහ වැලිකැටිය වත්ත මාර්ගයේ පැති බැම්ම බෝක්කුව සමඟ ඉදිකරන ලෙසට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මේක මම ගිය වර්ෂයේදීත් මහා සභාවට ඉදිරිපත් කරා. මොකද දැනට වැලිකැටිය වත්ත මාර්ගයේ ඒ පාරත් එක්කම තියෙන කොන්ක්‍රීට් බැම්ම කඩාගෙන යමින් පවතිනවා බර වාහන ගමන් කිරීම හේතුවෙන්. නාය යෑමේ අවධානමකට ලක් වෙලා එතන. ඒක හින්දා කණ්ඩිය කඩාගෙන යනවා. පාර ගිලා බහිමින් පවතිනවා. දැන් පහුගිය දවස්වල බෝගහවේල්ල මාර්ගය කාපට් කරා. එතකොට ඒ කාපට් කිරීමෙන් අනතුරුව ඔය වැලිකැටියවත්ත මාර්ගයේ ආරම්භය සනිටුහන්වන මාර්ගයේ කෙළවර ඒ අයගේ කාපට් කරන යන්ත්‍ර වලට විනාශ වුණා බෝක්කුව ගාව කොටසක්. කඩලම ගියා පාර අයින. තාමත් ඒ විදියටම තියෙනවා. මම ඒ පාර ගිහින් ඇහුවා ඇයි ඔයාලා එහෙම කරන්නේ මේකට මොකක්ද ගන්න ක්‍රියාමාර්ගය කියලා. ඒ පාර කිව්වා ඔයාලට ඕන නම් ඒක කොන්ක්‍රීට් දා ගන්න කියලා. ඉතිං දිගින් දිගට කතා කරාම ආරවුලක් ඇති වන නිසා මම වැඩිදුර එතනදී කතා කරේ නැහැ. මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඒ කරපු ක්‍රියාව වැරදියි. ඒකට විකල්පයක් තියෙන්න ඕන. මොකද එයාලගේ වාහන වලට තමයි වැලිකැටිය වත්ත මාර්ගයේ ආරම්භයේ ඇති බෝක්කුව කඩා ගෙන ගියේ.

ඊළඟට තව බෝගහවේල්ලේ කොටසක් කඩා ගෙන ගියා කාපට් ඇතිරීම නිසා. ඊට පස්සේ ඒ කාපට් ඇතිරීම නිසාම බට ලයින් එක විනාශ වෙලා පුපුරා යෑමෙන් වතුර ගලා බැස්සා දින දෙකක් විතර. ඒවත් මතක් කරන්න ඕන. තව දෙයක් ඔතනදී මතක් කරන්න ඕන. කාපට් එකේ වැඩ කටයුතු අධීක්ෂණය කරේ ගරු රමේෂ් පතිරණ මැතිතුමා. ඉතිං අපි ඒක අගය කරන්න ඕන. අර බෝගහවේල්ලේ ලාල් ගෙස්ට් හවුස් එකට ඉස්සරහ තියෙන ගෙදර මම හිතන්නේ ටෙක් එකේ ගුරුවරයෙක් ඉන්නේ. ඒ ගුරුවරයා කාපට් එක අතුරලා ඉවර වෙනවත් එක්කම අර පාර කැඩුවා. ඊට පස්සේ ජනතාව ගිහිල්ලා ප්‍රශ්න කරලා තිබුණා ඇයි ඔයා කැඩුවේ ඕක සම්පූර්ණයෙන්ම වැරදියි කියලා. කාපට් එක දාලා උණුසුම යන්නත් නැහැ එදා රෑම කඩනවා. මිනිස්සු ප්‍රශ්න කරා ඇයි මේ කඩන්නේ කියලා. මහජනතාවගේ සල්ලි මේවා. ඉතිං මේවා විනාශ කරන්නේ ඇයිද කියලා ඇහුවා. ඊට පස්සේ ඒ මනුස්සයා කිව්වේ මට ඉංජිනේරුතුමා උපදෙස් දුන්නා කියලා කඩලා දා ගන්න. ඉංජිනේරුතුමාගෙන් ඇහුවම කිව්වා මානුෂික හේතූන් මත මෙයාට මේක දාගන්න අවසරය දුන්නා කියලා. මානුෂික හේතූන් මත අවසරය ලබා දීපු එක අපි පිළිගන්නවා. ඒක සාධාරණයි. නමුත් ඒ ඒ.බී.සී දාලා තිබුණා. සති දෙකක් විතර ඒ පාර සකස් කරා. එතකොට එයාට කියන්න තිබුණා ගුරුවරයෙක් හැටියට, උගත් කෙනෙක් හැටියට මට මෙතන බටයක් දා ගන්න ඕන වතුර බස්සවන්න කියලා. ඒක හින්දා මට ඒකට අවසර දෙන්න කියලා පාර කඩන්න කලින් ක්‍රියාත්මක වෙන්න තිබුණා. මොකද කාපට් එකක් කරද්දි විශාල වියදමක් දරනවා. ඒ වියදම දරලා පාරේ ඔක්කොම කරලා ඉවර වුණාට පස්සේ කඩන එක සාධාරණද කියලා කියන්නකෝ. ඉංජිනේරුතුමත් දැන ගන්න ඕන මේක මීට කලින් මේවා කරලා ඒකට අනුමැතිය දෙන්න. අර මොහොතේ අනුමැතිය දුන්නම මිනිස්සුත් කුලප්පු වෙනවා. ඇයි මේ දාපු ගමන්ම මේ මනුස්සයා මේක කැඩුවේ කියලා. පුදන කොටම කාපි යකා වගේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දැන් නිවැරදි කරලා නැද්ද.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** දැන් එතන ගරු සභාපතිතුමා තවත් තාර ටිකක් යම්තම් දාලා තියෙනවා. වෙනස හොඳට තේරෙනවා. වාහනයක් යද්දි ගැප් එකක් වගේ තියෙනවා එතන. කැඩිච්ච තැන හරියට කාපට් එක වැටිලා නැහැ. මම හිතන්නේ ඔය වගේ පුද්ගලයෝ ඔය අතරේ ඉන්නවා කියන එක මතක් කරන්න ඕන. උගත් මෝඩයෝ.

ඊළඟට තව එකක් මතක් කරන්න ඕන ගරු සභාපතිතුමා. දැන් මෙතනදී මේ යෝජනාව තියෙනවා. බෝක්කුවත් එක්කම ඒ මාර්ගය ඉදිවෙන්න ඕන. ඒ ගල් බැම්ම කොන්ක්‍රීට් එක අභියසින් යන්නේ. ගල් බැම්ම අඩි 03 ක් විතර පළලට ඉදිවෙන්න ඕන. වාහනයක් ගිය ගමන් අරක තල්ලු වෙලා යනවා නැත්නම්. ආපහු ගිලා බැහීමේ අවධානමක් තියෙනවා. ඒක හින්දා වැලිකැටිය වත්ත මාර්ගයේ අවසානය දක්වාම ගල් බැම්ම අඩි 03 ක් හෝ අඩි 2½ ක් පළල සහිතව ඉදිකරන්න යෝජනා කරනවා. මීට කලින් අපේ තාක්ෂණ නිලධාරිතුමා එතනට ගිහින් බැලුවා. මම හිතන්නේ එතුමා අදහස් දක්වාවි කාරක සභාවක් කරොත්, මම හිතන්නේ තාක්ෂණ නිලධාරිතුමා කලින් ඇස්තමේන්තුවක් සකස් කරලා තියෙනවා මේකට. පොඩ්ඩක් ඒ ගැන අවධානය යොමු කරලා මේ ක්‍රියාව සිදු කරන්න කියලා ගරු සභාවෙන් මම කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ- 16.** සිරිධම්ම මාර්ගය වෙත වැරැල්ලානවත්ත හරහා මාර්ගයක් ප්‍රතිශ්ඨාපනය කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, දැන් සිරිධම්ම විද්‍යාලයේ අසලට යන පාරේ, ලබුදූව කරාපිටිය මාර්ගයේ අධික තදබදයක් තියෙනවා විශේෂයෙන්ම ඔය පාසල ආරම්භ වන කාලයේදී. උදේ 7 ඉඳන් 8 වගේ කාලය වෙනකම් අධික වාහන තදබදයක් තියෙනවා. මෝටර්සයිකල්, බස්, ත්‍රීවිල්, පාසල් වෑන් ආදී සියලු වාහන වලින් තදබදයක් එනවා. ඉතිං ගොඩක් වාහන ගොඩකන්ද දෙසින් එන ඒවත් තියෙනවා. ඉතිං මම කියන්නේ ඔය බෝගහවේල්ල, පන්විලදූව වත්ත මාර්ගයෙන් අපිට පුලුවන් පාරක් ගන්න කෙලින්ම සිරිධම්ම විද්‍යාලය අසලට වෙල් යාය අභියසින්. මම මේ ගුගල් මැප් එක හරහා ඒ සිතියම් ටික ලබා ගෙන තියෙනවා. ඒක මම සභාපතිතුමාට ලබා දෙන්නම්. මේකේ තියෙනවා ඒක පැහැදිළිව ගරු සභාපතිතුමනි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉඩම් අත්පත්කර ගැනීමක් කරන්න වෙනවානේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගොවිජන සේවා එක හරහා ඉඩම් අත්පත් කර ගන්න වෙනවා. වෙල්යායක් තියෙන්නේ. දැනටම මිනිස්සු කැමැත්ත දීලා තියෙනවා වෙල් යායෙන් ඉඩ දෙන්න. ඒ පාර ඉදිවන ප්‍රදේශය සිතියමේ දක්වලා තියෙනවා. සිරිධම්ම විද්‍යාලයට යන පාර, බෝගහවේල්ල පාර, ඉදිකිරීමට යෝජිත පාර පාටවලින් දක්වලා තියෙනවා. මම බ්‍රිලියන්ට් ක්‍රියේෂන්ස් ආයතනයට ස්තුතිවන්ත වෙනවා මේක සම්බන්ධ තොරතුරු මට ලබා දීම සම්බන්ධව. ඉතිං මම කියන්නේ මේක අපි හැමෝටම වැදගත් වෙනවා. ඒ පාර ඉදිවුණොත් ගොඩක් මාර්ග තදබදය අඩු වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මෙහෙම කරමු මන්ත්‍රීතුමා. සභා තීන්දුවක් අරගෙන යවමු සම්බන්ධීකරණ කමිටුවට දාන්න කියලා. එතකොට එතනින් පවරා ගැනීමේ කටයුතු කරලා දේවි. ඒ ඉදිරි කටයුතු වෙන්නේ ප්‍රාදේශීය ලේකම් හරහා. ඕකට අද සභා තීන්දු අරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොමු කරලා ඔබතුමා එතනින් ඒ අධීක්ෂණ කටයුතු සිදු කරන්න සම්බන්ධීකරණ කමිටුවට එනකම්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මම ඒක ඔබතුමාට යොමු කරවන්නම්. පැහැදිළිවම තියෙනවා සිතියමේ. අත්පත් කර ගන්න ඕන ඉඩම් සම්බන්ධව පැහැදිළිවම තියෙනවා වර්ණ ගන්වලා. ඒක මම ගරු සභාපතිතුමාට මේ අවස්ථාවේදී ලබා දීමට කටයුතු කරනවා.

එතකොට මම කියන්නේ ගරු සභාපතිතුමා මේක අපිට ගොඩක් ප්‍රයෝජනවත් වේවි පාර සැකසුණොත්. ඇත්තටම මහජනතාවට ලොකු සේවාවක් වේවි. වාහන තදබදය අඩු කර ගන්න අපිට මේක විකල්ප මාර්ගයක් විදියට භාවිතා කරන්න පුලුවන් වෙනවා. ඇළ මාර්ගයකුත් සම්බන්ධ වෙනවා මාර්ගය ඉදිකිරීමේදී මම හිතන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙනුත්, ගොවිජන සේවා එකෙනුත් අවසර ගන්න සිදු වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ලියනගේ මන්ත්‍රීතුමාගේ යෝජනා ටික මම ඉදිරිපත් කරන්නද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මම කල්පනා කරේ එහෙම නෙමෙයි දැන් එතුමා උළුවිටිකේ ඉස්කෝලේ වෙනත් කටයුත්තක ඉන්නේ. අපි අනිත් ටික කරලා එතුමා ආවොත් ගමු. නැත්නම් අන්තිමට ඒ යෝජනා ටික ගමු. එතුමාගේ අදහස මොකක්ද දන්නේ නැහැනේ යෝජනා ගැන.

<u>**ගරු මන්ත්‍රී යූ. එල්. තුසිත චාමින්ද මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී යූ. එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ- 29.** වක්වැල්ල පැලැදූව හරස් මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**30.** මැටිලියන්වත්ත අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ සම්බන්ධව මම තුසිත මන්ත්‍රීතුමා එක්කත් කතා කරා. සභාපතිතුමා එතන මාර්ගයේ බාගයක් කොන්ක්‍රීට් කරලා තියෙන්නේ. එතන වංගුව ගාව ඉඩමක ආරවුලක් තියෙනවා. ප්‍රශ්නය තියෙන්නේ ඒ දෙගොල්ලෝ ඉඩ දෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී යූ. එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** නන්දන මුදලාලිගේ කඩේ ගාවද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතන ඉන්නේ සෙනරත්. කඩේ එක්කෙනා. මම ඕක අවුරුදු දහයකට කලිනුත් උත්සාහ කරා. එකඟ වුණේ නැහැ. ඒ ගැටළුවට මොකද කරන්නේ තුසිත මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී යූ. එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** එතන පොඩ්ඩක් බලමු එහෙමනම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ. එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ- 31.** මැටිලියන්වත්ත පැතිබැම්ම හා මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ. එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ- 32.** මොල්ලිගොඩ ක්‍රසන්ට් මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ. එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ- 33.** දූවවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ වගේම සභාපතිතුමා දූව වත්ත මාර්ගය සංවර්ධනය කරන එක හොඳ යෝජනාවක්. දූව වත්ත මාර්ගය කොච්චර පිළිසකර කරන්න හැදුවත් පාර බැස්මකට ලක් වෙනවා. මොකද හේතුව ඒ ඉඩම ෆිනෑන්ස් එකෙන් අර ගනිද්දි පාර හදලා තියෙන්නේ ඉඩම අයිනේ තිබුණ උණ ගස් ටික දාලා. යට තියෙන්නේ උණ ලී. ඒක නිසා හැමදාම එන ගංවතුරට යටවෙනවා. හැම සභාවකින්ම මේ පාර සංවර්ධනය කරලා තියෙනවා. ඒ වුණාට කවදාවත් පාර හරියට දා ගන්න බැරි වෙලා තියෙනවා. තව එකක් තමයි දූව වත්ත මාර්ගයේ පළල දැන් තියෙනවාට වඩා ගොඩක් වැඩියි. අපි කලින් සභාවකදීත් ඒක කතා කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමිය එහෙම කියන්න එපා. ඔය දූව වත්ත මාර්ගය ගැන අබේසේකර මන්ත්‍රීතුමත් දන්නවා. ඉස්සර ඕකේ යන්නම බැහැ. පස් දාන්න දාන්න බහිනවා. නමුත් ඔය දැනට කරපු කොන්ක්‍රීට් එක, ඔය තියෙන කොන්ක්‍රීට් එකට අවුරුදු 14 ක් වෙනවා. 2006 දී කරේ. මම හිතන්නේ බෝපෙ පෝද්දල අවුරුදු 14 ක් තියෙන එකම කොන්ක්‍රීට් පාර ඒ දූව වත්ත පාර. ඒක හැම ජල ගැල්මකටම වතුරෙන් යටවෙනවා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** සභාපතිතුමා වරදවා වටහා ගන්න එපා. මම චෝදනාවක් නෙමෙයි එල්ල කරේ. සභාවක වරදක් නෙමෙයි මම කිව්වේ. ෆිනෑන්ස් එකෙන් ඔය ඉඩම ගනිද්දි ඔය පාරට හැමෝම පස් දැම්මා, කොන්ක්‍රීට් දැම්මා. කාලයක්ම තිබුණා ඔය පාර සංවර්ධනය කරමින්. නමුත් ඔය පාරේ බැස්මක් ඇති වෙන්නේ පාර යටට උණ ලී දාලා තියෙන නිසා පාර හදන්න කලින්. ඒක ෆිනෑන්ස් කරලා ඉඩම් විකුණන කාලයේදී කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමා දූව වත්ත කියලා යෝජනා කරලා තියෙන්නේ ඔය පාරද, ඇතුලේ ඉතුරු කොටසද.

**ගරු මන්ත්‍රී යූ. එල්. තුසිත චාමින්ද මැතිතුමා :-** ඉතුරු ටික.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය :-** ඒ කියන්නේ බන්දුසේන මහත්තයාලගේ නිවස ළඟින් යන පාර.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මන්ත්‍රීතුමිය දන්නවද, ඔය දූව වත්ත ප්‍රධාන මාර්ගය අවුරුදු 14 ක් වෙනවා හදලා. ඒ පාර කරේ කම්බි නෙට් එකක් දාලා. සම්පූර්ණ පාරේ කොන්ක්‍රීට් එක දැම්මේ කම්බි නෙට් එකත් එක්ක. ඒක හින්දා ඒ පාර බහින්නේ නැතුව තියෙන්නේ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය :-** කාලයක් යනකොට ඒ පාරේ තිබුණා මේ ගැටළුව. ඒක තමයි සභාපතිතුමාව දැනුවත් කරේ. උණ ලී තමයි දාලා තිබුණේ. ඊළඟට දෙවැනි පාරේ බන්දුසේන මහත්තයාලගේ නිවසට යන පාරේ නම් නඩුවක් තිබුණා. මැනුමක් කරලා ඒක වෙන් කරා. නමුත් මැනුම වැරදියි කියලා උසාවියේ නඩුව නැවත කැඳවන්න නම් කරලා තියෙනවා. යෝජනාව නම් හොඳයි ක්‍රියාත්මක කරනවා නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ. එල්. තුසිත චාමින්ද මැතිතුමා :- 34.** ආම්වේජ් මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට බාධා කරනවා නෙමෙයි. අපිට දැන් අද දවසේ දීලා තියෙනවා සභාවෙන් විස්තරයක්. ඒක ඉතාම නිවැරදිව ඇවිල්ලා තියෙනවා. අවුරුදු 05 සම්පූර්ණ නොවුන ෆිනෑන්ස් කොම්පැනි වලින් කරපු පාරවල් පිළිබඳ විස්තරයට මේ ආම්වේජ් පාර තියෙනවා. ඒ නිසා ඒක ඔබතුමා දැනට තාවකාලිකව අතහරින්න. අපි කවුරුත් එකතු වෙලා ෆයිට් කරපු ඒක වහාම ඒ ෆිනෑන්ස් කම්පැනි එකෙන් හදන්න කියලා කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මේ ෆිනෑන්ස් ඉඩමේ පාරක්ද,

**ගරු මන්ත්‍රී යූ. එල්. තුසිත චාමින්ද මැතිතුමා :-** හාඩ්වෙයාර් එක ගාව පාර.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒක ෆිනෑන්ස් එකට අයිති පාරක් නෙමෙයි. කොයි එකද මේ.

**ගරු මන්ත්‍රී යූ. එල්. තුසිත චාමින්ද මැතිතුමා :-** හාඩ්වෙයාර් එක ගාව පාර මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒක ෆිනෑන්ස් ඉඩමට අයිති නෑ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ. එල්. තුසිත චාමින්ද මැතිතුමා :- 35.** බිම්බිරිගොඩ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ. එල්. තුසිත චාමින්ද මැතිතුමා :- 36.** දීගොඩ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ. එල්. තුසිත චාමින්ද මැතිතුමා :- 37.** උක්වත්ත බටහිර ප්‍රජා ශාලාව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී යූ. එල්. තුසිත චාමින්ද මැතිතුමා :-** ඒක පින්තරු කරන්න යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, මගේ සහෝදර ගරු මන්ත්‍රීවරුනි, මටත් මගේ කොට්ඨාශය පිළිබඳව කතා කරන්න විනාඩි තුන හතරක වේලාවක් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, අද මට බොහොම සතුටු දිනයක්. මගේ කොට්ඨාශයේ ඊයේ කිලෝ මීටර් 01 ක් කාපට් කරලා අවසන් වුණා. ඒකට මගේ සභාවේ, කොට්ඨාශයේ මන්ත්‍රීවරයා විදියට මම ස්තුති කරන්න ඕන ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමාට. එතුමාගේ පියා මට විදුලි, වතුර හැම දේම ලබා දුන්නා මගේ කොට්ඨාශයේ මන්ත්‍රීවරයෙක් නොවුණ කාලේ. ඒ වගේම වෛද්‍ය රමේෂ් පතිරණ ඇමතිතුමා මට ප්‍රමුඛත්වය ලබා දුන්නා. බෝපෙ පෝද්දල ජනතාව වෙනුවෙන්, මගේ කලේගාන කොට්ඨාශයේ ජනතාව වෙනුවෙන් මම එතුමාට මගේ හෘදයාංගම ස්තුතිය පුද කරනවා.

ඊළඟට මම බලාපොරොත්තු වන්නේ මගේ අර කම්කරුවෙක් යෝජනා කරා අර දහදෙනාට. එයා මාස 04 ක් 05 ක් ඇවිල්ලා නැවතුණා. ඊළඟට තව කෙනෙක් යෝජනා කරා. එයත් ආවේ නැහැ. ඊට පස්සේ කෙනාව කැමැත්තෙන්ම සුගත් මන්ත්‍රීතුමා යෝජනාව ස්ථිර කරේ. මම අහන්න කැමතියි ඔබතුමා ඒක ගන්නවද, ඒ දහදෙනාට. මගේ කොට්ඨාශයේ එක් කෙනෙක් මේකට නියෝජනය වෙනවා. ඒ අවස්ථාව මට ලැබෙනවද, නැද්ද කියන එක මම දැන ගන්න කැමතියි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඕක හෙමින් බේර ගන්නකෝ. ඕක නීතියටම එකඟ නැති කාරණාවක්නේ.

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා :-** නීතියට අදාළ කාරණාවක් නෙමෙයිනේ. මගේ කලින් තිබුණ එකක්නේ. ගරු මන්ත්‍රීතුමා නම් දහයක් යවලා තමයි ඒක ගත්තේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා :-** ආයේ සම්මුඛ පරීක්ෂණයක් තියලා තමයි ගන්න ඕන.

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා :-** එදා දහදෙනාට තමයි මට දා ගන්න බැරි වුණේ. සහකාර එකක් නෙමෙයි මේ. කම්කරු එකක් ඒක. මැතිවරණය හින්දා ගන්න බැහැ කියලා කිවුවේ. දැන් මැතිවරණය ඉවරයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒක පළාත් පාලන කොමසාරිස්ගෙන් විමසන්නම්.

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා :-** ඒ රැකියා අවස්ථාව ලබා දෙන ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලනවා. මම ඇහුවම යැව්වා කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අනුමැතිය නැතුව එවලා තියෙනවා. ආයෙමත් එතුමත් එක්ක කතා කරන්නම්.

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා :-** හරි බොහොම ස්තුතියි.

ඊළඟට ගරු සභාපතිතුමා අර වටරැක නැගෙනහිර කොඩිතුවක්කු වත්ත කියලා එකක් තියෙනවා. අපි කැන්වසින් ගිය වෙලාවේ එතන කබානා එකක්ද, මොකක්ද එකක් හදලා තියෙනවා අර පාරට මායිම්ව. ඒ මොනවක්වත් මම දන්නේ නැහැ. මගේ කොට්ඨාශයේ මොකක් වුණාද කියලා මම දැනුවත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මොකක්ද.

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා :-** වටරැක නැගෙනහිර කොඩිතුවක්කු වත්තේ එහා කොනේ විදී ලාම්පු හතරක් විතර මම තමයි සවි කරේ. ඒකේ මොකක්ද එකක් ගහලා තියෙනවා. වැඩපලක්ද, කර්මාන්ත ශාලාවක්ද කියන එක මම දන්නේ නැහැ ගරු සභාපතිතුමා. මම දැනුවත් නැහැ මොකක්ද වුණේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අපෙන් අවසර අරගෙන තියෙනවද.

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා :-** මම දැනුවත් නැහැ මොකක්ද වෙන්නේ, කවුද කින්ද මන්ද කියන්න. කට්ටිය මගෙන් අහනවා. අපි දන්නෙත් නැහැ මොකක්ද කරන්නේ කියලා. බෝම්බ හදනවාද කියලා මිනිස්සු මගෙන් අහනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අන්න ඒක චුට්ටක් හොයලා බලන්න බෝම්බ හදනවද කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** මොකක්ද ඒ කතන්දරය. අපි දන්නෙත් නැහැ.

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා :-** අර කොඩිතුවක්කු වත්තේ ඔරලෝසු බාස්ගේ ඉඩම මේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක වෙන්දේසි කරනවා.

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** ලක්ෂ්මන් මහත්තයලාගේ ගෙවල් ඉස්සරහ තියෙන්නේ අර කොඩිතුවක්කු වත්ත කියලා. එකේ ගඟ අයිනේ විශාල බිල්ඩින් එකක් ගහන්නේ.

වී.සී. පාරේ ප්‍රශ්නයට දැන් පොලීසි ගිහිල්ලා සමථ මණ්ඩලයට දාලා ඒක දැන් නිරවුල් වෙලා තියෙනවා. ඒකට දැන් සභාවෙන් දෙන්න පුලුවන් විසඳුම මොකක්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සමථ මණ්ඩලයේ වාර්ථාව අපිට එවන්න.

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** දැන් නඩුවකට යන්න මෙහෙන් තීන්දුවක් හෝ ප්‍රකාශයක් ඒ අය ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි සභාවෙන් මේ වෙනකොට ගනිපු ටික දෙන්නම් මොකක්ද කියලා.

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** ඊට පස්සේ ගරු සභාපතිතුමා මම නියෝජනය කරන්නේ කැටයම් ශිල්පීන්ව. අතිගරු ජනාධිපතිතුමා හැමකෙනෙක්වම ගෙන්වලා සාකච්ඡා කරනවා. විසඳුම් දෙනවා. මගේ කොට්ඨාශයේ මාම්පිටිය, කලේගාන උතුර කියන ප්‍රදේශවල ඉන්න කැටයම් ශිල්පීන් බොහොම අසරණ තත්ත්වයක දැන් ඉන්නේ. මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන් අතිගරු ජනාධිපතිතුමාට මේ ගැන දන්වලා හෝ එතුමා මඟින් සාකච්ඡාවක් හෝ මොනයම් දෙයක් අපේ ශිල්පීන්ට ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**38.** හපුගල, බංගලාවත්ත මාර්ගයේ කුඹුර මැදින් ඇති කොටසේ පැති බැම්මක් ඉදිකර සංරක්ෂණය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** බංගලාවත්ත පාරේ බෝක්කුවක් තියෙනවා. ඒක කුඹුර පැත්තට කඩා ගෙන ගිහිල්ලා තියෙනවා. බැම්මක් ඉදිකරලා ඒක සංවර්ධනය කරලා දෙන්න කියලා යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ- 39.** නාගරුක්ඛාරාම මාර්ගයේ පදිංචි යූ.එච්. චම්පා මහතාගේ නිවසට ඉහලින් පිහිටි කන්දේ පවතින අනතුරුදායක ගල් කිහිපය වැසි දිනවලදී අවදානම් සහගත බැවින් එම ගල් ඉවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** මේකට සභාවට දක්වන්න පුලුවන් දේ හෝ වෙනත් ආයතනයකට දන්වලා ඔවුන්ට සාධාරණයක් ඉෂ්ඨ කරලා දෙන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

<u>ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 40.** බෝගහවේල්ල පාර සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා මහායාන බෞද්ධ ආයතනය දායකවෙමින් වංගු සහිත ස්ථානය (තම මධ්‍යස්ථානය ඉදිරිපිට) බිම් කොටස පරිත්‍යාග කිරීමටත්, කැඩීයන තාප්පය නැවත ගොඩනැගීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාදීමටත් එකඟවීමෙන් ප්‍රදේශයේ ජනතාවට කරන ලද පරිත්‍යාගය අගය කරමින් එම ආයතනයට ලිපියක් යැවිය යුතු යැයි යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මොකද ඒ මිනිස්සු බැලුවම ලක්ෂ ගාණක පරිත්‍යාගයක් කළේ. ඇත්තටම ලක්ෂ ගාණක් වටින ඉඩමක් මේක. වංගුවක් තියෙන ස්ථානයක් එතන තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම ගැටළුවක් තියෙනවා ඔතන. මම දකින දේ ඔතන අපිට මුලින්ම ඉල්ලීමක් කරලා තිබුණා ඒ ආයතනයේ ලියාපදිංචිය සඳහා. ඊට පස්සේ අපි කිව්වා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගෙන ඒ අනුව එන්න කියලා. ඊට පස්සේ බෝඩ් එකකට

ඉල්ලීමක් කරා. අපි බෝඩ් එකටත් ඒ උත්තරයම දුන්නා. අපි දැනුවත් වෙලා නැහැ දැනට එහෙම එකක් කෙරිලා කියලා. ඉතිං ඔය කාරණා තුන තියෙනවා. මහා සභාව තීන්දු කරන්න මොකක්ද කරන්න ඕන කියලා. එකක් ඒක අපේ අනුමැතිය ලබපු ආයතනයක් නෙමෙයි. ඒක පළවෙනි කාරණය. දෙවැනි කාරණය අපි දන්නේ නැහැ එහෙම දෙයක් වුණාද කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේ අය බොහොම පැහැදිළිව දුන්නා. මේකට සුගත් මන්ත්‍රීතුමා හා ලියනගේ මන්ත්‍රීතුමා මැදිහත් වුණා. ලියනගේ මන්ත්‍රීතුමාගේ යෝජනාවක් තියෙනවා ඒක ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳව. එතන ඒ තියෙන වංගුවත් එක්ක අපේ උදුල මන්ත්‍රීතුමා විශේෂයෙන්ම දන්නවා ඇති තමන්ගේ ප්‍රදේශයේ තියෙන ප්‍රශ්නය පිළිබඳව. අන්න එදාට ඒ කරන ශ්‍රමදානයටත් ඇවිල්ලා, ඒකට දායක වෙලා ඒ වැඩ ටික කරන්න. ඒක ඉතාම වටිනා ඉඩමක්. පේන්නේ නැති වංගුවක්, පටු වංගුවක් ඒක. ඉතිං මේකට මහායාන බැරිනම් දාගන්න ඕන ජාතියක නමක්. හැබැයි අමතක කරන්න එපා මේ ඇවිල්ලා තියෙන්නේ පොඩි සම්පතක්. මේකේ පළවෙනි කාරණය තියෙන්නේ මේ අය අරක්කු විකුණනවද, කුඩු විකුණනවද, ගංජා විකුණනවද, ආයුධ තියෙනවද, ඒවා තියෙනවානම් තමයි ප්‍රශ්නයක් වෙන්නේ. මේ මිනිස්සුන්ට එහෙම චෝදනාවක් නැහැ. එහෙම ආවොත් ඒක අපි එදාට කියනවා ඒ ආයතනයේ ඒවා නැවැත්වීමට කටයුතු කරන්න කියලා. හැබැයි අමතක කරන්න එපා මේ අය අද වෙනකොට වටිනා සම්පතක්. මේකේ වටිනාකම තේරුම් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ ඔබතුමා කියන එක හරි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** චෝදනා කරනවා නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කිවුවේ මම දකින දේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි සභාවේ කතා කරලා තීන්දුවක් ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕන තීන්දුවක් ගමු ප්‍රශ්නයක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කිවුවේ ඔබතුමාලට, අපිට, මේ සභාවට විශාල ප්‍රයෝජනයක් ගන්න පුලුවන් ආයතනයක් මේක. අද වෙනකොට බලන්න හයි කරනවා කුණු ප්‍රතිචක්‍රීකරණය කිරීමේ මැෂින් එකක් අලුත්ම ජපන් තාක්ෂණයත් එක්ක. පැයකට ටොන් එකක් පුච්චනවා. අළු විතරයි ඉතුරු වෙන්නේ. අළුවත් යන්නේ නැති වෙන්න පුච්චන්නේ. ඉතිං අපි ඇයි එක එක ඒවා බඳාගෙන ඉන්නේ. මේකට දාන්න හොඳ නමක් ඔබතුමාම යෝජනා කරන්න. නමක් යෝජනා කරලා ඒක යවන්න ඒ ආයතනයට. අපි මේ ආයතනයෙන් ප්‍රයෝජන ගමු. ඇත්තට එකක් තියෙනවා මේ ආයතනය එක්ක හරියට මුලින් වැඩ කරානම් අද ඔය පාර මේ මිනිස්සු ලවා කාපට් කරවගෙන මේ කාපට් එක වෙන පාරකට දාන්න තිබුණා. ඇත්ත කතාව ඒක. මේකේ ඇත්තටම මධ්‍යස්ථ තැනක ඉඳගෙන අපේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක් ගියා. මම නම් මේක දැකපු ගමන්ම කිවුවේ මේ මිනිස්සු ජපානයේ ගිහිල්ලා වඩින්න තියෙන තැන් ඔක්කොම වැඳලා මුදල් අරවා මේවා රටට ගේනවා. ගෙනල්ලා එහෙම වැඩ කරන ආයතනයකට අපි මෙහෙම නිග්‍රහ කරන්න යන එක නරකයි. වැරැද්දක් කරනවා නම්, සමාජ විරෝධී කටයුත්තක් කරනවා නම් අපි මේකට තදින් හැප්පෙමු. මන්ත්‍රීතුමා දැන් අද ඔබතුමාම මැදිහත් වෙන්න මේකට ගිහිල්ලා. මැදිහත් වෙලා ගන්න පුලුවන් උපරිම ප්‍රයෝජනය ගන්න. අද මේ රටේ ලොකුම ප්‍රශ්නය කුණු. හෙට අනිද්දා වෙනකොට මේ ප්‍රශ්නය ඉතා උග්‍ර වෙනවා. ඒ කියන්නේ මොන්රෝවියා වත්තේ දැනට ඇවිල්ලා තියෙනවා ප්‍රශ්නය. ඒක නිසා ඔබතුමන්ලා මේකට මැදිහත් වෙන්න. මම මේ යෝජනාව කරනවා. මොකද මේක බොහොම කෙටි දෙයක්. දීලා හෙට නැහැයි කියන්න නෙමෙයි. හෙට ගිහිල්ලා කඩන්න ඕන නම් කඩන්න පුලුවන් අපේ කම්කරුවෝ යොදවලා. මේ මන්ත්‍රී දෙපල ගිහින් මැදිහත් වුණා. චමින්ද මන්ත්‍රීතුමා ඔබතුමන්ලා සියලුදෙනාම යන්න මේකට. ගිහිල්ලා බලන්න. ඉතිං මම මේ යෝජනාව කරනවා. ඉස්සෙල්ලා යෝජනාවක් ආවම සාමාන්‍ය සිරිත තමයි ස්ථිර කරලා ඉවර වෙලා ඕන සාකච්ඡා කරන්න.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මටත් මේකට අදහසක් දක්වන්න ඕන ප්‍රදේශයේ ඉන්න පුද්ගලයෙක් හැටියට හා මන්ත්‍රීවරයෙක් හැටියට. මම හිතන්නේ අබේසේකර මන්ත්‍රීතුමාගේ යෝජනාව හොඳ යෝජනාවක්. නමුත් කිව යුතු කාරණාවක් තියෙනවා. ඔබතුමා කිවුවා වගේම තාම මේ ආයතනය නීත්‍යානුකූලව ලියාපදිංචිය සිදු කරලා නැහැ. ඒක මම වගකීමෙන් යුතුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඒකත් මතක් කරන්න ඕන. මොකද ඇත්තටම එතන අනතුරුදායක වංගුවක් තියෙන්නේ. මම හිතන්නේ ලියනගේ මන්ත්‍රීතුමත් ඉන්නවා අබේසේකර මන්ත්‍රීතුමත් ඉන්නවා. හොඳ යෝජනාවක් මේක. හොඳ දේට මම හොඳයි කියන්න ඕන. නරක දේට නරකයි කියලා කියන්න ඕන. නමුත් ඔතන ගැටළුවක් තියෙනවා. මම හිතන්නේ ඒ ඉඩමෙන් කොටසක් පරිත්‍යාග කරන එක ලොකු දෙයක්. එතන ඉඩමෙන් අරන් පාර පුළුල් වුණාම මිනිස්සුන්ට ලොකු සේවාවක් වෙනවා. යන එන මිනිස්සුන්ට පහසුයි. නමුත් එතන තව දුර්වලතාවයක් තියෙනවා සභාපතිතුමා. අර ඉස්සරහ ගෙදර සංවර්ධන ලොතරැයි විකුණන මනුස්සයෙක්

ඉන්නවා. වංගුව ගාව ගෙදර බද්දට ඉන්නේ. ආබාධිත පුද්ගලයෙක්. ආබාධිත පුද්ගලයෙක් වුණාට මිනිහාගේ තරුණ කාලයේ තිබුණ රෙස්පෙක්ට් පෙන්වාගෙන තාමත් අර සංවර්ධන ලොතරැයි විකුණන එයාගේ රථය එතන තියාගෙන ඉන්නේ පාරත් හරස් කර ගෙන. රෑටත් එහෙමයි. දවල්ටත් සමහර වෙලාවට පාර හරස් කර ගෙන වංගුව ගාව තියාගෙන ඉන්නවා. ඊළඟට මේ පැත්තෙන් එන වාහන වලට ප්‍රතිවිරුද්ධ දිශාවෙන් එන වාහන පේන්නේ නෑ කිසිසේත්ම. සමහර වෙලාවට වංගුවේදී අතන යන්නත් අමාරුයි අර පුද්ගලයා නිසා. ඒක අයින් කර ගන්න කිවුවම ඒ මනුස්සයා ඒ පාර කෑ ගහනවා එහෙම කොහොමද අරකයි මේකයි කියලා. ඒ කාරණයත් සමහර වෙලාවට වංගුවේදී බලපානවා. අනතුරු ගොඩක් සිද්ධ වෙච්ච තැනක් ඔතන. මෝටර් බයිසිකල් හැප්පෙනවා. වාහන හැප්පෙනවා. ඉතිං ඒක හින්දා මම හිතන්නේ අපේ සභාවක් වශයෙන් මේකටත් ක්‍රියාමාර්ගයක් ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඉස්සෙල්ලා මේ කාරණය ගැන කතා කරන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** මේ කාරණය සම්බන්ධයෙන් මම මේ මහායාන කියන එකේ නීත්‍යානුකූල පැත්ත ගැන කතා කරේ. පරිත්‍යාගය ගැන ඇත්තටම මම සන්තෝෂ වෙනවා. කවුරු පරිත්‍යාග කරත් මේකෙන් මහජනතාවට විශාල සේවයක් සිදු වෙනවා. මොකද මේ පාරේ වාහන ගමනා ගමනය සිදු වෙනවා. මිනිස්සු ගමන් කරනවා. පාරක් කියන දේ ඕන කෙනෙක්ගේ අවශ්‍යතාවයක්. ඒක හින්දා පාරක් පුළුල් වෙනවා කියන එකට අපි කවුරුත් සතුටු වෙන්න ඕන. ඒක හින්දා මම ඒක අගය කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒ වුණාට මෙතනදී මම දරණ මතය වෙනස් මතයක්. මේක වැරැද්දකට කියන කාරණාවක් නෙමෙයි. මේකේ ඉඩම දුන්නා නම් ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා සභාපතිවරයා විදියට. ඒකට සභාපතිවරයා විදියට ඒ අදාළ අයට ස්තුතිය පුද කරනවා. නමුත් සභාවේ නමින් මට මේක යවන්න බැහැ. අපිට ඒක ඉදිරිපත් කරලත් නැහැ ඒ අය අනුමත කර ගන්න. ඒක එකක්. අනිත් එක ඉඩම තියෙන්නේ කාගේ නමටද කියලා දන්නෙත් නැහැ. එහෙම ඒ ලේඛන ආවම තනි පුද්ගලයෙක් නම් එයාට ලිඛිතව යවන්න පුලුවන්. ඉඩමේ අයිතිකාරයාට ලිඛිතව යවන්න පුලුවන් ස්තුතිය පළ කරනවයි කියලා සභාව වෙනුවෙන් මෙහෙම ඉඩම දීම සම්බන්ධයෙන්. අපි අනුමත නොකරපු ආයතනයකට මේ ලිපියක් යවන්න හැකියාවක් නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** සභාපතිතුමනි, ඉඩමවත් ආයතන ගැනවත් කතා කරන්නේ නැහැ. මම යෝජනාවක් දාලා තියෙනවා ඒ යෝජනාව වෙලාවේදී මම කතා කරන්නම්. ඊට කලින් අබේසේකර මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉදිරිපත් කරපු නිසා මම කතා කරනවා. අපිට ඒ ආයතනය ගැන ප්‍රශ්නයක්වත් ඒක ලියාපදිංචි කරන එකවත් ප්‍රශ්නයක් නෙමෙයි. ඒක සභාවේ වගකීමක්වත් නෙමෙයි. ආගමික ආයතන ලියාපදිංචි කිරීම අපේ වගකීමක් නෙමෙයි.

එතන අනතුරුදායක වංගුවක් තියෙන නිසා අපි ගිහිල්ලා ඉල්ලීමක් කරා මාර්ගය කාපට් කර ගෙන යන හින්දා. අබේගුණවර්ධන මහත්මයාගෙන් ඉල්ලීම කරේ. අපිට ආයතනය ගැන කතා කරන්න කිසිම හේතුවක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ආයතනය නමින්නේ යෝජනාව ඇවිල්ලා තියෙන්නේ. ඒකනේ කතා කරන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** මහායාන ආගමික මධ්‍යස්ථානයට ඕන නැහැ. ඉඩම හිමි මහත්තයාට අපි සභාවෙන් යවමු. ඒ මහත්තයා ඉඩම මිල්දී අරගෙන තියෙන්නේ පර්චස් එකක් රුපියල් තුන් ලක්ෂ හැට දාහක් වෙන්න. පර්චස් එකහමාරකට වැඩි ප්‍රමාණයක් දැන් මේ ඉඩමෙන් ලබා දෙනවා. ඒ විතරක් නෙමෙයි අපිට කතා කරලා කිවුවා තාප්පය බැඳලා දෙන්න කියලා. අපි දෙවැනි වතාවේ ගිහින් කතා කරාම කිවුවා සභාවට අනුන්ගේ තාප්ප බැඳීමේ හැකියාවක් නැහැ කියලා. එහෙම නම් ගල්, වැලි, සිමෙන්ති ටික එතුමා දෙන්නම් කිවුවා. කම්කරු මහත්තයෙකුයි බාස් කෙනෙකුයි දාලා ඒ ටික කර ගන්න කියලා. ආයතනය නෙමෙයි ඒ මහත්මයා කාරුණික වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඉතිං ඒකයි මම කියන්නේ. ඒ අදාළ තොරතුරු ටික ඔබතුමාලා දෙන්න මට. අදාළ අයිතිකාරයොන්ට යවන්නම් ආයතනයේ නමට මට යවන්න බැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** ආයතනය හිමි මහත්තයාට අපි ලියුම දාමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** දැන් මෙතන යෝජනාව ඇවිල්ලා තියෙන්නේ වෙන එකක්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඒක නීත්‍යානුකූල නැති සංවිධානයක් කියලා කියන්න බැහැ. ඒක මේ රටේ පවතින නීත්‍යානුකූල සංවිධානයක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒක අපේ වගකීමකුත් නෙමෙයි. අනිත් එක සභාවක් හැටියට ලැජ්ජා වෙන්න ඕන වැඩක් එතන වෙලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ ආයතනය කලින් තිබුණේ බෙලිගහ හන්දියේ මාකෝ ෂෙඩ් එක ගාව. ඒ අය කරපු ලොකු සුභසාධන වැඩ ප්‍රමාණයක් තියෙනවා. මිනිස්සුන්ට උපකාර කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මිනිස්සුන්ට උපකාර කරන මුවාවෙන් වෙන වෙන දේවලුත් වෙන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වෙනවානම් කියන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒ ගැන හොයලා බලන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක ගෙනල්ලා දැන් අවුරුදු ගාණක් වෙනවානේ. මම කියන්නේ ඔබතුමාට තාම බැරිවුණාද හොයා ගන්නවත් මොනවා හරි මේ ආයතනය කරන වැරදි. හැබැයි අපිට පුලුවන් මේ ආයතනය කරන හොඳ කියන්න. මම දැන් එකක් කිවුවා. ඇත්තටම එකක් තියෙනවා. විවිධ රටවල් වලින් ඇවිල්ලා එන්.ජී.ඕ. තියෙනවා ඕන තරම්. ඒ එන්.ජී.ඕ. වලින් ගොඩක් වැඩ කරන එන්.ජී.ඕ. තියෙනවා. වැරදි විදියට කරන ඒවත් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් අබේසේකර මන්ත්‍රීතුමා මෙහෙම දෙයක් තියෙනවානේ. දැන් ඔය පිළිබඳව සභාවේ යෝජනාවක් ගෙනාපු පළියට අපිට කටයුතු කරන්න අමාරුයි. මම හේතුවත් කියන්නම්. ලියනගේ මන්ත්‍රීතුමා මේක අහන්න. දැන් මම ගියේ සිල්වගෙවත්තේ අර ප්‍රශ්නයට. ඒකත් ඔය වගේ ප්‍රශ්නයක්. ඉතිං මැනුමකින් තොරව අපිට කියන්න බැහැ පාරේ පළල මෙච්චරයි. මෙයා මෙච්චර දුන්නා කියලා. දැන් එතන ගල් වැට ගහලා තියෙන්නේ අවුරුදු 100 කට විතර කලින්. නමුත් ගමේ මිනිස්සු කියන්නේ ඒක පාරට අයිතියි කියලා. අයිතිකාරයා එකඟ වුණා හරි කමක් නැහැ ඔබතුමාට අවශ්‍ය ප්‍රමාණයෙන් කඩන්න කියලා. එතකොට මම දැන් ලියුමක් දානවද ස්තුති කරලා. මම අහන්නේ ඒ ප්‍රශ්නය. අනිත් තැන්වල පාරේ පළල ඊට වැඩියි. අතන පටුයි. නමුත් ඒ මනුස්සයා කිවුවා ඕන තරම් ප්‍රමාණයක් කඩා ගන්න කිසි ප්‍රශ්නයක් නැහැ කියලා. ගමේ මිනිස්සු කියන්නෙත් එයා අල්ලගෙන ඉන්නවා කියලා. එයා කියනවා ඕන තරම් කඩා ගන්න කියලා. එතන කොහොමද අපි කියන්නේ පාරේ පළල මනින්නේ නැතුව මෙයා මෙච්චර ප්‍රමාණයක් දුන්නා කියලා. නමුත් මේකේ තියෙන පොදු කාරණා ටික ඒක තමයි අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ගෙනාපු යෝජනාව ස්ථිර වෙලා තියෙනවා. මම තවත් ඕන නම් ඒකට සංශෝධනයක් ගේන්නම්. මේ ප්‍රමාණය කැඩුවට පස්සේ හරි ඒ ආයතනයට ස්තුති කරලා යවන්න. ඒක ආයතනයක්. පුද්ගලයෙක් නෙමෙයි. ආයතනයකින් ගන්න තීන්දුවකින් තමයි ඒ වැඩේ කෙරෙන්නේ. ඒක ආයතනයෙන් තීන්දු කරන කොට පුද්ගලයෙකුට යවලා වැඩක් නැහැනේ. ඒ හින්දා ඒක බලලා යවන්න. මේ යෝජනාව ස්ථිර කරලා තියෙනවා විරෝධයක් තියෙනවා නම් ඡන්දයකට යන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ආයතනය නමින් ලියුමක් යවන්න බැහැ කොහොමත්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම යෝජනාව ගෙනල්ලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා ඔය යෝජනාව අරගෙන බලද්දි අපි සභාවක් හැටියට දැඩිව ඉල්ලීමක් කරා. මුලින් ගිහින් නිකං කතා කරේ. ඊට පස්සේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම සම්බන්ධ වුණා පාර හදන වෙලාවේදී. ගිහිල්ලා බලන කොට ඒ නිවස ඉදිකරලා තියෙන්නේ එක්දහස් නමසිය ගණන් වල. උළු මාරු කරලා ෂීට් දාන වෙලාවේ ගඩොල් ජේලි දෙකක් උස්සලා වහල හදාගන්න මේවා කරලා තියෙනවා. මේක අනවසර ඉදිකිරීමක් කියලා වහාම කඩලා ඉවත් කරන්න කියලා ලියුමක් දාලා තියෙනවා ඔබතුමාගේ අත්සනින්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අන්න ඒකනේ. මම එහෙමත් ලියුමක් දාලා මම කොහොමද ස්තුති කරලා ලියුමක් දාන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ ආයතනයටත් දැම්මේ ඒ නමින්මද.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒ අළුත්වැඩියා කටයුතු සිදු කරන්න සභාවට දාලා අනුමත කරලත් නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අනුමත කරන්න ඕන නැහැ මන්ත්‍රීතුමා. ඕක එක්දහස් නමසිය හැත්ත ගණන්වල කරපු ඉදිකිරීමක්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මම ඔය නිවසේ හිටියා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** හිටිය හින්දා තමයි මම මේ කියන්නේ. කොයි කාලේද හැදුවේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** හරි ඔබතුමා කියන්න කොයිබ කාලෙද හැදුවේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එක්දහස් නමසිය හැත්තෑ ගණන් වල හදලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඔය ඉඩමේ පර්චස් 40 කට වැඩි ප්‍රමාණයක් තියෙනවා. ඔය නිවසේ කලින් හිටියේ අපි. ඔය නිවසේ ඉන්න කොට ලක්ෂ තුනහමාර ගාණේ ඔය ඉඩම ගන්න කියලා කිවුවා ගේත් එක්ක. එතකොට නඩු කටයුත්ත සිදු වෙමින් පවතිනවා. මොකද එහා පැත්තේ ඉඩමක් පවරා ගන්න නඩු කටයුත්ත තිබුණේ. ඊට පස්සේ ඒකේ නඩුවෙන් එයා දිනුවා. ඊට පස්සේ තමයි මේක විකුණලා තියෙන්නේ. ඉතිං ඇත්තටම ඕකෙන් ඒ අය කරපු යෝජනාව හොඳයි. මම ඒක අගය කරනවා. ඔබතුමා, අබේසේකර මන්ත්‍රීතුමා කිවුවා වගේ සේවාවක් කරනවා. නමුත් ඒ ආයතනයෙන් වෙන්නේ මොකක්ද,

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒක අපිට අදාළ නැහැ. අපිට අදාළ පාර වෙනුවෙන් ලබා දෙන භූමිය විතරයි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** අපි ඉස්සෙල්ලා එතනට විරෝධතාවයක් දක්වපු තැනක් නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔය මිනිස්සුන්ට කියලා ඒ පාර හදා ගන්න තිබුණා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මට ඒ කිසි දෙයක් අදාළ නැහැ. මට අදාළ ඒ වංගුව කෙලින් වීම පමණයි. මට මහායානද, ථේරවාද ද කියලා මට කිසිදෙයක් අදාළ නැහැ. අනතුරු සිදු වෙන වංගුවක්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඔබතුමා කියන එකට මම එකඟයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මට මහායාන අදාළත් නැහැ. ථේරවාදය අදාළත් නැහැ. මොකද අපේ හාමුදුරු කෙනෙක්ගෙන් ඕක ඉල්ලුවා නම් මායිම් කණුව තව චුට්ටක් මෙහායින් ඉන්දවාවි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** විවාදයකට එන්න ආරාධනා කරා ඔය මහායාන හාමුදුරුවන්ට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** විවාදයක් නෙමෙයි කරපු හොඳ දේ අගය කරන්න. ඒ දීපු සහයෝගයට ස්තුති කරන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒ අය දීපු දේට අපි සතුටු වෙන්න ඕන. ස්තුතිය පුද කරන්නත් ඕන. ලිඛිතව අවශ්‍ය වෙයි කියන එක තමයි අපිට තියෙන එකම කාරණාව. අපි ඒක තාම අත්පත් කර ගෙනවත් නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම යෝජනාව දාලා තියෙනවා වැඩේ කරන්න සභාවට. ඒ වැඩේ කරාට පස්සේ යවන්න. අපි කරන්න ඕන ඒක. අපිට ඒ මිනිස්සු ඉඩමක් දීලා, මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඒකේ තාප්පය කඩලා දාලා ගිහිල්ලා ඉවර වුණාට පස්සේ අපි මඟඅරින එක නෙමෙයිනේ කරන්න ඕන වැඩේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක මෙහෙමයි. ඕක අනුමත කරලා නැහැ දැන්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපිට ඕක අනුමත කරාද කියන එක අදාලම නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇයි අදාළ නැත්තේ අපිට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපි ඒ පුද්ගලයාගෙන් ඉඩම ඉල්ලුවා. ඒ පුද්ගලයාට ලියුම යවන්න. ආයතනයකින් අනුමත කිරීම අපිට අදාළ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා යෝජනාව බැලුවද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මගේ යෝජනාව අනුව මම කතා කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඒ යෝජනාව බලන්නකෝ. අනිත් එක අපි අනුමත කරත් අනුමත කරන්නේ නේවාසික භාවිතයට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපි ඉඩම දුන්නට ස්තුති කරනවා. ඉඩම දීපු තැනට අපි ස්තුති කිරීමක් කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමනේ. ඒක භාවිතයට තිබුණත් තියෙන්නේ නේවාසික භාවිතයටනේ. ඒක දැන් වෙනත් කාරණයකට භාවිතා කරන හින්දා ඒ අනුමැතිය වෙනස් වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපි ඒක ගැන කතා කරන්නෙම නැහැ. මහායාන ආගමවත්, ඒකවත් අපිට වැඩක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඔබතුමා එහෙමනම් ඉන්න පොඩ්ඩක්. මේ වෙන යෝජනාවක්නේ. ඒකෙදි කතා කරමු ඒක. ඒ යෝජනාව ස්ථිර වුණාට අපි අනිත් පසුබිම බලලා තමයි යවන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මගේ යෝජනාව ස්ථිර වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ස්ථිර වුණාට ඒ ආයතනයේ නමට කොහොමවත් යවන්න බැහැ. ඉඩමේ අයිතිය පිළිබඳව බලන්න ඕන. ඒ ආයතනයත් ලියාපදිංචි නැති එකේ යවන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි ආරවුලකට යන්න ඕන නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආරවුලකට නෙමෙයි මම කියන්නේ. අපි හිතමු ඒක ආයතනයක් කියලා. එහෙමනම් ඒ ආයතනය අඩුම ගණනේ අනුමත වෙන්න ඕන. නේවාසික භාවිතයට හරි තියෙන්න ඕන කලින් ඉඩම. මෙයා ගන්න කලින් ඒක නේවාසික භාවිතයට අනුමත වෙලා තිබුණා නම් ඒක නැවත වෙනස් කරන්න ඕන දැන් කරන ව්‍යාපාරයට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා ඕක මෙහෙමයි. ආයතනයට හෝ පුද්ගලයෙකුටනේ ඔප්පුව ලියලා තියෙන්නේ. ඒ පුද්ගලයාගේ ඉඩම දෙන්නේ. ඒ පුද්ගලයාට යවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඔය යෝජනාවල් දෙකක් නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ආයතනයෙන් දුන්නා නම් ආයතනයට යවන්න. අයිතිකාරයා දුන්නා නම් ඉඩම අයිතිකාරයාට යවන්න. ඉඩමේ හිමිකාරීත්වය ආයතනයේ නමින් තියෙනවා නම් ආයතනයට යවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය යෝජනාව සම්මත වුණත් අපි පරීක්ෂා කරලා බලලා අදාළ විදියට යවන්නේ. නැත්නම් අපිට බැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඉඩමේ හිමිකාරිත්වයට යවන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඕක සම්මත වුණාම අපි මේක බලලා යවනවා කියන එක මොකක්ද එකක් වගේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඔබතුමා මේක ගෙනාපු පලියට මම කොහොමද කරන්නේ කියලා කියන්නකෝ අනිත් අය. හේතුව තමයි අයිතිය තහවුරු කර ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අයිතිය තහවුරු කරගෙන කරාට පස්සේ තමයි යවන්නේ. පාර කැපුවට පස්සේ තමයි යවන්න කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අයිතිය පිළිබඳව බලන්න ඕන. ඒක එකක්. දෙවැනි කාරණය තමයි අපි මෙහෙන් ලිපි යවලා තියෙනවා අනවසරයෙන් ඉදිකරනවා නම් අනුමත කර ගන්න කියලා. ඒ තත්ත්වයත් බලන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ මනුස්සයා කරලා තියෙන දේ තමයි වහලේ ෂීට් මාරුකරන වෙලාවේදී ගඩොල් පේළි දෙකක් ඉස්සීම. ඒක අනුමත කරන්න ඕනද කියලා අහන්න. තාක්ෂණ නිලධාරි ඉන්නවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කුණුහරුපයක්නේ නිකං ඔබතුමත් නොදැන මේවා ගෙනල්ලා දුන්නම යැව්වම වෙන්නේ. අයියෝ මම නම් දන්නේ නැහැ කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කොහොම වුණත් හරි. මේ ගැටළුව පිළිබඳව තාක්ෂණ නිලධාරීට සභාව දැනුවත් කිරීම සඳහා මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**කාරක සභා අවස්ථාව.**

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරි දිනූෂ රත්නප්‍රිය මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- නේවාසික භාවිතයට යොදා ගන්නා ගොඩනැගිල්ලක් වෙනත් භාවිතයකට යොදා ගැනීමේදී ඉඩම හා ගොඩනැගිල්ල යන දෙකම ආගමික, වාණිජ හෝ කර්මාන්ත යන ඒවායින් එකකට අනුමත කර ගත යුතු බව.
- සැලසුම් අනුමත වූ පසු අදාළ ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කළ හැකි බව.
- මීට අමතරව මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධව ඇති ගැටළු සාකච්ඡා කරන ලදී.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නීත්‍යානුකූල තත්ත්වය හොයලා බලලා තමයි මම ලියුම යවන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතකොට ඉඩම ගන්න හම්බවෙන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ දැන් දීලානේ. දීලා වැඩේ කෙරිලානේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නැහැ. දීලා නැහැ. පවරගන්න එපැයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** වංගුව කෙලින් කරලා නැහැ. ඒ අයගේ තාප්පය කඩන්න ඕන අපි. කඩලා ඉවර වෙලා අපි තාප්පය බැඳලා දෙන්න ඕන එහායින්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් අපි සභා තීන්දුව ස්තුතිකරලා ගන්නේ ඇයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කරාම යවන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** තව යෝජනාවක් දාලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමාට මේක නෙමෙයි සභාපතිතුමා. ඔබතුමාගේ කාලේදී මේක ගෙනාවොතින්, වෙනත් වරප්‍රසාද ටිකක් ගෙනාවොතින් වටිනවානේ. ඒක වටින්නේ නැතුව ඔය විදියට කතා කරන්න එපා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එකඟතාවය අරගෙන ඉස්සෙල්ලා වැඩේ කරමු. ඒක කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් කතා කරන්නේ වෙන යෝජනාවක්නේ. මෙතුමා ස්තුතිකරලානේ ඉල්ලන්නේ. මේක කියවන්නම් ඕන නම් දැන ගන්න. පනතේ 29 වන වගන්තිය.

“ මංමාවත් හැරවීම හෝ ලොකු කිරීම හෝ සඳහා අවශ්‍ය ඉඩම් තෑගි වශයෙන් දීම.”,

“ හැරවීම, වෙනත් අතකට යොමු කිරීම, පුළුල් කිරීම, විවෘත කිරීම, ලොකු කිරීම හෝ යම් මංමාවතක් වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන්, යම් තැනැත්තෙකුගේ ඉඩමක් පොදු කාර්යයන් සඳහා ප්‍රාදේශීය සභාවට සන්තකය ලබා ගැනීමට අවශ්‍ය වූ විටක ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම්පාන තැනැත්තා ඒ කාර්යය සඳහා ඒ ඉඩම ප්‍රාදේශීය සභාවට තෑගි කිරීමට කැමතිනම්, සභාපතිවරයා හෝ ඔහු විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය පවරනු ලැබූ වෙනත් තැනැත්තෙකු ඉදිරියේ ඒ තැනැත්තා විසින් නිසි පරිදි අත්සන් කරන ලද ලියවිල්ලකින් වූ වාර්තාවක්, ඒ ඉඩම් ප්‍රාදේශීය සභාව වෙත සතු කිරීම සඳහා ප්‍රමාණවත් විය යුතුය. ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු සහ සාක්ෂිකරුවන් විසින් සහතික නොකිරීම යන වංචා වැළැක්වීමේ ආඥාපනතේ (2) වන වගන්තියේ අවශ්‍යතාවලට අනුව ක්‍රියා නොකිරීමේ හේතුව නිසා පමණක් ඒ වාර්තාව අවලංගු ලෙස හෝ නීතියෙහි ලා බල රහිත ලෙස හෝ සලකනු නොලැබිය යුතුය.”

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ එකඟතාවයට යන්න පුලුවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයාට අපිට ලිඛිතව දෙන්න කියන්නකෝ. ඊට පස්සේ අපිට එතනින් එහාට බලන්න පුලුවන්නේ. මේ මුකුත්ම නැතුව ස්තුති කරන්නේ මේ මහායාන මොකක්ද එකකට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම මේ යෝජනාවට සංශෝධනයක් ගේනවා මේ සිද්ධිය ක්‍රියාත්මක වුණාට පස්සේ කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අදාළ දේවල් සැලකිල්ලට අරගෙන අපිට ඉඩමේ අයිතිය ලියලා දීලා ඒ ආකාරයෙන් ගියාට පස්සේ බලමු. ඒ ගැන එතනින් එහාට පස්සේ සලකා බලමු. පනතේ තියෙන 29 වගන්තියේ විදියට කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** 29 හරි ලේසියිනේ ඉතිං.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම හිතුවා මේක කෙරිලයි කියලා. කරන්න කලින් ස්තුති කරන්නේ මේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක නිකං හැල්ලුවට ගන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ස්තුතියක් කරන්න ඕන වැඩේ කෙරිලා නම් නේ. මම ගරු මහ සභාවෙන් අහනවා මේක හැල්ලුවට ගැනීමක්ද කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකේ වටිනාකම විතරක් බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක හැල්ලුවට ගැනීමක්ද, වැඩේ වුණාට පස්සේ නේද ස්තුති කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හරි එහෙම කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමාගේ යෝජනාවට මම එකඟ වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ස්තුති කරන්න ඕන වැඩේ වුණාට පස්සේනේ. ඒ මුකුත්ම නැතුව ගෙනල්ලා හරියනවාද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් එහෙමනම් ඒවා පවරලා දෙනකම් ඊළඟට එන යෝජනාවත් ක්‍රියාත්මක කරන්නේ නැද්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බලමු ඒ යෝජනාවත්. තාම ඒක බැලුවේ නැහැනේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 41.** ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සහ පරිසර අධිකාරිය නිසියාකාරව තම රාජකාරිය ඉටු නොකිරීම නිසා පහුගිය කාලය තුළ බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ අනතුරු විශාල ප්‍රමාණයක් සිදුවී ඇති අතර ඉදිරි කාලයේදී භයානක අනතුරු සිදුවීමේ තත්ත්වයක් මතුව ඇත. මේ පිළිබඳව අද දින සභාවේ විශේෂ අවධානය යොමුකොට සභාවේ එකඟතාවයකින් වහාම පරීක්ෂණයක් සඳහා අවශ්‍ය යැයි හැඟෙන ආයතන වෙත යොමු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ කියන්නේ සභාව තීන්දු කරන්න මොකක්ද යවන්න ඕන ආයතනය කියලා. මේ කරපු වැරදි පිළිබඳව සාකච්ඡා කරන්න. පරීක්ෂණයක් කරන්න කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 42.** කාසල්හිල්වත්ත ගම්මානය, ප්‍රින්සස්විලා ගම්මානය, කැස්ටල්හිල් ගම්මානය ඇතුළු සියලු වෙන්දේසි ඉඩම්වල සියලුම මාර්ග ගැසට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒකට මනින්න අවශ්‍ය නැහැ. මැනලා තියෙන්නේ පාරවල්. ගැසට් කරන්න විතරයි මුදල් යන්නේ. ඒ කටයුතු කඩිනමින් කරන්න කියලා ඉල්ලීම කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෙන්දේසි ඉඩම්වල මිනින්දෝරුවාගේ ඔරිජිනල් ප්ලෑන් එක ඇතිනේ. ඒකේ පාරවල් වෙන වෙනම ගන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** බැරිනම් නරාවල ටික හරි කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 43.** ගල්වලගොඩ ගම්මානයේ මාර්ග සියල්ල මැනුම් කටයුතු සිදුකර අප ප්‍රාදේශීය සභාවට පවරා දෙන ලෙස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (එල්. ආර්. සී) වෙත ඉල්ලීම් කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒ අය කියලා තියෙනවා මැනලා දෙන්නම් කියලා. සභාවෙන් ඉල්ලීමක් කරන්න කියලා කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අධ්‍යක්ෂකතුමා එක්කත් කතා කරා. පර්චස් 20 කට වැඩි ප්‍රමාණයක් පොදු කටයුතු සඳහා පාර අයිනෙන්ම වෙන් කරලා දුන්නා කිවුවා සභාවට. අද මැන්නා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** පාරත් මැනලා දෙන්නම් කිවුවා. පාරත් මැන්නාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පාරේ කොටසක් විතරක් අද මැනලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඔක්කොම ටික කරල දෙන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 44.** නරාවල කාසල්හිල්වත්ත තරංගා මහත්මියගේ නිවසේ සිට පිට්ටනිය දක්වා කාණුව, පාර හරහා ඇති බෝක්කුව සමඟ සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණියගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ- 45.** ලබුදූව, කුරුන්ද කන්දේ ඉඩම් කැබලි අංක 75, 56, 58, 54, 59 යන මාර්ගය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදා කැපීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ- 46.** මොල්ලිගොඩවත්ත සුසාන භූමියේ සහ ඉහළ ප්‍රදේශවල සියලුම වැසි ජලය බැස යාමට බෝක්කු සකස්කර දීම රජය විසින් සිදුකර ඇත. නමුත් මෙම බෝක්කු මගින් ගලා යන ජලය ප්‍රදේශයේ පහළම ඉඩමේ පදිංචි ටී. ඒ. අනෝමා මහත්මියගේ ඉඩම මැදින් කුඹුර දක්වා ගලා බැසීමට මෙතෙක් විධිමත් වැඩපිළිවෙලක් යොදවා නොමැත. ඒ හේතුවෙන් මෙම පවුලේ අයට වර්ෂාව කාලයේදී මහත් පීඩනයක් ගෙනදෙන කරුණක් බවට පත්ව ඇත. මෙම ගැටලුව පිළිබඳව දිගින් දිගටම මොවුන් විසින් අප වෙත දන්වා සිටින අතර මේ පිළිබඳ අධීක්ෂණය කර නිසි වැඩපිළිවෙලක් සකස්කර ක්‍රමවත් ජලවහනයක් සැකසීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒකෙ සභාපතිතුමා ඒ අය විටින් විට ඔබතුමාට, රමේෂ් පතිරණ මැතිතුමාට, ලලින්ද ගමගේ අපේ හිටපු ප්‍රාදේශීය ලේකම්තුමාට, චානක මාදුගොඩ මැතිතුමාට, ඒ හැමෝටම යොමු කරපු ලියුම් තියෙනවා 2013 වර්ෂයේ ඉඳන්. ඉතිං මේ ගැන ඔබතුමාලා මොකක් හරි වැඩ පිළිවෙලක් යොදන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපි කීපපාරක්ම බැලුවා. ඒක ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුවට යොමු කරන්න කියලා මම තාක්ෂණ නිලධාරීට කිවුවා. ඒකේ මම හිතන්නේ අති විශාල මුදලක් වැය වෙනවා ඒ කාණු පද්ධතිය සකස් කරන්න. මීටර් 300 ක් පමණ දුරට කාණු පද්ධතිය ගෙනියන්න ඕන. ඒක සභාවට දැරිය නොහැකියි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මේකට ආපදා කළමනාකරණ එකට, ප්‍රාදේශීය ලේකම් එකට පවා ලියුම් යවලා තියෙනවා. දසනායක ලේකම්තුමිය පවා ආපදා කළමනාකරණ එකට ලියලා තියෙනවා. ලලින්ද ගමගේ මහත්තයා සභාවට එවලා තියෙනවා. ඒ ලිපිගොනුවත් මට ලබා දුන්නා. සභාවෙන් පොඩ්ඩක් ඒ ගැන හොයා බලන්න තමයි ඒ අය කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක සභාවට අයිති එක හරි. නමුත් අපිට ඒ සඳහා ලක්ෂ 20 ක විතර මුදලක් දරන්න බැහැ. එතනැයි ප්‍රශ්නය තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මහා ජල කඳක් එතනින් යනවා. ඔබතුමා දන්නවානේ. ඒ අයට සහනයක් දෙන්න. පොඩ්ඩ පොඩ්ඩ හරි කරලා දෙන්න. 2013 ඉඳන් කියන කතාවක් මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ- 47.** මීපාවල අමරසූරිය විද්‍යාලය ඉදිරිපිට ඇති පැණිදෙණිය මාර්ගය පුළුල් කිරීම සඳහා රුපියල් ලක්ෂ තිස්පහක පමණ මුදලක් අවශ්‍යව ඇති අතර රජයේ සංවර්ධන මුදල වන රුපියල් ලක්ෂ විස්සක මුදල මේ සඳහා යොදවන ලද අතර, 4304 අංක දරණ ඔප්පුවෙන් ප්‍රාදේශීය සභාවට පවරන ලද ඉඩමේ දැනට තිබෙන තාප්පය කඩා ඉවත්කර නැවත තාප්පය බැඳීම සඳහා යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේක ගියවරත් සභාගත කරා. යෝජනාවක් විදියට මට මේක ඉදිරිපත් කරන්න කියපු නිසා තමයි මේක යෝජනාවක් විදියට ඉදිරිපත් කරන්නේ. වසර 13 කට වැඩි කාලයක් මේකේ ගිවිසුම අත්සන් කරලා තියෙනවා. මේ මාර්ගය පුළුල් කිරීම සම්බන්ධව අමරදිවාකර මහත්මයාත්, ෆිනෑන්ස් ආයතනයත් එකග වෙලා සියලු ලිපි ලේඛන නිවැරදිව හදලා තියෙනවා. ඒ ලිපිගොනුව අස්ථානගත වෙලා තිබිලා තමයි මාස ගාණක් තිස්සේ හොයලා හොයා ගත්තේ. කෙසේ වෙතත් ඒකේ පර්චස් 10.3 ක් තියෙනවා. ඒක ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙක් ලවා සභාවට නීත්‍යානුකූලව පවරලා තියෙනවා. පාර පුළුල් කිරීම සඳහා 10% ක මුදලක් සභාවට ගෙවලා තියෙනවා. ඉඩම වෙන්දේසි කරන අය දිය යුතු මුදලක් ඒක. ඒක ගෙවලා තියෙනවා. ඊට අමතරව 1% ක මුදලකුත් සභාවට ගෙවලා තියෙනවා. එතකොට නීත්‍යානුකූලව පර්චස් 10.3 ක් අමරදිවාකර කියන මහත්මයාගෙන් මිලදී ගෙන ෆිනෑන්ස් ආයතනය සභාවට ඒක පවරලා තියෙනවා නීත්‍යානුකූලවම. එතකොට මේ පාර පළල් කරන්නට ලොකු ගල් වැටක් යන්න ඕන. අඩි 08 ක් විතර උසට තියෙන තැනුත් තියෙනවා. ලක්ෂ 40 කට ආසන්න මුදලක් මේකට වැය වෙනවා. ඒ වගේ මුදල් ප්‍රමාණයක් සභාවේ නැති නිසා මේ පහුගිය කාලයේ ගමට ආපු ලක්ෂ 20 සංවර්ධන යෝජනාවලියෙන් ලක්ෂ 33 ක පමණ මුදලක් ඒ සඳහා යොදවලා තියෙනවා දැනට ඒ ගල් වැටිය බැඳීම සඳහා. ඒකට එවකට සභාවේ ඒකමතික තීරණයක් වෙලා තියෙනවා මේ තාප්පය සකස් කරලා දීම කරලා දෙන්න කියලා සභාවෙන්. මුදල් නොගෙව්වත් සභාවෙන් කරලා දෙනවා කියලා තියෙනවා. ඒ යෝජනාවට එකගව තමයි මේ ෆිනෑන්ස් ආයතයෙන් මේ ඉඩම විකුණලා තියෙන්නේ. හැබැයි ඒක පවරලා තියෙන්නේ සභාවට පර්චස් 10.3 ක්. දැන් මේ වෙන කොට ඒ තාප්පය කඩලා පාර පුළුල් කිරීමේ කටයුතු කරගෙන යනවා. ලක්ෂ විසි හතහමාරක් දැනට යොදවලා තියෙනවා. ඒ ලක්ෂ විසිහතහමාරෙන් ඒ ක්‍රියාවලිය දැනට කර ගෙන යනවා. එතනදී මගේ යෝජනාවේ තිබුණේ මුදලක් වෙන් කරලා දෙන්න කියලා. ඒක වෙනස් කරලා මම යෝජනා කරේ. මේ තාප්පය බැඳ දීම සඳහා පොරොන්දු වූ පරිදි ඒකට යන පිරිවැය ඇස්තමේන්තු ගත මුදලක් තියෙනවා. ඒක තාක්ෂණ නිලධාරිතුමා ඔබතුමාට ලැබෙන්න සලස්වලා තියෙනවා. ඒක සභාවටත් ඉදිරිපත් කරලා තියෙනවා. අන්න ඒ තාප්පය බැඳීම සඳහා යන තක්සේරු මුදල සභා අරමුදලින් යොදවලා මේ තාප්පය බැඳලා දෙන්න කියන යෝජනාව මම සභාවට කරනවා. මොකද, ගම්මාන හතරකට භාවිතය සඳහා අමරසූරිය විද්‍යාලය ඉදිරිපිටින් තියෙන මාර්ගය මේක. ඉතාම පටු මාර්ගයක් මේක. අඩි 08 ක ප්‍රමාණයක් දැනට තියෙන්නේ. ඒක අඩි 15 ක ප්‍රමාණයක් දක්වා පළල් වෙනවා. අඩි 48 ක් විතර දිගට තාප්පය කැඩිලා බැඳෙන්න ඕන. ඒ තාප්පය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල මට මතක හැටියට රුපියල් හය ලක්ෂ පනස් දාහක්. ඒක සභා අරමුදලින් කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතනදී මම අදහසක් දක්වන්න ඕන ඒකට ඇත්තටම චමින්ද ගමගේ මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මේක ඇත්තටම යට ගිහිල්ලා තිබුණ කාරණයක්. විජේපාල මන්ත්‍රීතුමත් කිහිපපාරක්ම උත්සාහ දැරුවා මේ කටයුත්ත සිද්ධ කරන්න. නමුත් එතුමාටත් ඒකට

හැකියාවක් ලැබුණේ නැහැ. නමුත් ඔබතුමා මේකට පුද්ගලිකවම මැදිහත් වෙලා ඒ දරපු උත්සාහය තුළ තමයි අද ඒක වෙන්නේ. ඒ පාරේ යන්න බැහැ. මෝටර්සයිකල් එකකුයි ත්‍රීවිල් එකකුයි යන්න අමාරුයි. වාහනයක් ගියොත් මෝටර් සයිකලයක් යන්න බැහැ. ඒ වගේ පාරක්. ඔබතුමාට ඇත්තටම මන්ත්‍රීවරයෙක් විදියට මම සභාපතිවරයා විදියට ස්තුතිවන්ත වෙනවා. හේතුව තමයි ඔබතුමා පුද්ගලිකව අතැති මුදලින් තමයි මැනුම් කටයුතු සිදු කරේ. ඒ මිනින්දෝරු මහත්මයාටත් ඔබතුමාගේ පුද්ගලික මුදල් යෙදෙව්වේ. ඒක හින්දා ඔබතුමාගේ යෝජනාව පිළිබඳව මම ඇත්තටම මගේ සම්පූර්ණ අනුමැතිය පළ කරනවා. ඒක මුළු ගමකටම වෙන්න ඕන දෙයක් ඇත්තටම. ඕන කෙනෙක් ගිහින් බලන්න මන්ත්‍රීවරු විදියට. ඒක ඉතාමත්ම වැදගත් කාර්යයක්.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මතක් කරපු නිසා මම ඒක මතක් කරන්නම් මැනුම් කටයුතු සිදු කරන්න සභා අරමුදලින් මුදල් වෙන් කරන්න ප්‍රමාද වෙන නිසා මම ඒකට පුද්ගලිකව රුපියල් දහ අට දහස් පන්සීයක් ලබා දීලා මැනුම් කටයුතු සිදු කරේ. ඉක්මනින් මේක කරන්න ඕන නිසා එහෙම කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ ජේ.සී.බී. යන්ත්‍රය යොදවලා ඒ පාරේ පළල් කිරීමේ කටයුතු සිද්ධ කරා. දැන් තියෙන්නේ තාප්පය බඳින ගැටලුව විතරයි.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** ලක්ෂ විසි හතහමාරක මුදල වෙන තැනකට ගියොත් ඒක ආපසු මෙහා පැත්තට ගන්න බැහැ. ඒ නිසා බොහොම අවශ්‍යතාවයක් තියෙන නිසා කරේ. ඔබතුමා මතක් කරපු නිසා මම ඒක මතක් කරේ. නැත්නම් මම ඒක කිවුවේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ- 48.** මීපාවල අමරසූරිය විද්‍යාලය ඉදිරිපිට ඇති පැණිදෙණිය මාර්ගය පුළුල් කිරීමේ කටයුතු මේ වන විට ආරම්භකර ඇති අතර එහිදී විදුලි කණු හා දුරකථන කණු මාර්ගයෙන් ඉවත්කිරීම සිදුකළ යුතුය. ඒ සඳහා ලංකා විදුලි බල මණ්ඩලය හා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත ලිපි යැවීම සඳහා යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** විදුලි කණු සහ දුරකථන කණු සියල්ල මාර්ගයෙන් ඉවත් කරන්න ඕන දැන්. ඒ නිසා මම සභා යෝජනාවක් ගෙනාවේ. ඒක විදුලිබල මණ්ඩලයටත්, ටෙලිකොම් ආයතනයටත් සභා යෝජනාවක් විදියට යවන්න. අපිට හැකි ඉක්මනින් ඒ කණු ටික අයින් කරලා දෙන්න කියන ඉල්ලීම සභාවෙන් ඉල්ලනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වගේම මම මතක් වෙච්ච වෙලාවේ කියන්නේ. ලියනගේ මන්ත්‍රීතුමා ගොඩකන්දේ සංසරතන මාවතේ පාරක ටෙලිකොම් කණුවක් අයින් කරන්න එවලා තිබුණා සභාවේ ඉල්ලීමකට. රුපියල් දහ අට දහස් පන්සීයක්ද කොහෙද ඉල්ලලා තිබුණා. මම සභාවේ අනුමැතිය ඉල්ලනවා ලිඛිතව ඒ අයට දැනුම් දෙන්න අපිට මුදල් අය නොකර මේවා කරන්න. රාජ්‍ය ආයතනයක් විදියට අපි හැම සේවාවක්ම සපයනවා. අපි මුදල් දෙන්න ඕන නැහැ. ඒක හින්දා සභාවෙන් ඉල්ලීමක් කරන්න ඒකට. අපි කරන්නේ පොදු සේවයක්නේ. මින් ඉදිරියට අපි ඒ කණු ඉවත් කරන්න ලියුමක් යවනකොට අදාළ ආයතනවලට ඒ ලියුමේ සඳහන් කරන්න මේක පොදු කටයුත්තක් හින්දා මුදල් අයකිරීමකින් තොරව කරලා දෙන්න කියලා. නැත්නම් අපි මේකේ තියෙන මුදල් ටික දෙන්න ගියොත් කණු අයින් කරන ඒවාට වඩා අපිට වෙන වැඩක් කරන්න හම්බ වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** සභාවට මම යෝජනාවක් දාලා ඉල්ලීමක් කරා පන්විල මාර්ගයේත්, මාටින් පෙරේරා මාර්ගයෙත් කණු ඉවත් කරන්න කියලා. හැබැයි අද වෙනකොට ගිහිල්ලා බලන්න ලයිට් කණුවට කොන්ක්‍රීට් ටික හේත්තු කරලා කොන්ක්‍රීට් ටික දාලා තියෙනවා. අඟල් කිහිපයක් විතරයි කාණුවෙන් වතුර බහින්න ඉඩ තියෙන්නේ. විදුලිබල මණ්ඩලයට කතා කරා. එනවා කියලා ආවේ නැහැ අද වෙනතුරු. දැන් ඒ.බී.සී. ත් දැම්මා පාරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක බටදූවටද, ගාල්ලටද තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** බටදූවට. ඒ.බී.සී. දානවා පාරේ. හැබැයි කණු ඉවත් කිරීම කරේ නැහැ. දැන් කොන්ක්‍රීට් කරලා තියෙන්නේ කණුවත් අල්ලලා.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේ යෝජනා දෙක සම්මත වෙලා තියෙනවා. ඒකට ඔබතුමා ලිපි මාර්ගයෙන් ඉදිරිපත් කරලා හැකි ඉක්මනින් මට කටයුතු ටික සම්පාදනය කරලා දෙන්න කියලා ඉල්ලනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ- 49.** පෝද්දල කන්ද සුසාන භූමිය වටේ ආරක්ෂිත වැට සාදා අඩි හයක පමණ මාර්ගය පවිත්‍ර කර අනවශ්‍ය ගස් කපා ජනතාවගේ ප්‍රයෝජනයට යොමුකරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** මේ ළඟදිත් අඩුම තරමේ භූමදාන කටයුතු කරන්න ඉඩමක් නැතුව දඩල්ල ආදාහනාගාරයට තමයි අරගෙන ආවේ. ඒ නිසා ආදාහනාගාරය දැන් එතන ඉදිකරන්නේ නැහැ. සිට්ටුස්වත්තේ කෙරෙන්නේ. මේක රජයේ සුසානභූමියක් ලෙස සංවර්ධනය කරන්න කියන එක යෝජනාවක් විදියට කරනවා. ඔබතුමා මට එදා කිවුවා මේක යෝජනාවක් විදියට අරගෙන එන්න කියලා. දිගින් දිගටම කියනවා. ගරු සභාපතිතුමා මේක අනිවාර්යයෙන්ම කළ යුතු වැඩක්. මම හිතන්නේ තාක්ෂණ නිලධාරි මහත්තයා ගිහින් බැලුවා අනවශ්‍ය ගස් මොනවද කියලා. ඒක කපලා ඉවත් කරන්න. අඩි 04 ක 05 ක විතර පාරක් දැනට තියෙනවා. ඒක හොඳටම ප්‍රමාණවත් මෘත දේහයක් අරගෙන යන්න. වාහන නොගියට ප්‍රශ්නයක් නැහැ. මිනිස්සුන්ට ඒ අවශ්‍යතාවය තියෙනවා. ලිපි කිහිපයක් ඉදිරියේදී ඔබතුමාට හම්බ වේවි ගමේ ස්වෙච්ඡා සංවිධාන වලින්. ගරු සභාපතිතුමා බොහෝ දුරට ඔබතුමත්, ඇමතිතුමත් මේකට සම්බන්ධ කර ගත්තා. මගේ නම යන්නවත්, මගේ නම ප්‍රසිද්ධ කර ගන්නවත් කරන වැඩක් නෙමෙයි මේ. බොහෝ අයගේ අවශ්‍යතාවය තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ නම් මේකේ ගිහිල්ලා තියෙනවා ඕනවටත් වඩා.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** ඒ නිසා එකේ කිසි ගැටළුවක් නැහැ. මේකේ අවශ්‍යතාවයක් තියෙනවා. ස්වෙච්ඡා සංවිධාන වලින් ඉදිරියේදී ඔබතුමාට ලිපි ටික ඒවි. ස්වෙච්ඡා සංවිධාන වල ඉල්ලීම මේ. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව සතු සුසාන භූමිය මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් කාටවත් විරුද්ධ වෙන්න බැහැනේ. විරෝධතාකරුවන් පවා කිවුවේ ආදාහනාගාරයක් ඉදිකිරීමට විරුද්ධයි නමුත් සුසාන භූමියකට එකඟයි කියලා.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** ඒක කරන්න. ඒකවත් කරන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභා යෝජනාව ඇවිල්ලා තියෙනවානේ ඒක කරමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ ප්ලෑන් එක මමත් බැලුවා. ප්ලෑන් එකේ අපේ පාරට බද්දේගමින් තමයි ඇක්සස් තියෙන්නේ. බද්දේගමට තමයි ඒ කොටස අයිති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට තේරෙන්නේ නැහැ ඉන්දික මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාට තේරෙන්නේ නැති නිසා තමයි මම කිව්වේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආදාහනාගාරයට විරුද්ධ වුණානේ. අපි දැන් වෙන විකල්පයක් හොයලා ඒකට යනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ යන්නේ නිකං නෙමෙයි. ඒක ඔබතුමාට කියලා. අපිත් එවෙලේ කිවුවා යෝජනාවක් ඇවිල්ලා තියෙනවා කියලා. ගම් මට්ටමින් ඒක ගෙනිහින් දුන්නා. ඒ යෝජනාවට ඒක හදා ගන්න තමයි අපි විරුද්ධ වුණේ. අපි විරුද්ධ වුණේ පුද්ගලිකව නෙමෙයි. ගමේ මිනිස්සුන්ගේ විරුද්ධත්වය නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඒක සුසාන භූමියක් හරි කරන්න දෙන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක තමයි මමත් කියන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** ඒකට පාර ඔබතුමාගේ ඉඩමෙන් ඉල්ලන්නේ නැහැ. ඔබතුමා කලබල වෙන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තටම මෙතුමා මහජන නියෝජිතවරයෙක් කියලා මටනම් හිතෙන්නේ නැහැ. ඇත්ත කතාව.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මට කිසිම කලබලයක් නැහැ.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** ඔබතුමාට වැඩිය මේක ගැන මම හොයලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මාර්ගයක් තියෙනවා කිවුවට එහෙම මාර්ගයක් නැහැ. තියෙන මාර්ගය පාවිච්චි කරන්නේ නැහැ. මම කියන්නේ මේකට ඇක්සස් තියෙන්නේ බද්දේගමින්. පර්චස් 13 ක් තියෙනවා බද්දේගමට. පර්චස් 60 ගාණක් අපිට තියෙන්නේ. එකම රජයේ ඉඩම දෙපැත්තට තියෙන්නේ. ඒ ඉඩම මැදින් තමයි ප්‍රාදේශීය සභා දෙකේ මායිම තියෙන්නේ. එතකොට ඒකේ පිවිසුම තියෙන පැත්ත තියෙන්නේ බද්දේගමට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක තාක්ෂණ නිලධාරි බලලා ඒ අනුව කටයුතු කරන්නම්.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** රජයේ ඉඩම මනිනකොට මම ගියේ. අසේල මහත්තයාගේ කුස්සිය, නිවසේ පිටුපස තියෙන්නේ සභාවේ ඉඩමේ. සභාවේ ඉඩමට තමයි ඒක යොමු වෙලා තියෙන්නේ. එතුමා පොරොන්දු වුණා එතුමාගේ ඉඩමෙන් ඒ වෙනුවට පාර දෙනවා කියලා. ඊට වැඩිය දෙයක් අවශ්‍ය වන්නේ නැහැ. අපිට පාර හදා ගන්න තියෙන්නේ. නොකෙරෙන පැත්තට මොකක්ද කතාවක් කියනවා වගේ මන්ත්‍රීතුමා මේක. කොහොමහරි කරන්න උත්සාහ කරනවා මිසක හැමදාම කොක්ක දාන්න එපා ඔබතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරි මට වාර්තාවක් දෙන්න ඒ සම්බන්ධව. ඉවරයිනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේවට මැදිහත් වෙන්න කිසි ගැටළුවක් නැහැ.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** මම අහන්නේ ගරු සභාවෙන්, ගරු සභාපතිතුමාගෙන්, ලේකම්තුමාගෙන් මෙච්චරකල් ප්‍රාදේශීය සභාව සතුව තිබුණ සුසාන භූමිය කෝ. කොහෙද තියෙන්නේ. මට ඔබතුමන්ලා එහෙමනම් පෙන්වන්න. මේක ඇයි කරන්න දෙන්නේ නැත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බද්දේගම පාරෙන් හරි, ඉමදූවේ පාරේ හරි, පොලොන්නරුවෙන් හරි ඒකට පාරක් ඇතිනේ. කොහෙන් හරි තියෙන පාරක් අපි බලමුකෝ. බලලා ඕක සුසාන භූමිය කරමු. එච්චරයිනේ ඕන.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** දැන් අවුරුදු දෙකක් අවසන් වෙලා තියෙනවා. මගේ පළවෙනි සභාවේ යෝජනාව මේ. තව අවුරුදු දෙකයි තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊළඟ සභාව වෙනකොට මට තාක්ෂණ නිලධාරි වාර්තාවක් දෙන්න ඉඩම සම්බන්ධයෙන්. දළ සැලැස්ම ඇඳලා ඔබතුමා එක්ක සාකච්ඡා කරලා සභාගත කරන්න වාර්තාවක් දෙන්න.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** බොහොම කණගාටුයි කියන්න අපි මේ කතා කරලා යන ඒවා ගමේ මිනිස්සුන්ට වෙනත් ආකාරයකට කන්වලට දීලා ගමේ මිනිස්සුන්ව කුලප්පු කරවලා ඇයි මෙහෙම යන්නේ. අපි දේශපාලන වශයෙන් බේදීමක් නැතුව එකතු වෙලා වැඩ කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කලකිරෙන්න එපා මන්ත්‍රීතුමා. ඕකේ ප්‍රතිඵල දැන් ඇවිල්ලානේ තියෙන්නේ. ඔය ක්‍රමවේදයේ ප්‍රතිඵල දැන් පෙනිලා තියෙන්නේ. ඔබතුමා කලබල වෙන්න එපා.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** ඒක ස්වාභාවධර්මයා විසින් බලාගනීවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ- 50.** පැණිදෙණිය හේනවත්ත මාර්ගයේ අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** මේ පාර පුළුල් කිරීමට බාධා තියෙන්නේ හන්දියේ තියෙන අතුරු මාර්ගයක් නිසා. ඒක සංවර්ධනය කරන්න යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ- 51.** පැණිදෙණිය මාර්ගයේ අමල් මහතාගේ නිවස ඉදිරිපිට ඇති අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** ගෙවල් හතකට විතර යන මාර්ගයක් මේක. ඒක සංවර්ධනය කරන්න යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මොකක්ද.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** පැණිදෙණිය මාර්ගයේ අතුරු මාර්ග දෙකක් තියෙනවා. අමල් මහතාගේ නිවසට ඉස්සරහ පාර මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා සංවර්ධනය කරන්න කියලා කිවුවේ මොකක්ද.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම සඳහා යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පාරේ අය ඉල්ලන්නේ ඒක පළල් කරලා දෙන්න කියලානේ.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** මොන එකද ඔය කියන්නේ. මේ ගේ ඉස්සරහින් යන පාර. කැම උයන මල්ලිලගේ ගෙවල් පාර. ඒ පාරට නමක් නැහැ. අතුරු මාර්ගය කියලා තමයි සඳහන් කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇක්මන් අයියලගේ පුතා ඉන්න පාරද.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** ඒක නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඒ අය ඉල්ලන්නේ පළල් කරලා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** ඒ පාර නෙමෙයි මේ. ප්‍රධාන පාරෙන් දකුණු අත පැත්තට පල්ලමට තියෙන පාර මේ. මම ඔබතුමාට ඒක පෙන්වන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 52.** වටරැක නැගෙනහිර සහ වටරැක බටහිර යන ගම්මාන සම්බන්ධ කරමින් පිහිටා ඇති උස් ඒදණ්ඩ පාලම ඉතා අබලන් තත්ත්වයේ පවතින බැවින් එම පාලම සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** උස් ඒදණ්ඩ පාලම ඉතා අබලන් තත්ත්වයේ පවතින්නේ. යට කණු ඔක්කොම දිරලා තියෙන්නේ. පාලම කඩන් වැටෙන තත්ත්වයට පත් වෙලා තියෙනවා. මෙම පාලම සංවර්ධනය කිරීමට යෝජනා කරනවා. ඒක යෝජනා කරන කොට මම පැහැදිළිවම කියනවා ගාල්ල ආසනයත්, අක්මීමන ආසනයත් යන ආසන දෙක එකතුවෙන පාලම මේක. ඒ වගේමයි මේ පාලම වාහනයක් යන්න පුලුවන් තත්ත්වයට දියුණු කරොත් ඊට පස්සේ අපිට ගිංතොට ප්‍රධාන පාරට, කොළඹ පාරට සම්බන්ධ කරන්න පුලුවන් පාලමක් මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මට සම්බන්ධීකරණ කමිටුවට යනකොට ලකුණු කරලා දෙන්න. මේක මම කතා කරන්නම්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක බොහොම හොඳයි ගරු සභාපතිතුමනි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 53.** වටරැක බටහිර ඇළබඩ පාලම සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේකට මුල් ගල් තියන අවස්ථාවට සභාපතිතුමත්, මමත් ගියා. නමුත් මේ කාර්යය ඉෂ්ඨ වුණේ නැහැ. මේක ඒ කාලයේ පාලම හැදුවේ අවශ්‍යතාවය තියෙන හින්දා. දැන්

අද වෙන කොට ඒ පාර කාපට් වෙනවා. කාපට් වෙන අතරතුර මේ පාලම සංවර්ධනය කර ගන්න පුලුවන් වුණොත් ඒ ප්‍රදේශයේ ජනතාවට ඒක ඉතා වැදගත් වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක කියාස් මන්ත්‍රීතුමා ගිහින් මුල්ගල් තියපු එකක් නේද, සුද්ධ කරා මම හිතන්නේ පොඩ්ඩක් එච්චරයි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපරාදේ ඒ කාලේ රජයේ මුදල් වැය කරලා කරේ. රුපියල් පනස්දාහක විතර මුදලක් වැය වෙන්න ඇති මම හිතන්නේ. ටෙන්ට් එකක් ගහලා, ප්‍රාදේශීය ලේකම්තුමිය ඇවිල්ලා, වජිර අබේවර්ධන ඇමතිතුමා ඇවිල්ලා මුල් ගල් තිබ්බේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිත් ගියා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගියා කොහොම හරි උදවු කරලා මේ වැඩේ කර ගන්න ඕන කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙම කතා කරන එක වැරදියි. ඒ පාලම හදන්න පටන් ගත්තා. ගිවිසුම අත්සන් කරලා තියෙන්නේ. හොයලා බලලා වැඩ පටන් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගිවිසුම අත්සන් කරාට මුදල් නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** කියාස් මන්ත්‍රීතුමා කියනවානම් ගිවිසුම අත්සන් කරා කියලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීමක් කරන්න ලිපියක් යවලා ගිවිසුම් අත්සන් කරලා නම් වැඩේ කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලිඛිතව දැනුම් දෙන්න ඒ පාලමේ තත්ත්වය මොකක්ද කියලා වාර්තාවක් ඉල්ලලා. ගිවිසුම් අත්සන් කරලා තියෙනවද කියලා හොයලා බලලා අපිට වාර්තාවක් එවන්න කියලා කියන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තමයි ගිවිසුම් අත්සන් කරේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** වාරිමාර්ග එකෙන් කරේ. මම ඒක හොයලා කියන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකත් මට දෙන්න සම්බන්ධීකරණ කමිටුවට අරන් යන්න.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 54.** වැලිපිටිමෝදර සෝමාරාම පන්සල අසළ ඇති ඒ දණ්ඩ සහිත පාලම සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි පැහැදිළිව ඔය වැලිපිටිමෝදර කොට්ඨාශයේ බලාපොරොත්තු වෙන දෙයක් තියෙනවා. ඉදිරි කාලයේදී අපි මෙහෙන් ඒකට යෝජනා යවන්න ඕන ඒ ප්‍රදේශයේ සංචාරකයන්ට පහසුකම් ලබා දෙන පුරවරයක් බවට පත් කරන්න. එතකොට ඒ පාලම් ටික යටින් බෝට්ටුවක් යන්න පුලුවන් විදියට සකස් වෙන්න ඕන. ඒක සකස් වුණොත් තමයි අපිට හොඳ. ගිංතොට පාලම අසල සිට ඇලබඩ දක්වා මේ ඇළ එනවා. මේ ඇළයි, කැපූ ඇළයි දෙකම සම්බන්ධ වුණාම ඒක සංචාරක පුරවරයක් කරන්න පුලුවන් අවස්ථාව තියෙනවා. ඒක හින්දා මම ඒකට යෝජනා කරනවා මේ පාලම් තුනම සංවර්ධනය කරලා දෙන්න කියලා. ඒක ඉතා අත්‍යාවශ්‍ය කාරණයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 55.** බෝපෙ උතුර, එගොඩ කනත්තේ පිහිටා ඇති ප්‍රජා ශාලාව දෙමහල් ගොඩනැගිල්ලක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 56.** වැලිපිටිමෝදර කොට්ඨාශය තුළ අබලන් වූ වීදි පහන් 30ක් පමණ ඇති බැවින් ඒ සඳහා අලුතින් වීදි පහන් කට්ටල 30ක් මිලදීගෙන සවි කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ අවුරුද්දේ ප්‍රතිපාදන නෑ. ලක්ෂ 30 ඉවර කරලා තියෙන්නේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 57.** වැලිපිටිමෝදර අඹගහවත්ත පාරට හැරෙන තැන අනුෂ්කා මහත්මියගේ නිවස ඉදිරිපිට ඇති අප ප්‍රාදේශීය සභාවට අයත් පොදු නාන ළිඳ පිහිටි ඉඩම වටා ආරක්ෂිත වැටක් ඉදිකර අප ප්‍රාදේශීය සභාව සතු ඉඩමක් යනුවෙන් නාම පුවරුවක් සවිකරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ ළිඳේ ඉතා විශාල බිම් ප්‍රමාණයක් අපිට තියෙනවා. මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා මේ ප්‍රාදේශීය සභාවට අයත් පොදු නාන ළිඳ පිහිටි මෙම ඉඩම වටා ආරක්ෂිත වැටක් ඉදිකරන්න.

මේක ආදර්ශයක් විදියට කියනවා මෙතනදී. මේක අපිට ඉෂ්ඨ කර ගන්න පුළුවන් වුණොත් ගොඩක් වටිනවා. ඒ ප්‍රදේශයට ප්‍රජා ශාලාවක් නැහැ. ප්‍රජාශාලාවක් සාදා ගැනීම සඳහා ඒ ඉඩ ප්‍රමාණය අපිට ලබා ගන්න පුලුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනට පාවිච්චි කරන්නේ නැද්ද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** පාවිච්චි කරන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගමේ අයට ඉල්ලීමක් කරන්න කියන්න ඒ ළිඳ පාවිච්චි කරන්නේ නැහැ කියලා.

(ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ පාර බෝධිය ගාව ඉස්සරහට හදන්න ඇස්තමේන්තුවක් හදලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි ඇස්තමේන්තුවක් හදලා දෙන්නම් ඒක ප්‍රශ්නයක් නැහැ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 58.** අප ප්‍රාදේශීය සභාවේ දෛනික ගෙවීම් පදනම මත බඳවාගෙන දින 180 කට වඩා සේවය කොට ඇති සේවකයන්ගේ සේවය ස්ථිර කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලා සිටින ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ කාරණය මෙහෙමයි තියෙන්නේ. අපිට කම්කරුවන්ගේ හිත හොඳ කරොත් තමයි මේ අයගෙන් වැඩ ගන්න පුළුවන් වෙන්නේ. එම නිසා මෙම කාරණය ඉෂ්ඨ කරන්න කියලා කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට අපි අදාළ තොරතුරු පළාත් පාලන කොමසාරිස්ට යවලා තියෙන්නේ. චක්‍රලේඛනයක් ආවා. ඒකට උත්තර අපි යවලා තියෙන්නේ. එතන කීප දෙනෙක්ගේ ගැටළු කිහිපයක් තියෙනවා. සමහරු දින එකහමාර අඩුයි. එහෙම ඒවා තියෙනවා. අපි ඒවා සාධාරණීකරණය කරලා ඉල්ලුවා මේ මේ දේවල් කරලා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දැන් ගරු සභාපතිතුමනි එහෙමනම් ආපු අයගේ කාලය හරි ඇති නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම බැහැ. ඒ දිනයටනේ බලන්නේ. චක්‍රලේඛනයේ තියෙන දිනයට බලන්නේ. දැන් හරි කිවුවට හරියන්නේ නැහැ. තව ස්ථිර කරලත් දෙන්න ඕන හොර අත්සන් ගහන්න, පෙරවරු 11.30 වෙන කොට බූට් දෙක මෙතන ගෙනල්ලා දාලා යන්න වැඩ ඉවර කරලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේ ඔක්කොම ඇත්ත. නමුත් මම කියන්නේ මෙහෙමයි. මම මන්ත්‍රීවරයෙක් විදියට මගේ වැඩ ටික ඔවුන්ට කියලා කර ගන්නවා. ඉතිං ඒක හින්දා මම දන්නේ නැහැ කොතනද මෙතනදී වැරැද්ද වෙලා තියෙන්නේ කියලා. ඒ වැරැද්ද අනිත් අය නිවැරදි කරන්න. මගේ කටයුත්ත, මට වැඩ කරනවානම් එච්චරයි මට ඕන. මගේ කටයුතු ටික මම කරවා ගන්නවා. ඒ වෙනුවෙන් මම කතා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 17.** වාහන නවතා තැබීම නිසා හිරිඹුර ඇල්බට්බර්ග්ස් ඉඩමේ පදිංචිකරුවන් මුහුණපාන ගැටලුව විසඳීම සඳහා ''වාහන නැවැත්වීම තහනම්'' යනුවෙන් පුවරු සවිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේ ඉඩමේ, ඉඩම් කට්ටි හතක් තියෙනවා. ඒ නිසා වාහන නවතා තැබීම තහනම් කියලා පුවරු ගහන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 18.** ගොඩකන්ද රටඋළු ගෙදරවත්ත මාර්ගය ආරම්භයේ ඇති සිලින්ඩර් ගිලා බැසීම නිසා ජලය බැසයාමේ ගැටලුවක් පවතී. මෙම මාර්ගයට සිලින්ඩර් යොදා ජලය බැසයාමට සැලැස්වීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 19.** ආචාර්ය රිචඩ් පතිරණ විද්‍යාලයේ කඩා හැලෙන පැති බැම්ම හේතුවෙන් පාසලේ ගුරු නිවාසයට මෙන්ම යාබදව ඇති ඩී.ජී ලීලාවතී මහත්මියගේ නිවසටද විශාල හානියක් සිදුවිය හැකිය. මේ පිළිබඳව පරීක්ෂාකර බලා පැති බැම්මක් ඉදිකිරීමට මුදල් වෙන් කරවා දෙන මෙන් දකුණු පළාත් ආණ්ඩුකාරතුමා වෙත ඉල්ලා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 20.** වැලිකැටියවත්ත අතුරු මාර්ගයේ ජලය බැසයාම සඳහා සිලින්ඩර් යෙදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 21.** වැලිකැටියවත්ත ප්‍රධාන මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** වැලිකැටිය වත්ත ප්‍රධාන මාර්ගය කියන්නේ උදුල මන්ත්‍රීතුමාගේ ගේ ඉස්සරහ පාර. උදුල මන්ත්‍රීතුමාගේත් යෝජනාවක් මේකට තියෙනවා. ඇස්තමේන්තු අපි ඉක්මනට මොකක් හරි කර ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 22.** පැල්පොලවත්ත IV පටුමග සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 23.** කරාපිටිය, උන්නාන්සේ ලියද්ද අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේකටම කස්තූරි ලියද්ද කියලත් කියනවලු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 24.** කරාපිටිය සන්සයිඩ් ඉඩමේ ජලය බැසයන කාණුව සැකසීමටත් මැනුම් කටයුතු සිදුකර ගැටලු ඇත්නම් නීතිය ක්‍රියාත්මක කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමාට මේක මතක ඇති. දීර්ඝ කාලයක් තිස්සේ එහා පැත්තේ පාරට වතුර එන තැන මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කන්ද උඩ එකද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඔව්. මේක මැනුම් කටයුතු සිදු කරලා හරි මේ ගැටළුව විසඳන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට වාර්තාවක් අරගෙන පාර අල්ලගෙන නම් අපි නීතිය ක්‍රියාත්මක කරමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** පොඩි දුරක්නේ තියෙන්නේ. අල්ලගෙන නම් අපි නීතිය ක්‍රියාත්මක කරමු අඩි 15 ක 20 ක පාරක එක තැනක විතරක් අඩි 08 යි තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-25.** බෝගහවෙල්ල මාර්ගයේ අනතුරුදායක වංගුව අසල ආගමික මාධ්‍යස්ථානය සතු භූමියෙන් කොටසක් ඉඩම් හිමියන් ලබාදීමට එකඟව ඇති බැවින් ඉඩමේ ආරක්ෂිත තාප්පය ඉවත්කර මාර්ගයට කොටසක් පවරාගැනීමටත්, කඩා ඉවත්කරන ලද කොටසේ තාප්පය නැවත ඉදිකරදීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක පනතේ 29 වන වගන්තියට අනුව ඒ අදාළ විදියට පවරා ගෙන ඒ කටයුත්ත සිදු කරන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ විදියට කරන්න තමයි යෝජනාව දාලා තියෙන්නේ

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 26.** ආගමික මධ්‍යස්ථානය අසල අතුරු මාර්ගය සංවර්ධනය කිරීමටත්, ජලය බැසයන ආකරයට සිලින්ඩර යෙදීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

මේක විවේකාරාමය පාරද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මීපේ බාසුන්නහෙලගේ ගෙදරට යන පාර මේ. අපි ඒ පාර හදපු ගමන් වතුර ටික ඇවිල්ලා එතන මේවා වෙනවා. ඒක හින්දා සිලින්ඩරයක් දාන්න කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 27.** ජස්ටින්කන්ද ගම්මානයේ ජලය බැසයාමේ අවහිරතාවයන් නිසා නිවාස, පාරවල් පවා නායයෑමේ අවධානමට ලක්ව ඇත. මේ පිළිබඳව අදාළ ආයතනයන් දැනුවත් කළද මේ වනතෙක් කිසිදු විසඳුමක් ලැබී නැති බව පවසයි. අප ප්‍රාදේශීය සභාවටද ගැටලුව විසඳීමට තරම් ආර්ථික ශක්තියක් නොමැති හෙයින් සුදුසු වැඩපිළිවෙලක් සැකසීමට අතිගරු ජනාධිපතිතුමාව දැනුවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකත් මම සම්බන්ධීකරණ කමිටුවට දෙන යෝජනා වලට දාන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** වැඩපිළිවෙලක් හදමු ඒකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 28.** කුකුලගහ ඇළ මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කරදෙන මෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, පොඩි ප්‍රශ්නයක් තියෙනවා. සභාවේ ට්‍රැක්ටර් රථයක් අළුත්වැඩියා කරලා තියෙනවා. ඒකට රුපියල් දහනම දහස් ගාණක බිලක් තියෙනවා. කොරෝනා වසංගතය ආපු කාලයේ තමයි ඒක කරලා තියෙන්නේ. අදටත් ගෙවලා නැහැ කියලා මේක ටිකක් බලන්න කියලා සේවක මහතා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒ ගැටළුව සම්බන්ධව ලේකම්තුමාට සභාව දැනුවත් කිරීම සඳහා කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්. එච්. අනිල් රංජන් මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- මෙම ට්‍රැක්ටර් රථයේ ස්ටාටර් මෝටරයේ අළුත්වැඩියාවක් සිදු කළ යුතු බවට රියදුරු මහතා විසින් දැනුම් දීමෙන් පසු අප ප්‍රාදේශීය සභාවේ වාහන අළුත්වැඩියාව සිදු කරන ගරාජයක් වෙත ගොස් එම අළුත්වැඩියාව සිදු කර ගන්නා ලෙස දැනුම් දුන් බව.
- අදාළ අළුත්වැඩියාව සඳහා ගරාජය විසින් ඉල්ලුම් කරන ලද මුදල වැඩි බැවින් යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් එම මුදල සාධාරණීකරණය සිදු නොකරන බැවින් ගෙවීම් සිදු කිරීමේ කටයුතු පමා වී ඇති බව.
- අළුත්වැඩියාව නියමිත පරිදි සිදු කර ඇති නමුත් ඒ සඳහා වැය වූ බවට ඉල්ලුම් කරන මුදල වෙළඳපොල වටිනාකමට වඩා බොහෝ සෙයින් වැඩි බව.
- මීට අමතරව මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධව ඇති ගැටළු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා අර සභාවෙන් ලබා දීපු සිම්පත සම්බන්ධයෙන් මම මේ කතා කරන්නේ. මේකට දිගින් දිගටම බිල් ආවා. අදත් බිල් හම්බවුණා. අපි සිම්පත් ඔක්කොම භාර දීලා තියෙන්නේ. රුපියල් දෙදහස් ගාණක බිල් තියෙනවා මාසෙන් මාසයට හාරසීය ගාණේ එකතු වෙලා. ඉතිං මම මේක ගැන ඩයලොග් ආයතනයට දැනුම් දුන්නා. එතකොට කිව්වා සභාපතිතුමාට දැනුම් දීලා ලියුමක් එවන්න කියලා. අපි සිම්පත් ඔක්කොම භාර දීලා තිබුණත් තාම බිල් එනවා. ඒකට මොකක් හරි අපි නිසි ක්‍රියාමාර්ගයක් ගත්තොත් හොඳයි නේද ගරු සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට අදාළව පාවිච්චි කරන්නේ නැති අයගෙන් ලිඛිතව අරගෙන යවන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අත්සන් ගත්තානේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** අපි කලින් ලබා දුන්නානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය පරණ බිල් දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ දින දාලා එවලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවදද දිනය තියෙන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** 2020.03.16

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020.03.16 කියන්නේ පහුවෙලානේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** අපි පාවිච්චි කරේම නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ලියුම යැව්වේ කවදද, පාවිච්චි නොකරත් රෙන්ටල් එක එනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** දිගින් දිගටම බිල් එනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි දන්වා යවලා සිම්පත අවලංගු කරනකම් අපිට බිල එනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අපි සිම්පත භාර දුන්නානේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම ගත්තෙත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැත්තේ මොකද, ඔබතුමා මට කතා කරේ. මම අංකයත් කියන්නද, 076-0968789 ඔබතුමාගේ අංකය

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** වැරදියි. අන්තිමට 8790

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක හරි අංකය. ලේකම් මහත්තයාගේ අන්තිමට එන්නේ 89 ඔබතුමාගේ 90.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා තව එක කාරණයක් ගැන සඳහන් කරන්න ඕන. කරාපිටිය හන්දියේ ත්‍රීවිල් පාක් එක ගාව ඉඳන් ශ්‍රීධර ෆාමසිය, චන්ද්‍රපාල මුදලාලිගේ කඩය දක්වා වාහන පාර දෙපැත්තම අවහිර වෙන විදියට නවත්වනවා. එතන අනිත් වාහන වලට යන්න බැහැ. පාරේ යන මිනිස්සුන්ටත් අවහිරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ත්‍රීවිල් පාක් එක තියෙන්නේ කරාපිටිය පන්සල ඉස්සරහ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක පොඩ්ඩක් ලිඛිතව දෙන්න මම සම්බන්ධීකරණ කමිටුවේදී කතා කරන්නම්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒකට වාහන නවත්වන්න තහනම් කියලා පුවරුවක් ගැහුවානම් හරි.

<u>(ඊ) කාරක සභාවල වාර්තා</u>

<u>01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I 2020-09-08 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>02. තාක්ෂණික සේවා කමිටුව</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-09-08 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව</u> ඃ- නැත

<u>04. පරිසරය සහ පහසුකම් කමිටුව</u> ඃ- නැත

**(ඖ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ අගෝස්තු මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ අගෝස්තු මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ අගෝස්තු මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**04. වෙනත් ලේඛන ඃ- නැත**

**(ඖ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ සැප්තැම්බර් මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම ගියවර සභාවට ඉදිරිපත් කරපු අර මහවත්ත මාර්ගයේ නිවසක ගොඩනැගිලි ද්‍රව්‍ය සහ කොන්ක්‍රීට් කණුවක් තියලා පාර අවහිර කරලා තියෙනවා කියන කාරණාව කතා කරා. ඒ පිළිබඳව ලිඛිතව මට ඒ ප්‍රදේශවාසීන් දැනුම් දුන්නා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද දැම්මා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** දැම්මද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද අතු කපන්න යැව්වා. ලියුම යැව්වා අයින් කරන්න, නැත්නම් අපි පටවාගෙන එනවා කියලා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** පාර සුද්ධ කරන අය නම් මම එනකොට දැක්කා. බොහොම හොඳට කරනවා. ඊළඟට හික් ගහත් පොඩ්ඩක් බලන්න. හික් ගහ අයින් කරන්න. දරුණු හුළං එනවා හිටපු ගමන්. හික් ගහ බොහොම අවධානම් තත්ත්වයක තියෙන්නේ. පොලීසියේ සාජන් මහත්තයෙක් ඉන්නවා එයාලගේ ගේ පැත්තට තමයි ගහ බරවෙලා තියෙන්නේ. ඒක නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරවනවා මම. හරි බොහොම ස්තුතියි.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ සියලු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා පොඩ්ඩක් අවධානය යොමු කරන්න කියලා. මම හිතන්නේ අපි දිගින් දිගටම ඉල්ලපු බොහෝ දේවල් නොලැබිලා තිබුණත් කීපයක් දේවල් ලැබිලා තියෙනවා. ඒකට අපි ඒ නිලධාරීන්ට ස්තුතිකරනවා මොකක් වුණත්.

ගරු සභාපතිතුමනි, එම ප්‍රශ්නය කතා කිරීමට ඉස්සෙල්ලා කියන්න ඕන පහුගිය අයහපත් කාලගුණයත් එක්ක ඉතාම නරක විදියේ සිදුවීම් කිහිපයක්ම මේ ප්‍රදේශවල සිදු වුණා. ඉතිං ගස් කඩන් වැටුණා. නම් විදියට අපි සඳහන් නොකරත් ගස් කඩාගෙන වැටුණා. තාප්ප කඩාගෙන වැටුණා. හැබැයි මේ අනතුරු තවම පහවෙලා ගිහිල්ලා නැහැ. මොකද හේතුව අපිට මේකේ අත්දැකීම් තියෙනවා ගරු සභාපතිතුමනි. ඒක ඔබතුමාගේවත් කාගේවත් නෙමෙයි. මම දකින මේකේ බොහොම පැහැදිළි වැරැද්ද තියෙන්නේ කොහේවත් නෙමෙයි. පරිසර අධිකාරිය, පතල් හා භූ විද්‍යා එක, නාගරික සංවර්ධන අධිකාරිය. මේ ආයතන කරන වැරැද්ද නිසා අද සිදුවෙච්ච හානිය කියාගන්න බැරි තරම්. ඉස්සරහ කාලයේදී වෙන්න තියෙන හානිය ඉතාම ඉහළයි. පහුගිය දවසේ අපේ ඉන්දික විජයවික්‍රම මන්ත්‍රීතුමත් ගියා. මේ අවස්ථාවේ හිටියා නම් හොඳයි කියලා හිතෙනවා. ඔබතුමාලා අපි පොඩි කමිටුවක් පත්කරා මේ අනවසර ඉදිකිරීම්, ගොඩකිරීම් ඒ වගේම වෙන්දේසි ඉඩම්වල තියෙන අඩුපාඩු ගැන බලන්න. ඇත්ත වශයෙන්ම දිගින් දිගටම එන ප්‍රශ්න තමයි තියෙන්නේ. දිගින් දිගටම අපි කතා කරපු ප්‍රශ්න තමයි ගරු සභාපතිතුමනි තියෙන්නේ. ඒ කියන්නේ මිනිස්සුන්ට ඉඩම් ඕන. ඊළඟට සමහර මිනිස්සුන්ට සල්ලි ඕන නිසා ඉඩම් වෙන්දේසිකරුවන්ට දෙනවා. ඇත්තටම මම මේකට යෝජනාවකුත් එක්තරා අවස්ථාවකදී කරා. මේ ගරු මන්ත්‍රීතුමන්ලා අවධානය යොමු කරන්න. ඒ කියන්නේ කාටහරි සල්ලි ඕන වුණාම, තමන්ගේ දරුවෙක්ගේ ප්‍රශ්නයකදී හරි වෙනත් දෙයකදි හරි සල්ලි ඕන වුණාම තමන්ගේ තියෙන දෙයක් දෙන්න ඕන. මේකට විසඳුමක් තියෙන්න ඕන. නුසුදුසු ඉඩම් වෙන්දේසි කරලා තියෙනවා. මේකෙදි ඇත්තටම විසඳුමක් විදියට අපි සංවර්ධන කමිටුවට ලිඛිතව ඉදිරිපත් කරමු. දැන් උදාහරණයකට ගන්න ඇක්සස් එකේ ඉඩම. මේ ඕනම ඉඩමක් වෙන්දේසිකාරයෝ ගන්නේ වටිනාකමෙන් ⅓ ක මුදලකට. ලක්ෂ තුනක් යනවා නම් ⅓ ට තමයි වෙන්දේසිකාරයෙක් ගන්නේ. ඇත්තටම එක්කෝ මේකට රජයට මැදිහත් වෙන්න පුලුවන්. මැදිහත් වෙලා ඒ ඉඩම අරගෙන ඵලදායි විදියට සංවර්ධනය කරන්න පුලුවන්. කැලෑවක් වවන්න පුලුවන්. වෙනත් බෝගයක් වවන්න පුලුවන්. නැත්නම් සුදුසු ප්‍රමිතියට අඩුගාණේ නිවාස ව්‍යාපෘතියක් හදන්න පුලුවන් මධ්‍යම ප්‍රාන්තිකයන්ට. ඒ වගේ දේවල් වලට යොමු වෙන්න ඕන. ඉතිං මේ නිසා මම ඔබතුමන්ලාට යෝජනා කරනවා, බොහොම පැහැදිළිව දිගින් දිගටම මේක කියලත් තියෙනවා. අද වෙනකොට ගරු සභාපතිතුමනි ඉතිං මේක තමයි මේවායේ තත්ත්වය. ඇත්තටම ඔබතුමා නිදහස්. මේ ඉන්න නිලධාරීන් නිදහස්. මේකේ මේ අය නිවැරදිව වැඩ කරනවා නම් හරි.

ඊළඟට බොහොම පැහැදිළිව තේරුම් ගන්න ඕන දේ තමයි අපි මේවායේදී, මාර්ග සංවර්ධනයේදී අපි ඉඳගෙන කියනවා චාර්ටඩ් ඉංජිනියර්ගේ වාර්තාව තියෙනවා කියලා. මේක අමු කුණුහරුපයක්. මේක වැඩක් නැති වැඩක්. මේ තාක්ෂණ නිලධාරි මහත්වරු දන්නවා සාමාන්‍යයෙන් අපි පාරක් ඇස්තමේන්තු කරන කොට, පාරක් හදන කොට අඟල් හතරේ ගල් දානවා. අඟල් දෙකේ ගල් දානවා. එහෙම තමයි පාරක් හදන්නේ. ඔබතුමන්ලා ගිහින් බලන්න මේ හැම තැනකම පාරක් අවුරුදු පහක් තියා අවුරුද්දක්වත් තියෙන්නේ නැහැ. ගල් මතුවෙලා තියෙනවා. අඟල් දෙකේ ගල් දැම්ම සේද මාවත වගේ හැදුවා. ඉඩම් ටික විකිණුවා. ඊට පස්සේ උදාහරණයකට වටරැක නම් සුගත් මන්ත්‍රීතුමාට කියාවි. අහිංසක අපේ තුසිත මන්ත්‍රීතුමාට කියාවි අනේ මෙන්න මේ පාර කැඩිලා තියෙනවා කියලා. ඊට පස්සේ ඡන්ද දායකයොනේ, මේ අය කියනවා පාර හදලා දෙන්න කියලා.

ඊළඟට ඇත්තටම සම්ප්‍රදායික ගම්මානයට, මේ අලුතෙන් නිර්මාණය වන ගම්මානයෙන් හානියක් වෙන්න බැහැ. අද යන්න වටරැක පැත්තට. ගන්නම දෙයක් නැහැ. අද යන්න බටුවන්තුඩාවට ගන්නම දෙයක් නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි මම ඉස්සෙල්ලම කියනවා ඔබතුමාට අපේ සභාවක් නැතුව නාගරික සංවර්ධන අධිකාරිය අවසර දුන්නා අර ජලසම්පාදන මණ්ඩලයේ වතුර ටැංකිය ගාව ඉඩමට. ඉතිං මම මේක දිගින් දිගටම කියලා තියෙනවා. නමුත් එකක් තියෙනවා මේක නැවතත් කියන්න ඕන එකක්. ඒ කියන්නේ ගරු සභාපතිතුමනි මම ඔබතුමාට මේක පෞද්ගලිකවත් පෙන්නුවා. අඩුම තරමින් නාගරික සංවර්ධන අධිකාරිය පරිසර අධිකාරියේ අවසරයක්වත් නැතුව තමයි දීලා තියෙන්නේ රොස්වුඩ් එකට අනුමැතිය. රොස්වුඩ් එකේ ඒ ඉඩමට පරිසර බලපත්‍රයක් අනවශ්‍ය නම්, එහෙම නම් මේ දකුණු පළාතේ බෝපෙ පෝද්දල නම් විශේෂයෙන් පරිසර බලපත්‍රයක් අවශ්‍ය කිසිම තැනක් නැහැ. මේ ඉඩමේම අනිත් පැත්තට පරිසර බලපත්‍රය තියෙනවා. මේකේ ඊටත් වැඩිය නරක පිහිටීමක් තියෙන්නේ. මේක තරංගා ලැන්ඩ් සේල් කොම්පැනිය කරේ. මේකේ කරලා තියෙන දේවල් මම මීට ඉස්සෙල්ලත් ඔබතුමන්ලාට පෙන්නුවා. මේකට විරෝධය පාලා කරන එක සභාපතිතුමාටවත්, සභාවටවත්, වෙන කාටහරිවත් විරුද්ධව කරන දෙයක් නෙමෙයි. මේ නාගරික සංවර්ධන අධිකාරිය එතනින් ගියාම පතල් හා භූ විද්‍යා එක, එන්.බී.ආර්.ඕ. එක, ඊළඟට පරිසර අධිකාරිය යන මේ අයට විරුද්ධව අපි අඩුම තරමින් පැයක සංකේත උපවාසයක් කරන්න ඕන දැනෙන ස්ථානයක. මම අද දවසේ ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා දිනය යෝජනා කරන්න. මේ සභාවේ සියලු මන්ත්‍රීවරු එන්න. මේක කාටත් පොදු දෙයක්. මේක කාටත් පොදු ප්‍රශ්නයක්. ඒ නිසා මේ පිළිබඳව අපි පැයක හරි සංකේත වැඩ වර්ජනයකට ගිහිල්ලා අවශ්‍ය බලධාරීන්ගේ ඉස්සරහ ලැගලා විරෝධය පාන්න ඕන. එතකොට අද ඇත්තටම මේ ආණ්ඩුව විශාල වශයෙන් තමන්ගේ දායකත්වය ලබා දෙනවා මේ පරිසරය පිළිබඳ ප්‍රශ්න

වලට. දැන් අද වෙනකොට බලන්න සිද්ධ වෙලා තියෙන දේවල් මොනවද කියලා. ඉතිං ඒක නිසා මම ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා මේක ගැන.

දැන් බලන්න වටරැක. වටරැක ප්‍රදේශයේ යන්න බැහැ. අලුතින් නිර්මාණය වෙනවා. දැන් වටරැක එහා පැත්තේ කොඩිතුවක්කු ඉඩමට ඔබතුමා ගිහිල්ලා බලන්න. ඒ පාරේ කොහොමටවත් යන්න බැහැ. පාරවල් නැහැ ඒකේ. පාරවල් නෙමෙයි දෙකේ දෙකේ ගල් උඩ යන්න තියෙන්නේ. අක්කර හතරක විතර වෙන්දේසි ඉඩමක් මේ. පාරවල් තියෙනවා කිලෝ මීටර් තුනක හතරක විතර ඒක ඇතුලේ. ඒ හැම එකකම තියෙන්නේ ගල් විතරයි. එක හොඳ පාරක් තියෙනවා නම් මට පෙන්වන්න. පාරවල් නැහැ. ඉතිං ඔබතුමන්ලා කොහොමද දෙන්නේ, චාර්ටඩ් ඉංජිනියර් කොහොමද දෙන්නේ මේක නිවැරදියි කියලා. මාස හයක් තියෙන්නේ නැහැ බොහෝ තැන්වල.

රොස්වුඩ් එකේ ගියොත් ගරු සභාපතිතුමා පාරවල් මුකුත් නැහැ. ඉතිං මේක හැමතැනටම පොදුයි. ඉතිං ඒක හින්දා ඉදිරිපත් කරලා තියෙනවා අද දවසේ අවුරුදු පහට අඩු වෙන්දේසි ඉඩම් පිළිබඳව විස්තරයක්. මම ඉල්ලා සිටිනවා ඇත්තටම අපි සියලුම මන්ත්‍රීවරු එන්න පුලුවන්නම් ගිහින් බලලා සාමුහික තීන්දුවක් ගමු.

(සභාව පැහැදිළි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** එහෙම කියන්න එපා. අපි ඔයගොල්ලෝ කියන ඒවා අහගෙන ඉන්නම්. ඔයගොල්ලෝ හැම එක්කෙනෙක්ටම වගකීමක් තියෙනවා. ඔබතුමාගේ කොට්ඨාශයේ නොවුණට බෝපෙ පෝද්දල විදියට වගකීමක් තියෙනවා.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** අපේ කොට්ඨාශවල ප්‍රශ්න තියෙනවා. වටරැක පැත්ත පළාතක යන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** දැන් මේ වෙන්දේසිකාරයෝ කරන එක උපක්‍රමශීලි වැඩක් තියෙනවා. මේක අපි කතා කරලා තියෙනවා ගරු සභාපතිතුමනි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අබේසේකර මන්ත්‍රීතුමා ඕක කොච්චර කතා කරත් එකයි. මම ඔබතුමන්ලාගෙන් කමිටුවක් හදලා තියෙනවානේ. ඒ කමිටුව තීන්දුවක් අරගෙන දෙන්න. ඔබතුමන්ලා ගන්න ඕනම එකකට මම එකගයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** දැන් මේ කමිටුවෙන් අපි ගනිපු තීන්දුවක් තියෙනවා. මම, සුගත් මන්ත්‍රීතුමා, ලියනගේ මන්ත්‍රීතුමා පහුගිය දවසෙත් ගියා. අපේ ඉන්දික මන්ත්‍රීතුමා එක්කත් අපි පොඩි පරිශීලනයක් කරා. ඉතිං දැන් මේකේ බැලුවම බොහොම පැහැදිළිව තියෙනවා එකක්. අක්කර 10 ක ඉඩමක් තියෙනවා නම් ඒක කැබලි කරනවා සභාවට කොටසක් නොයන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** දැන් එහෙම බැහැනේ. අපි අය කරනවා 10% ක්. අනෙක් ඒවා නම් 1% යි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** 10% ක් අයකරනවා කියන්නේ මොකක්ද. අනෙක් ඒවායින් අයකරනවා. අනෙක් ඒවා කඩන කොට 10% ක් එන්නේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ගන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඒ කඩන්නෙත් ඊට අඩු ප්‍රමාණයකටනේ. මේකත් වළක්කවන්න කොහොම හරි ඒකට ගේන්න ඕන ලිඛිතවම යෝජනාවක්.

ඊළඟට තව එකක් කරනවා. ඒ තමයි ෆිනෑන්ස්කාරයෝ දැන් කරන්නේ පෞද්ගලික නම් වලින්. දැන් උදාහරණයකට අපි කියමු A කියන පුද්ගලයාගේ ඉඩම වෙන්දේසි කරන්න තියෙනවා. මේක වෙන්දේසි සමාගම ආවොත් වෙන වෙන කතා යන හින්දා ඒ පුද්ගලයා ඉදිරිපත් කරලා ඒ පුද්ගලයාගේ නමින් ගන්නවා. එහෙම ඒවා තියෙනවා. මේක ගත්තම බොහොම පැහැදිළිව තියෙනවා. මේකේ නිකං ගත්තොත් එහෙම ටී. කේ. රංජිත් සිරිමල් මහතා, කාසල්හිල් වත්ත, නරාවල, පෝද්දල. ඉන්ද්‍රානි කලංසූරිය මහත්මිය, ලබුදූව, ගාල්ල. දැන් මේවා ගත්තම කරන්නේ වෙන්දේසි කොම්පැනි ටික. නමුත් ඉදිරිපත් කරන්නේ අර අයව. ඉතිං දැන් අපි කොහොමද මේ අවුරුදු පහේ සීමාව දීලා, චාර්ටඩ් ඉංජිනියර්ගේ වාර්තාව දීලා කරන කොට අපි කාවද අල්ල ගන්නේ. දැන් ද ෆිනෑන්ස් එකේ නම් අල්ල ගන්න එකක් නැහැ. ඒ අය කරපු තොගයක් දේවල් තියෙනවා. දැන් කොම්පැනියත් බංකොලොත් වෙලා. එහෙම තියෙනවා නම් ගන්න මොකක් හරි

ක්‍රියාමාර්ගයක්. දැන් මේවාට අපි කවුද මේවා කරන්නේ. ඒ නිසා මේවා එනකොටම ඇත්තටම මේකට දැන් යවන්න ඕන. මේ පාරවල් ටික බලන්න යන්න අදම දිනයක් දා ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අබේසේකර මන්ත්‍රීතුමා මම ඉල්ලීමක් කරනවා පුලුවන් තරම් ඉක්මනට කමක් නැහැ. මට තවත් රැස්වීමකට යන්න තියෙනවා. ඔය සම්බන්ධව විතරක් කතා කරන්න අපි විශේෂ සභාවක් දා ගමු. ඔබතුමාට විරුද්ධව කියන කතාවක් නෙමෙයි මේක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඒකත් නරක නැහැ. සභාවේ වැඩත් තියෙනවානේ. ඇත්තටම මේකේ වැරැද්දක් තියෙනවා. මොකද හේතුව ගිය සභාවේ වෙච්ච දේවල් පිළිබඳව මෙච්චර කාලයක් අපි කතා කරේ ඊළඟ සභාවේදී මුලින්. ගිය සභාවේ වෙච්ච දේ ප්‍රගතිය බලලා තමයි අපි ඊළඟ සභාවේ තව යෝජනාවල් ගේන්න ඕන. දැන් තියෙන්නේ අන්තිමට. අන්තිමට එන කොට ඉතිං ප්‍රශ්නය මේ ආකාරයෙන් යන්නේ. මම එහෙමනම් කෙටියෙන් අහනවා දැන් මේ අපිට තියෙන ඉඩම කොහෙද තියෙන්නේ, කවුද අල්ලගෙන තියෙන්නේ. මම අහනවා හතර දේවාලය අසළ තියෙන ළිඳ පිළිබඳ ප්‍රශ්නයට මොකද වෙලා තියෙන්නේ. ඊළඟට ගැමුණු මාවතේ ළිඳ, ඒකට මොකක්ද වෙලා තියෙන්නේ.

අපි සභාව ආරක්ෂා කරන්න තාප්ප ගහනවා වගේම අපේ භූමිය ආරක්ෂා කළ යුතුයි. ඉතිං ඒ සඳහා ඕන මහන්සි වෙන්න. ඉතිං මම දන්නේ නැහැ කියන්න ඇයිද කියලා.

දැන් තමුන්නාන්සේලා කියන්න මම බොහොම පැහැදිළිවම යෝජනාවක් විදියටම, අදහසක් විදියටම ඉදිරිපත් කරනවා ඒක. මේ සතියේම නැත්නම් ලබන සතියේ මුලම මේ ආයතන වලට එරෙහිව අපි ගිහිල්ලා සංකේත වැඩ වර්ජනයක් කරන්න ඕන. මොකද එතකොට තමයි මේ ආයතනවල ඉන්න අදාළ බලධාරීන්ගේ ඇස් ඇරෙන්නේ. ඇත්තටම මේ ප්‍රශ්න පිළිබඳව හරියට කවුරුවත් දැනුවත් නැහැ. හරියට දැනුවත් කරන්නෙත් නැහැ. මොකද සංවර්ධන කමිටුවට ගියාට සංවර්ධන කමිටුවේදි මේවා කතා කරන්නේ නැහැනේ. එන්.බී.ආර්.ඕ. එකෙන් ඇහුවම සහතිකය දීලා තියෙනවා. දීලා තියෙන එකනේ කියන්නේ දුන්නා කියලා. හැබැයි දීලා තියෙන්නේ මොකක්ද මධ්‍ය අවධානම් කියලා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා :-** එන්නවත් දුන්නේ නැහැ සංවර්ධන කමිටුවට ඒ කාලේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඔව්. එන්න දුන්නේ නැහැ. ඒක වැරදියි කියලා මම ඒ දවස් වලත් කිවුවානේ. එන්න දුන්නේ නැති එක වැරදියි කියලා කිවුවා. ඒවගේ ප්‍රතිඵල තියෙනවානේ. ඉතිං ඒක හරි. ඒ කියන්නේ එහෙම සීමා කරන්න ඕන නැහැ. එහෙමනම් මහජන නියෝජිතවරයෙක් වෙන්න ඕන නැහැනේ මේකේ. ඉතිං මම දැක්කේ ගරු සභාපතිතුමා අදම මේ ප්‍රශ්නය ඉවර කර ගන්න. අපිට දිනයක් අද දවසේම යෝජනා කර ගන්න. ඔබතුමාම දිනයක් දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** 29 වෙනි අඟහරුවාදා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ලිපියකිනුත් දැනුම් දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ලිපියකිනුත් දන්වන්නම් දින හතරකට කලින්. විශේෂ සභාවක් කැඳවනවා 29 වෙනිදා. ඔබතුමා ලිඛිතව දෙන්න අපිට කිහිපදෙනෙක් අත්සන් කරලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** නෑ ඕන නැහැ. සභාවේ තීරණය කර ගන්න. සාකච්ඡා කර ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මොකටද, පිකටින් එකට නෙමෙයිනේ. විශේෂ සභාවකටනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** විශේෂ සභාවක් මේක. මේ පිළිබඳව බොහොම පැහැදිළි තීන්දු ටිකක් ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එහෙමනම් විශේෂ සභාව 29 වෙනිදා උදේ 09.30 ට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** මිනිස්සු නැතුවට කමක් නැහැ. අපි මන්ත්‍රීවරු ගිහිල්ලා එක දවසක අදාළ ආයතනයක් ළඟ, තීන්දු කරන තැනැක් ගැන වාඩිවෙමු අපි මේ ටික අරගෙන.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** මන්ත්‍රීතුමා මේවා ගිහිල්ලා ටිකක් බලන්න ඕන. අපි මන්ත්‍රීවරු විදියට බැලුවේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි බැලුවානේ. බොහොම පැහැදිළිව තියෙනවානේ. පින්තූර තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 29 වෙනිදා සභාවේදී ඕක දීර්ඝ වශයෙන් සාකච්ඡා කරමුකෝ ඔයගොල්ලෝ බලපුවයි, ඉස්සරහට කෙරෙන්න ඕන දේවලුයි. මගේ කිසිම බලපෑමක් නැහැ. එකේ කිසිම ගැටලුවක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** 29 වෙනිදාට කලින් දිනයක් දා ගන්න 22 වෙනිදා විතර. මේ කරුණ විතරනේ. 22 වෙනි අඟහරුවාදා තියමු සතියක් කල් තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 22 වෙනිදා වෙන මුකුත් වැඩ දාගෙන තියෙනවද කියලා මට මතක නැහැ. එහෙම නම් 24 වෙනි බ්‍රහස්පතින්දා තියමු උදේ 9.30 ට.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ හපුගල කළුපහන ගමේ ගම්වාසීන් මේක ඉල්ලන්නේ. හපුගල පන්සල අසල සිට වටරැක දක්වා මාර්ගය රමේෂ් පතිරණ මැතිතුමා විසින් කාපට් කරලා තියෙනවා. අද වෙන කොට ඒ කාපට් පාර ගලවගෙන ගිහින් තියෙන්නේ. දැන් කාපට් එක තියෙන ප්‍රමාණය විතරයි තියෙන්නේ. ඒකත් දැන් අඩියක් විතර ගැලවිලා තියෙන්නේ. මේ පාරට කළුපහනේ ඉඩමකින් තනිකර පයිප්පයක් එනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන මහා පයිප්පයක් දාලා තියෙනවා පාර දිගේ. මොකක්ද ඒ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එතකොට මේවා මේ නිකං නෙමෙයිනේ කියන්නේ. මේක මගේ හදවතට දැනුන දෙයක්. මමත් කියන්න ඕන නේ මේක. ඔය පාර අඩි 8 යි තියෙන්නේ. එක පැත්තකින් කාණුව අඩි 06 ක් විතර තියෙනවා. අනිත් පැත්තේ කාණුව අඩි 03 ක් විතර තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එහෙම නම් අක්‍රමවත් කාණු දෙකක් නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** කාණු හැදිලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා ඒක ගැන තාක්ෂණ නිලධාරීට පරීක්ෂණයක් කරන්න භාර දෙන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** කළුපහන පාරේ ගිහිල්ලා බලන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** දුරකථන දීමනාව ලබා ගැනීම සඳහා අපි බිලක් ඉදිරිපත් කරන්න ඕන නේ රුපියල් දහසක. අක්මීමන ප්‍රාදේශීය සභාවේ තෙල් බිල විතරයි ගන්නේ. දැනට අක්මීමන ප්‍රාදේශීය සභාවේ රුපියල් දහසක බිලක් ගන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මේ පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් අනුව කරන්නේ. එහෙම නැත්නම් කරන්න වෙන්නේ රුපියල් දහසක කාඩ් අරගෙන දෙන්න. වැරදි ක්‍රමයකට අපිට කරන්න බැහැනේ මන්ත්‍රීතුමා.

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2020-10-20 වන අඟහරුවාදා දින පෙ.ව 09.30 ට හා විශේෂ මහා සභා රැස්වීම 2020-09-24 වන බ්‍රහස්පතින්දා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.